# THE WHITE HACKLE



ශ්‍රී ලංකා පාබල හමුදා සඟරාව

இலங்கை காலாட் படை சஞ்சிகை

JOURNAL OF THE SRI LANKA LIGHT INFANTRY

72nd ISSUE APRIL 2012

www.slli.lk & www.lightinfantry.lk

ඔබ සැමට සුබ අළුත් අවුරුද්දක් වේවා!















රෙම ශ්‍රීලපාහ විධායක අධිකාරි
නි/62792 මේජර් ඒබී දොඩම්වල ශ්‍රීලපාහ



17 (සෙව්) ශ්‍රීලපාහ දෙවන අණදෙන නිලධාරි
නි/5016 මේජර් ඒඑස් කුමාර ශ්‍රීලපාහ



23 ශ්‍රීලපාහ දෙවන අණදෙන නිලධාරි
නි/64029 මේජර් ඒඑම්එස් නිලංග ශ්‍රීලපාහ

# සුබ මොහොතින් නව තනතුරට පත් වූ ඔබට රෙජිමේන්තු අධිපති ඇතුළු සියලුම නිලයින්ගේ උණුසුම් සුබ පැතුම්!



රෙම ශ්‍රීලපාහ ප්‍රමානි II
නි/64876 මේජර් කේපීසී ධර්මසිරි ශ්‍රීලපාහ



රෙම ශ්‍රීලපාහ මානි II (නීති)
නි/64906 මේජර් පීකේටී දේවප්‍රිය ශ්‍රීලපාහ



17 (සෙව්) ශ්‍රීලපාහ විධායක අධිකාරි
නි/8508 ලුතිනන් ඩබ්ජ්පීඩීඑල් වෙදආරච්චි ශ්‍රීලපාහ



11 ශ්‍රීලපාහ ප්‍රධාන ලිපිකරු
සෙ/313144 සැරයන් වික්‍රමගේ ජේකේ

# THE WHITE HACKLE

www.slli.lk & www.lightinfantry.lk

72nd Issue April 2012

Pioneer Sri Lanka Army Quarterly and the Journal of the Sri Lanka Light Infantry


## CONTENTS

PAGE


- අදහස් උදහස් හා විවේචන 02
- සේවයේ යෙදී සිටියදී මියගිය අයට ගෞරවය දැක්වීම සඳහාය 03
- රෙජිමේන්තු අධිපති තුමාගේ සිංහල හින්දු අලුත් අවුරුදු පණිවුඩය 04
- රෙජිමේන්තු අධිපති තුමාගේ ඒකක සංචාරය 05
- අභිමානයෙන් අභිමානය කරා - 82 වන ආධුනික පුහුණු පාඨමාලාව 06
- බක්මහ අසිරිය - 2012 07 - 10
- 17 (සෙව්) සිව්වන සංවත්සරය 11
- **RETIRED ARMY MAJOR EXTENDS HIS SUPPORT TO COMPLETE LIGHT INFANTRY SERGEANTS' MESS** 12
- අටවන උපන් දිනය සැමරූ 8 ශ්‍රීලපාහ 13
- **THE FRIST CEYLONESE BANDMASTER OF THE CEYLON LIGHT INFANTRY** 14
- 10 ශ්‍රීලපාහ දසවන අණදෙන නිලධාරී 15
- සමාජ සුබ සාධනය - 11 ශ්‍රීලපාහ 16
- මගේ හමුදා ජීවිතය - කෙටි කථාව 17 - 18
- **The Last Post Song** 19
- පාබල හමුදා පුහුණු කරුවන් පුහුණු කිරීමේ පාඨමාලා අංක 02 සාර්ථකව නිමාවට 20 - 21
- මල්වල ගැන්වූ 'හැඳිනීම' වගා ව්‍යාපෘතිය 25
- බුදුසමයෙන් ඔපවත් වුන කාන්තාව 32 - 33
- 4 ශ්‍රීලපාහ පූජා සත්කාරයන් 34
- සේවා වනිතා විත්ති 35- 36
- අත් වැරදීම් පාඩමක් ලෙස ගෙන ජීවිතයගොඩ නගා ගනිමු 38
- දසුනේ හසුන 39
- ප්‍රහේලිකා අංක 51 39-40




10 ලොව උතුම් පිංකමක් සිදු කරමින්



16 අනාගත පරපුර පරිනත කිරීමට අත්වැලක්



38 රට ජාතිය ආගම සමඟින් පෙරටම




## කවරයේ කථාව

2012 සූර්ය මංගල්‍යය මුළු ලංකාව වෙලා ගත් බක්මහේ ශ්‍රීලපාහ රෙජිමේන්තු මධ්‍යස්ථානයේහි ද එම අසිරිය අප්‍රේල් මස 20 වන දින දවස පුරා රසල් හයින් ක්‍රීඩාංගනයේදී පැවැත්විය. රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී එන්ඩීසී ගේ ප්‍රධානත්වයෙන් පැවැත් වූ මෙම අවුරුදු උත්සවයේ ගැමි ක්‍රීඩා රාශියක් සඳහා කුඩා දුවා දරුවන් මෙන්ම වැඩිහිටියන් ද සහභාගි වෙමින් සතුටු වූහ.


Designed & Printed by

softwave

107D, Havelock Road, Colombo 05.
Tel : 011 2502295, 2502134, 2502135
www.softwave.lk

THE WHITE HACKLE

SRI LANKA
LIGHT INFANTRY QUARTERLY

**Colonel of The Regiment**

**Maj Gen** RMD Rathnayake RWP RSP USP ndu psc

**Centre Commandant**

**Col** KJ Jayaweera RSP

The White Hackle Editorial

**Editor in Chief**

Col KJ Jayaweera RSP

**Assistant Editors**

Maj AB Dodamwela SLLI
(ADJUTANT RHQ SLLI)

Maj KKIA Kumara SLLI
(Officer In Charge 'The White Hackle')

**Chief Consultant**

Maj Gen RMD Rathnayake RWP RSP USP ndu psc

**Honourary Consultants**

Maj Gen HV Athukorale VSV psc FBIM
(Rtd – Reg Force)
Brig AER Abeyesinghe KSV
(Rtd – Vol Force)

**Computer Typesetting**

SGT Gunasiri SHIUK- 7SLLI

Publisher - Regimental Centre
Sri Lanka Light Infantry
Telephone - 0112855204
0112855356 - 60
Ext - 57656
Fax - 0112855204
E-mail - editor.whitehackle@gmail.com
editor.whitehackle@yahoo.com
Website - www.slli.lk & www.lightinfantry.lk

# Feedback

## අදහස්, උදහස් හා විවේචන
## Readers Please Write in

The WHITE HACKLE the Voice of Sri Lanka Light Infantry Regiment is now firmly established. It has reached maturity. This is the 72[th] issue. This quarterly is for Members of the SLLI, their families, Ex-Servicemen of SLLI, and as a whole for the entire Army. It will be extended even to all Sri Lankans.

We should not rest on our laurels. Targets have to be set. Greater goals to be achieved. The success of WHITE HACKLE depends on combined efforts. Everyone has his contribution to make, and every contribution is most welcome in any language (Sinhalese, Tamil and English). What is valued is our making the attempt, and then we can surely do our bit. Express your thoughts, ideas, opinions, and criticisms, hopes and fears through 'THE WHITE HACKLE', the journal of the oldest and proudest Regiment of them all. If you have much to say about your Battalion's experience, go ahead and write in to 'THE WHITE HACKLE' We are willing to accept and publish. We are happy to hear you and consider your contribution in any form; sketches, cartoons, stories, poems and whatever comes from your thoughts and your pen.

Our Motto is " Ich Dien", " I Serve". Let 'White Hackle' be a way to serve each other, our regiment and our country with our banner flying high as it always will.

Wishing you all the very best.

-Editor-

## කතු වැකිය

Do not be a man of tunnel vision ; be a man of wide vision. පුද්ගල දැක්ම, දර්ශනය ආකාර දෙකකින් සමන්විත වන අතර යමෙක් බිම්ගෙයක එක් කෙළෙවරක සිට අනෙක් කෙළෙවරෙන් පෙනෙන දෑ දෙස කොපමණ බලා සිටියත්, ඒකාකාරී, එකම දෙයක් දර්ශනය වීම සිදුවේ. සිතීමේ සීමාවද දකින දේ අනුව සීමා වන අතර එතැනින් එපිටට සිතීම සිදු කිරීම වලකාලයි. එකම කුඩා රාමුවකින් තොරව විශාල දෘෂ්ඨි කෝණයකින් දැකීම පුළුල් දැක්මක් ලෙස හදුන්වන අතර දර්ශනය වන පරාසය වැඩි වන විට චින්තනය සදහා ඇති ඉඩකඩද ඉතා පුළුල් වේ. පුළුල් දැක්මක් ඇති කර ගැනීම සදහා ඉවහල් වන්නේ කුමක්ද? ඉගෙනීම (Learning) යනු යමෙකුගේ ජීවිතයේ ප්‍රධාන චර්යාවන් 3ක වෙනස් වීම් හෝ වෙනස් කර ගැනීමයි. පුද්ගලයෙකු තම දැනුම (knowledge) ආකල්ප (Attitudes) කුසලතා (skills) යන අංශ වල වෙනසක් පෙන්වීම ඉගනගැනීමේ ක්‍රියාවලිය වේ.

රෙජිමේන්තු අධිපතිතුමා රෙජිමේන්තු සේනාවිධායක සහ රෙම ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ අධීක්ෂණය මත එළි දකින මෙම වයිට් හැකල් ප්‍රකාශනය වෙර දරන්නේ ඔබගේ නිම් වළලු පුළුල් කිරීම සදහා ඉහත ආකාරයන් ත්‍රිත්වයෙන්ම යහපත් ආකාරයෙන් ඔබගේ ජීවිතයේ වෙනස්කම් ඇති කිරීමටයි. සැගවුණු සාහිත්‍යමය හැකියාව ඇති අයවලුන් සහ විවිධ ආකාරයේ නව සහ පැරණි දත්තයන් පිළිබද උනන්දු වන ඔබට සුරක්ෂිත වාහකයක් වන මෙම ප්‍රකාශණය ප්‍රයෝජනය නොගැනීම තත් ප්‍රකාශණයේ අභිමතාර්ථ ඉෂ්ඨ නොවීමක් ලෙස සනිටුහන් කළ යුතුය.

The White Hackle is published quarterly under the supervision of the Regimental Centre Commandant to educate the Sri Lanka Light Infantry Officers and men on various topics including news, information on activities, people, policies, operations, technical developments, views, opinions and ideas to satisfy their reading thirst. Manuscripts of interest to the Regiment are invited. Direct Communication is authorized. The White Hackle, Regimental Centre, Army Cantonment, Panagoda, Homagama. Phone 0112855204 or 0112855356-60 Extn. 57656. Individual paid subscriptions are available through the Regimental Adjutant, Sri Lanka Light Infantry. Publication of this periodical is authorized by the Dte, of PA Army HQ CBO by letter No. A/275/27 of 16 Mar, 94. Use of funds for printing of this Publication has been approved by the Regimental Commander on 30[th] Aug 1993 at the Regimental Conference held at Welioya.

## සේවයේ යෙදී සිටියදී මියගිය රණවිරුවන්ට ගෞරව දැක්වීම සඳහාය

# IN HONOUR OF THOSE SLLI HEROES WHO MADE THE SUPREME SACRIFICE

**1983 වසරේ සිට මව්බිමේ ඒකීය භාවය වෙනුවෙන් දිවි පුද කළ ශ්‍රීලපාභ වීරෝදාර රණවිරුවන් හට ගෞරව දැක්වීමක් වශයෙන් ඔවුන්ගේ නාමලේඛනය 1999 ජනවාරි කලාපයේ සිට කොටස් වශයෙන් පහත සඳහන් පරිදි පළ කරනු ලැබේ.**

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 3401 | S/314875 | L/Cpl | Darmarathna RAS | 7 SLLI | Gen:Hosp:CBO | 29/12/2008 |
| 3402 | S/202348 | L/Cpl | Gunasekara RDRK | 11 SLLI | Kilinochchi | 30/12/2008 |
| 3403 | S/192478 | L/Cpl | Priyantha B | 11 SLLI | Kilinochchi | 30/12/2008 |
| 3404 | S/321170 | Sgt | Janaka Wijerathan U | 19 SLLI | Kilinochchi | 30/12/2008 |
| 3405 | S/320491 | L/Cpl | Rathnayaka RMTL | 11 SLLI | Kilinochchi | 31/12/2008 |
| 3406 | S/316077 | Sgt | Udaya Kumara KGC | 11 SLLI | Kilinochchi | 01/01/2009 |
| 3407 | S/44091 | L/Cpl | Dasanayaka DAAP | 11 SLLI | Kilinochchi | 01/01/2009 |
| 3408 | S/308643 | L/Cpl | Wijetunga WMS | 10 SLLI | Kilinochchi | 02/01/2009 |
| 3409 | S/319428 | Cpl | Perera GDP | 6 SLLI | Muhamalei | 06/01/2009 |
| 3410 | S/308783 | S/Sgt | Ajith Pushpakumara LA | 6 SLLI | Muhamalei | 06/01/2009 |
| 3411 | S/317014 | L/Cpl | Chaminda HA | 10 SLLI | Gen:Hosp: Kandy | 09/01/2009 |
| 3412 | S/314141 | Sgt | Ekanayaka EMJ | 4 SLLI | Olumadu | 11/01/2009 |
| 3413 | S/316750 | L/Cpl | Peiris MGSP | 4 SLLI | Olumadu | 11/01/2009 |
| 3414 | S/17D00252 | Cpl | Bandara MRMM | 20 SLLI | Oddusudan | 13/01/2009 |
| 3415 | S/321758 | L/Cpl | Gunarathna KGS | 11 SLLI | Kilinochchi | 13/01/2009 |
| 3416 | S/202125 | L/Cpl | Nishantha Kumara RPBP | 11 SLLI | Kilinochchi | 14/01/2009 |
| 3417 | S/169285 | L/Cpl | Wijerathna AM | 11 SLLI | Kilinochchi | 14/01/2009 |
| 3418 | S/171572 | L/Cpl | Jayalath JSK | 7 SLLI | Kilinochchi | 15/01/2009 |
| 3419 | S/169740 | L/Cpl | Fernando BBS | 19 SLLI | Ampakamam | 16/01/2009 |
| 3420 | S/193429 | L/Cpl | Bandurathna HA | 12 SLLI | Oddusudan | 17/01/2009 |
| 3421 | S/316435 | Sgt | Perera HAI | 19 SLLI | Ampakamam | 17/01/2009 |
| 3422 | S/311767 | L/Cpl | Ranasinghe RALP | 19 SLLI | Ampakamam | 17/01/2009 |
| 3423 | S/316397 | L/Cpl | Dewasinghe PWGCR | 1 SLLI | Chundikulam | 17/01/2009 |
| 3424 | O/65713 | Major | JPLAK Jayaweewa SLLI | 1 SLLI | Chundikulam | 17/01/2009 |
| 3425 | S/165480 | L/Cpl | Madusanka Kumara MMG | 1 SLLI | Chundikulam | 17/01/2009 |
| 3426 | S/43525 | L/Cpl | Prasanna Kumara RMA | 20 SLLI | Gen:Hosp: ANP | 18/01/2009 |
| 3427 | S/195781 | L/Cpl | Weerakkody JP | 20 SLLI | Oddusudan | 19/01/2009 |
| 3428 | S/311902 | Sgt | Kottalage KAS | 11 SLLI | Kilinochchi | 20/01/2009 |
| 3429 | S/44084 | L/Cpl | Wickramarathna BGW | 11 SLLI | Kilinochchi | 20/01/2009 |
| 3430 | S/314775 | L/Cpl | Darmapriya SAB | 11 SLLI | Kilinochchi | 20/01/2009 |
| 3431 | S/159697 | L/Cpl | Susantha DM | 19 SLLI | Olumadu | 21/01/2009 |
| 3432 | S/319011 | L/Cpl | Wijesena DM | 11 SLLI | Kilinochchi | 21/01/2009 |
| 3433 | S/318895 | Cpl | Darmapala WM | 20 SLLI | Kilinochchi | 21/01/2009 |
| 3434 | S/202346 | L/Cpl | Priyankara MT | 11 SLLI | Kilinochchi | 21/01/2009 |
| 3435 | S/304650 | Cpl | Manjula LDT | 8 SLLI | Kilinochchi | 22/01/2009 |
| 3436 | S/316736 | Cpl | Wijitha Kumara CPGA | 8 SLLI | Kilinochchi | 22/01/2009 |
| 3437 | S/310303 | L/Cpl | De Silva UK | 7 SLLI | Wishwamadu | 22/01/2009 |
| 3438 | S/319659 | Cpl | Gunasekara JMAS | 11 SLLI | Iranamadu | 22/01/2009 |
| 3439 | S/202463 | L/Cpl | Madusanka NGU | 11 SLLI | Kilinochchi | 22/01/2009 |
| 3440 | S/315852 | L/Cpl | Anura LH | 11 SLLI | Mullaitivu | 22/01/2009 |
| 3441 | S/314790 | L/Cpl | Kandekubura KMR | 4 SLLI | Iranamadu | 22/01/2009 |
| 3442 | S/204236 | L/Cpl | Anurudda VPKA | 7 SLLI | Wishwamadu | 22/01/2009 |
| 3443 | S/321118 | L/Cpl | Sunimal WDD | 20 SLLI | Oddusudan | 22/01/2009 |
| 3444 | S/319901 | L/Cpl | Priyadarshena SR | 4 SLLI | Iranamadu | 23/01/2009 |
| 3445 | S/170419 | L/Cpl | Ravindra Lalitha KA | 4 SLLI | Iranamadu | 23/01/2009 |
| 3446 | S/44074 | L/Cpl | Abekon GGUDSB | 4 SLLI | Iranamadu | 23/01/2009 |
| 3447 | S/314740 | Cpl | Prasanna Kumara EAU | 4 SLLI | Iranamadu | 23/01/2009 |
| 3448 | S/317471 | Cpl | Ranavira Arachchi RK | 4 SLLI | Iranamadu | 23/01/2009 |
| 3449 | S/315028 | L/Cpl | Nishantha GGJ | 4 SLLI | Iranamadu | 23/01/2009 |
| 3450 | S/193285 | L/Cpl | Thilakarathna WWMA | 8 SLLI | Gen:Hosp: ANP | 23/01/2009 |

නව කොටසක් ලබන කලාපයේ

# රෙජිමේන්තු අධිපති

## මේජර් ජෙනරල් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී විසින් නිකුත් කරනු ලබන 2012 වර්ෂයේ අළුත් අවුරුදු පණිවුඩය

සූර්යයා මීන රාශියෙන් මේෂ රාශියට සංක්‍රමණය වීමත් සමග උදාවන 2012 සිංහල සහ හින්දු අළුත් අවුරුද්ද වෙනුවෙන් ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති වශයෙන් සුබාශිංසන පණිවුඩයක් නිකුත් කරනුයේ ඉමහත් සතුටිනි.

දශක තුනකට අධික කාලයක් පැවති යුද්ධය නිමාකර රටට සාමය උදාකිරීමේ කාර්යභාරයේ පෙර ගමන්කරුවා වූ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සුවිශේෂි කාර්යභාරයක් ඉටුකරනු ලැබූ පාබල හමුදා සාමාජිකයන් වන ඔබ සැම රට දූවැන්ත සංවර්ධන වැඩ පිළිවෙලක් කරා ගමන් කරන මොහොතක එහි පෙර ගමන්කරුවන් ලෙස උදාවන්නා වූ නව වසර සමරනු ලබන්නේ ඉමහත් අභිමානයෙනි.

උතුරු නැගෙනහිර ජීවත් වන ලක්‍ෂ සංඛ්‍යාත දමිළ වැසියන් ඇතුළු රටේ සමස්ත ජනතාවම උදාවන 2012 සිංහල හා හින්දු අළුත් අවුරුද්ද බියෙන් සැකෙන් තොරව සැමරීමට අප පාබල හමුදාවේ 4,000කට අධික පාබල සාමාජිකයින් සංඛ්‍යාවක් ප්‍රාන දානයෙන්ද, 5,000කට අධික සංඛ්‍යාවක් කාය දානයෙන්ද, 20,000කට ආසන්න පිරිසක් සේවා දානයෙන්ද දැක්වූ සුවිශේෂී කැපකිරීම් මෙම අවස්ථාවේ මා සිහිපත් කරන්නේ ඉමහත් භක්ති ප්‍රණාමයෙනි. රට දැය වෙනුවෙන් මෙවැනි උදාරතර මෙහෙයක් ඉටු කිරීම උදෙසා ඔවුන් බිහිකළ දෙමාපියන්ටත්, ඔවුන්ගේ අඹු දරුවන් සහ ඥාති හිතමිත්‍රාදීන් හටත් කෘතඥතාවය පුද කිරීමටද මා මෙය අවස්ථාවක් කර ගනිමි.

උදාකළ සාමකාමී වාතාවරණය තිරසාර සාමයක් කරා පරිවර්තනය කිරීමේ භාරදූර කාර්යය අප හමුවේ ඇති අතර එම අභියෝගය ජයගැනීම සඳහා සාමූහිකව ක්‍රියාකිරීමට කටයුතු කළ යුතුව ඇත. තවද ආසියාවේ ආශ්චර්ය කරා රට ගමන් කරන මෙම අවස්ථාවේ අපගේ සේවා දායකත්වය උපරිම ලෙස ලබාදී එහි නියමුවන් වීමට මෙම අවස්ථාවේ අප සැම අදිටන් කර ගත යුතුය.

සමස්ත රට වැසියාම තම පවුලේ නෑදෑ හිතවතුන් සමග උදාවන්නා වූ සිංහල හා හින්දු අළුත් අවුරුද්ද සැමරීමට සූදානම් වන මෙම අවස්ථාවේ ඒ සඳහා අවැසි වාතාවරණය සකස් කිරීමේ උදාර චේතනාවෙන් යුතුව තම පවුලේ නෑදෑ හිතමිතුරන්ගෙන් ඈත්ව රාජකාරී කරනු ලබන අප සාමාජිකයින් මා මෙම අවස්ථාවේ සිහිපත් කරනුයේ ඉමහත් අභිමානයෙනි.

අවසාන වශයෙන් ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවේ සියළුම නිලධාරින්, සෙසුනිලයින් ඇතුළු පවුල්වල සියළු සාමාජිකයින් සහ ඥාති හිතමිත්‍රාදීන් හටත් සිවිල් සේවක මහතුන් ඇතුළුව එම පවුල්වල සියළුම සාමාජිකයින් සහ ඥාති හිතමිත්‍රාදීන් හටත් ලැබුවා වූ මෙම සිංහල හා හින්දු අළුත් අවුරුද්ද යස ඉසුරින් සපිරි සෞභාග්‍යමත් වසරක් වේවායි ප්‍රාර්ථනා කරන අතර සැම භාරදූර කාර්යයක්ම ඉටු කිරීමට ඔබ සැමට තෙරුවන් සරණ හා සියළු දෙවියන්ගේ ආරක්ෂාව ලැබේවායි මා ඉත සිතින් ප්‍රාර්ථනා කරමි.

''ඔබ සැමට තෙරුවන් සරණයි ''

**ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී**
මේජර් ජෙනරල්
රෙජිමේන්තු අධිපති ශ්‍රී ලංකා පාබල හමුදාව

2012 අප්‍රේල් මස 13 දින





## 11 ශ්‍රීලපාහ

2012.03.21 වන දින 11 ශ්‍රීලපාහ ඒකකය වෙත පැමිණි ශ්‍රිලපාහ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරල් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී කරෙයිනගර් ප්‍රදේශයේ ස්ථාපිත මෙම ඒකකය වෙත ගොස් එහි වත්මන් තත්ත්වය සොයා බැලීමෙන් පසු රෙජිමේන්තු මධ්‍යස්ථානය වෙතින් ඉදිකරනු ලබන නිවාඩු නිකේතනයේ ද වත්මන් තත්ත්වය සොයා බලන ලදී. පසුව එතුමා හට මුලස්ථානය 11 ශ්‍රිලපාහ මාවඩ්ඩි යුද හමුදා කඳවුරේදී සම්මාන මුරයක් ලබා දී පිළිගන්නා ලදී. අනතුරුව රෙජිමේන්තු අධිපතිතුමා මෙම ඒකකයේ නිලධාරින් හා සෙනින් ද, 27 ශ්‍රිලපාහ ඒකකයේ හා 5 (සෙව්) ශ්‍රිලපාහ ඒකකයන් වෙතින් පැමිණි හටපිරිස් ද ඇමතුහ. ඉන් පසුව සෙනින්ගේ පුද්ගලික ගැටලු පිළිබද සොයා බලා ඒවාට විසදුම් ලබා දුන් අතර දිවා භෝජන සංග්‍රහයෙන් පසුව එදින 1430 පැයට කඳවුරෙන් නික්මව යන ලදී.

11 ශ්‍රිලපාහ බුද්ධි අංශය

# රෙජිමේන්තු අධිපතිතුමාගේ ඒකක සංචාරය

## 17 (සෙව්) ශ්‍රීලපාහ

2012.04.03 වන දින යුද හමුදා මාණ්ඩලික ප්‍රධානි හා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරල් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී විසින් සිදු කළ 17(සෙව්) ශ්‍රිලපාහ ඒකක සංචාරයේ කැමරා ඇස ගිය දසුන්.

මූලස්ථානය 17 (සෙව්) ශ්‍රිලපාහ









# අභිමානයෙන් අභිමානය කරා

ශ්‍රී ලංකා පාබල හමුදා පුහුණු පාසල බූස්ස වෙතින් පුහුණුව ලැබූ ආධුනික සෙබළුන් 89 දෙනෙකු 2012 පෙබරවාරි මස 25 දින විසිරගොස් අභිමානවත් ශ්‍රී ලංකා පාබල හමුදාව වෙත අභිමානයෙන් එක්විය. මෙය ශ්‍රී ලංකා පාබල හමුදා ඉතිහාසයේ තවත් එක් සංධිස්ථානයක් වන අතර, මෙසේ විසිර ගියේ ශ්‍රී ලංකා පාබල හමුදාව යටතේ පුහුණුව ලැබූ 82 වෙනි පාඨමාලාව වේ.

මෙම පුහුණු පාසලේ ප්‍රධාන උපදේශක වශයෙන් කටයුතු කරන මේජර් ඒඑම්එම් ගුණසේකර ශ්‍රීලපාහ ගේ අධීක්ෂණය යටතේ පුහුණු වූ සෙබළුන් විසිරයාම සිදුවූ අතර එහි ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් රෙම ශ්‍රීලපාහ මානි 1 (පාලන) ලුතිතන් කර්නල් ජීඑම්එන් පෙරේරා ආර්එස්පී ශ්‍රීලපාහ සහභාගී විය.

**රෙජිමේන්තු පුහුණු පාසල ශ්‍රීලපාහ**


පැමිණ සිටි සියළු දෙනා අමතමින්


විසිරයනු ලබන ආධුනික සෙබළුන් සරඹ භූමිය වෙත පැමිණෙමින්


සම්මාන පෙළපාළිය නිරීක්ෂණය කරන ප්‍රධාන ආරාධිත අමුත්තා


උත්තමාචාරය පිළිගනිමින්


කුසලතා ලැබූවන් ත්‍යාග ලබමින්


දර්ශණීය සරඹ සංදර්ශණයේ පොල්තෙල් පහනක ආකෘතිය සැකසූ අයුරු



ආධුනික පුහුණුවේ අවසන් පියවර තබමින්

# 15 ශ්‍රීලපාහ





15 වන පාබල හමුදා බළඇණිය ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) යටතේ 2012 සිංහල අලුත් අවුරුද්ද ත්‍රිකුණාමලය මොල්ලිපොතාන ප්‍රදේශයේ ස්ථානගතව හෙළ සිරිත් විරිත් සඳහා මුල් තැන දෙමින් සැමරීමට 15 ශ්‍රීලපාහ අණදෙන නිලධාරි ඇතුළු සියම නිලයින් කටයුතු කළහ.

2012.04.11 වන දින දවස පුරා තඹලගමුව කඳවුරු ක්‍රිඩා භූමිය වර්ණවත් කරමින් බළඇණියේ සියළුම නිලයින්ගේ සහභාගීත්වයෙන් යුතුව අළුත් අවුරුදු උත්සවයක් සංවිධානය කෙරෙනු අතර, බළඇණිය තුළ රාජකාරින්හි නියුතු සෙබළුන් හා සිවිල් සේවක මහතුන්ගේ දක්ෂතාවයන් එහිදී ඇගයිමකට ලක් කෙරුණි. කබඩි, කොට්ටාපොර, කනා මුට්ටිය බිදීම, බාධක දිවීම, කඹ ඇදීම හා සංගීත පුටු තරගය වැනි අවුරුදු උත්සවයක් තුළ ඇතුලත් සියළුම තරගයන් මෙහිදී පැවැත් වූ අතර, සියලුම අයවළුන්ගේ හැඟීම් සහෝදරත්වයෙන් මෙන්ම සොම්නසින් ඉපිල යනු දක්නට ලැබීම කැපි පෙනුණි.

2012.04.12 වන දින පුණ්‍ය කාලය තුළ ආගමික වතාවත් සඳහා මුල් තැන දෙමින් තඹලගමුව කඳවුරු භූමියෙහි පිහිටි බෝධීන් වහන්සේ ඉදිරිපිට අණදෙන නිලධාරි ඇතුළු සියලුම නිලයින්ගේ සහභාගීත්වයෙන් බෝධි පූජාවක් පවත් වනු ලැබූ අතර, නව වසර උදාවත් සමගම හෙළ සිරිතට මුල්තැන දෙමින් බළඇණි මූලස්ථානයෙහි කිරි ඉතිරවීම සිදු කරනු ලැබුණි. පසු දින අණදෙන නිලධාරි විසින් සියලුම කණ්ඩායම් මූලස්ථානයන් වෙත ගොස් සහෝදර සෙබළුන් වෙත සිය අවුරුදු පණිවුඩය දැනුම් දී ඔවුන් සමග අවුරුදු උදාවේ සතුට, සොම්නස බෙදාගන්නා ලදී

**බුද්ධි අංශය 15 ශ්‍රීලපාහ**

# 4 ශ්‍රීලපාහ

2012 බක්මහ උළෙල 4 ශ්‍රීලපාහ ඒකකයේ මූලස්ථාන කඳවුරේදී අප්‍රේල් මස 11 වන දිනය පුරා පැවැත් වූහ. මෙම උළෙලේදී ඒකක අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් එම්සීඑස්කේ සේනාරත්න ආර්එස්පී ශ්‍රීලපාහගේ ආරාධනයෙන් 592 බළසේනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් සිංහල ජන ක්‍රීඩා රසකින් අවුරුදු උළෙලේ අසිරිය තව තවත් වැඩිවිය. ඒකකයේ සියළුම අයවලුන්ට පමණක් වෙන් නොකර සිවිල් සේවක මහතුන් වෙනුවෙන් ද ක්‍රීඩා සංවිධානය කර තිබුණි. මෙදිනම ඒකක බල ප්‍රදේශයේ හිජිරාපුරම් ග්‍රාමසේවා වසමට අයත් දිලිදු වැසියන් 75 දෙනෙකු සඳහා දිවා ආහාර ලබාදීම ද සිදු කළහ.

තෑගි ප්‍රදානෝත්සවයෙන් පසුව 4 ශ්‍රීලපාහ චතුරංග සංගීත කණ්ඩායමේ සත්සර නදින් ඒකක මූලස්නාය වෙත පැමිණි සියලු දෙනා විනෝද වූහ.

**බුද්ධි අංශය 4 ශ්‍රීලපාහ**





# 5 (සෙව්) ශ්‍රීලපාහ



511 බළසේනාධිපතිගේ උපදෙස් පරිදි ඒකක අණදෙන නිලධාරී ලුතිතන් කර්නල් ජීඒඑල් කිත්සිරි ශ්‍රීලපාහ ගේ පූර්ණ අධීක්ෂණය යටතේ මෙවර 5(සෙව්) ශ්‍රීලපාහ බක්මහ උළෙල 2012.04.15 වන දින දවස පුරා යාපනය, අච්චුවේලි මහජන ක්‍රීඩාංගණයේදී ඉතා උත්කර්ෂවත් අන්දමින් පවත්වන ලදී.

මෙම උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තන් ලෙස 51 සේනාංකාධිපති බ්‍රිගේඩියර් ඒපි ද ඉසෙඩ් වික්‍රමරත්න ආර්ඩබ්ලිව්පී පීඑස්සී ඇතුලු සේනාංකය යටතේ රාජකාරි කරන බළසේනාධිපතිවරුන් සහභාගි වූහ.





මෙම ඒකකය විසින් දමිළ ජනතාව වෙනුවෙන් සංවිධානය කරන ලද පළමු බක්මහ උළෙල මෙය වන අතර, ජාති ආගම් භේදයකින් තොරව මේ සදහා ප්‍රදේශයේ විශාල පිරිසක් සහභාගි විය. බක්මහ උළෙලට සහභාගි වූ සියළුම පුද්ගලයන් හට ඒකකය විසින් දිවා ආහාරය ද සැපයු අතර, උත්සවයට සහභාගි වූ දමිළ ජනතාවට ආවේනික වන අයුරින් එදිනම රාත්‍රී සංගීත සංදර්ශණයක් ද පවත්වන ලදී.

5(සෙව්) ශ්‍රීලපාහ බුද්ධි අංශය

# 11 ශ්‍රීලපාහ

යාපනය ආඥාපතිතුමා ගේ සංකල්පයක් මත 51 සේනාංකාධිතිතුමා ගේ හා 513 බසේමු බළසේනාධිපතිතුමා ගේ මග පෙන්වීමෙන් 11 ශ්‍රීලපාහ අණදෙන නිලධාරී නි/62252 මේජර් ජේකේආර්පී ජයසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ හා ඒකකයේ සියළුම අයවලුන්ගේ සහභාගිත්වයෙන් 2012.04.17 වන දින සිංහල හා හින්දු අළුත් අවුරුදු උත්සවය නෙස්ටමොල්ට් සමාගමේ අනුග්‍රහය ඇතිව කරෙයිනගර් ප්‍රදේශයේ දී දවස පුරා පවත්වන ලදී. පාපැදි, ගම හරහා දිවීම, කොට්ට පොර ගැසීම, හා කඹ ඇදීම තරඟ මෙන්ම තවත් විශාල ගැමි තරග රාශියකින් සමන්විත වූ මෙම බක්මහ උළෙල උත්සවාකාරයෙන් යුතුව පැවැත්විණි. මෙහි ප්‍රධාන ආරාධිත අමුත්තන් වශයෙන් 51 වන සේනාංකාධිපති, 511 බළසේනාධිපති හා කරෙයිනගර් ප්‍රාදේශිය ලේකම්තුමිය සහභාගි වූ අතර, දෙමළ වැසියන් ජාති භේදයකින් තොරව සිංහල අළුත් අවුරුදු උළෙල ඉතාමත් ප්‍රිතියෙන් යුතුව බෙදාහදා ගන්නා ලදී.

11 ශ්‍රීලපාහ බුද්ධි අංශය







# 20 ශ්‍රීලපාහ





2012.04.09 වන දින ඒකක අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් පීජේපී ගමගේ ආර්එස්පී ශ්‍රීලපාහ ගේ ප්‍රධානත්වයෙන් නැවුම් වූ අත්දැකීම් ගොන්නකින් සමන්විත බක්මහ උළෙල පුනරීන් මුක්කම්පන් ග්‍රාමයේ ඒකක ක්‍රීඩා පිටියේදී චාම්ව සංවිධානය කරන්නට යෙදිණි.

සියළු නිලයන්ට හා සිවිල් සේවක මහතුන්ට මෙන්ම ප්‍රදේශයේ සිවිල් වැසියන්ට විවෘත වූ මෙම බක්මහ උළෙල ආරම්භයට පෙර දින කණ්ඩායම් අතර සහයෝගීත්වය වැඩි දියුණු කිරීමේ අරමුණින් 2012.04.08 දින පිළිමළුන් පිටු දැකීමේ ක්‍රමයට පැවැත්වූ ක්‍රිකට් තරගාවලියක් හා අත්පන්දු තරගාවලියක් පැවැත්වූ අතර, එහිදී 'බී' කණ්ඩායම ක්‍රිකට් ශූරතාවයත් 'පාලන කණ්ඩායම' අත්පන්දු ශූරතාවයත් දිනා ගන්නා ලදී.

2102.04.09 දින 0600 පැයට අවුරුදු උත්සවය ගම හරහා දිවීමේ තරගයෙන් ආරම්භ කර ග්‍රීස් ගසේ නැගීම, කණා මුට්ටිය බිඳීම, කොට්ටපොර ගැසීම, අලියට ඇස තැබීම, කඹ ඇදීම, බිත්තර ඇල්ලීම, සංගීත පුටු තරගය, විකට ඇඳුම් තරග පවත්වන ලදී. රාත්‍රී හතට පමණ තරග වලින් ජයගත් ජයග්‍රාහිකයින් හට ත්‍යාග බෙදා දීමෙන් අනතුරුව 4 ශ්‍රීලපාහ චතුරංග අධි රිද්ම සංගිත කණ්ඩායම විසින් සංගීතය ගුවනට මුසු කරමින් සියළු දෙනා සතුටට පත් කළහ.

**බුද්ධි අංශය 20 ශ්‍රීලපාහ**

# 23 ශ්‍රීලපාහ





ඒකකයේ සියළු නිල සංවිධානයෙන් 2012 බක් මස 07 වන දින මුලතිව් වඩ්ඩුවාකල් රජයේ පාසැල් ක්‍රීඩාංගන භූමියේදී උත්සවශ්‍රීයෙන් බක්මහ උළෙලක් පැවැත්වූ අතර, ඒකක අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් ටීසීකේ පීරිස් ආර්එස්පී ශ්‍රීලපාහගේ ඇරයුමෙන් 591 බලසේනාධිපති බ්‍රිගේඩියර් එස්කේජීඑන්බී ඇහලමල්පේ ආර්එස්පී උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙසින් සහභාගි විය.

ප්‍රදේශයේ ජීවත් වන සිවිල් ජනතාව සමඟ සුහදත්වය වර්ධනය කිරීම පිණිස හමුදා සාමාජිකයින් මෙන්ම ප්‍රදේශයේ සිවිල් ජනතාවගේ සහභාගිත්වයෙන් පොල්අතු විවීම, ග්‍රීස් ගසේ නැගීම, කණාමුට්ටිය බිඳීම, බනිස් කෑම, ගම හරහා දිවීම, කොට්ටා පොර ගැසීම, කඹ ඇදීම, කබඩි තරඟ වැනි ජන ක්‍රීඩා රාශියක් පවත්වන ලදී. අවුරුදු උළෙලේ පැවැති තරඟ ඉසව් වලින් ජයග්‍රහනය කරනු ලැබූ සිවිල් අයවලුන් වෙනුවෙන් ඔවුන්ගේ ප්‍රයෝජනය සඳහා අත්‍යාවශ්‍ය තෑගි භාණ්ඩ ප්‍රදානය කළහ.

එදින උත්සවය අවසානයේ ශ්‍රීලවියාඉ අධිරිද්ම සංගීත කණ්ඩායම විසින් බළඇණි මූලස්ථාන භූමියේ සංගීත සංදර්ශණයක් පවත්වමින් සැඳෑ සමය වර්ණවත් කරන ලදී. එමෙන්ම අලුත් අවුරුදු උත්සව කටයුතු සාර්ථක කර ගැනීම සඳහා ඒකකයේ සියළුම නිලයින් මෙන්ම ප්‍රදේශයේ ග්‍රාම නිලධාරින් ගෙන්ද ලද නොමද සහය වෙනුවෙන් කෘතඥතාවය පල කරන්නෙමු.



**වයිට් හැකල් අංශය 23 ශ්‍රීලපාහ**

# 26 ශ්‍රීලපාහ



613 වන බළසේනාවේ බළසේනාධිපති කර්නල් එම්එම් කිත්සිරි ආර්එස්පී ගේ අධීක්ෂණය යටතේ 26 ශ්‍රීලපාහ අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් ජේඑල්ටීකේ හේවා ආර්ඩබ්පී ආර්එස්පී ශ්‍රීලපාහගේ මෙහෙයවීමෙන් සිංහල හින්දු අලුත් අවුරුද්ද සැමරීම වස් 2012.04.09 වන දින තච්චනා මරදමඩු දෙමළ විද්‍යාලීය ක්‍රීඩා පිටියේදී බක්මහ උළෙලක් අති උත්කර්ශවත් අන්දමින් පවත්වන ලදී.

මෙම අවුරුදු උත්සවය ශ්‍රී ලාංකීය අභිමානය ජනිත කරමින් සංස්කෘතියට මුල් තැන දෙමින් විනෝදාත්මක ජන ක්‍රීඩා තරගවලින් සමන්විත වූ අතර, ප්‍රදේශයේ සිවිල් ජනයාගේ සහභාගිත්වයෙන් සියළු තරග පැවැත්වූ අතර, ගම් වැසියන් රණ විරුවන් සමග සුහදශීලිව සෑම තරගයක්ම උද්යෝගිමත්ව පවත්වන ලදී.

අළුත් අවුරුදු උත්සවය අවසානයේ 613 බළසේනාධිපති කර්නල් එම්එම් කිත්සිරි ආර්එස්පී තුමන්ගේ සහ ඒකක අණදෙන නිලධාරින්ගේ සහභාගිත්වයෙන් ශ්‍රී ලංකා යුද හමුදා කමාන්ඩෝ රෙජිමේන්තු අධිරිද්ම සංගීත කණ්ඩායමේ දායකත්වයෙන් සංගීත ප්‍රසංග යක් පැවැත් වූහ. ඒ සදහා අවට ප්‍රදේශවාසීන් විශාල පිරිසක් පැමිණි අතර, සියලුදෙනා එක්ව සමගියෙන් අවුරුදු ප්‍රීතිය සමරන ලදී.

**බුද්ධි අංශය 26 ශ්‍රීලපාහ**





# 17 (සෙව්) ශ්‍රීලපාහ සමාජ සත්කාර




ඒකක අණදෙන නිලධාරිගේ සංකල්පයකට අනුව බළඇණි දිනයට සමගාමීව අඛණ්ඩව තෙවැනි වරටත් පැවැත්වීමට යෙදුණු ලේ දන්දීමේ පිංකම 2012.03.25 වන දින සිංහපුර ප්‍රදේශයේ සිවිල් ජනතාව සහ ඒකක නිලධාරින් සහ සෙසුනිලයින්ගේ දායකත්වය ඇතිව පොළොන්නරුව මහ රෝහලේ ලේ දීමේ බැංකුවේ පුර්ණ සහයෝග යෙන් ඉතා සාර්ථකව සිදු කළ වගයි.

**මූලස්ථානය 18 සෙව් ශ්‍රීලපාහ**





# 17 (සෙව්) ශ්‍රීලපාහ සිව්වන සංවත්සරය



මුළු මහත් යුද හමුදාවේම ප්‍රෞඪ දීර්ඝ ඉතිහාසයකට උරුමකම් කියන ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවේ 6 වන ස්වෙච්ඡා ඒකකය ලෙසින් 2008.03.30 වන දින ආරම්භ කරන ලද මෙම බළඇණිය වන්නි මානුෂීය මෙහෙයුමේදී මව්බිමේ විජයග්‍රහණය වෙනුවෙන් දායකත්වය ලබා දී දැනට ආසේමු (නැ) යටතේ ගල්කන්ද සිංහපුර ප්‍රදේශයේ ස්ථානගතව සිව්වැනි වර්ෂ පූර්ණය සමරණ මේ මොහොතේ ඒ වෙනුවෙන් තබන කෙටි සටහන් පෙළයි.

2012.03.23 වන දින සිට 2012.03.27 වන දින දක්වා සෙබළුන්ගේ චිත්ත ධෛර්යය නංවාලීම හා කණ්ඩායම් අතර සුහදත්වය වර්ධනය කිරීම පිණිස විවිධ වූ ක්‍රීඩා තරග පැවැත්වීම රණබිමේ දක්කම් පෑ සියලුම නිලධාරින් සහ සෙසුනිලයින්ගේ විඩාබර මනසට විවේකයක් සහ සතුටක් ලබාදීම කාගේත් සිත් සතන් තුළ නොමැකෙන ලෙස සටහන් විය.





2012.03.30 වන දින බළඇණිය ආරම්භයේ සිට මේ දක්වා දහසක් බාධක මධ්‍යයේ ඒකකයේ උන්නතියට කැප වෙමින් අනගිභවනීය කාර්ය ශූර නායකත්වයක් සපයන ඒකක අණදෙන නිලධාරි නි/3565 ලුතිනන් කර්නල් එම්අයිවී ප්‍රනාන්දු ශ්‍රීලපාහ වෙත සම්මාන මුරයක් හා ඒකකයේ ප්‍රථම වතාවට සම්මාන පෙළපාළියක් අභිමානයෙන් යුතුව පිරිනමන ලදී. මාතෘභූමිය වෙනුවෙන් දිවිපිදූ රණවිරුවන් වෙත තම කෘතවේදිත්වය පළකර විනාඩි දෙකක නිශ්ශබ්දතාවයක් සුරැකීමෙන් පසු අණදෙන නිලධාරි විසින් සියලුම නිලධාරීන් හා සෙනින් අමතන ලදී. ඉන්පසු එළඹුණ සුබ මොහොතින් චිරාගත සම්ප්‍රදායානුකූලව පොල්තෙල් පහන දල්වා සංවත්සර උත්සවයට සමගාමීව රුක් රෝපන වැඩ සටහනක් ද පවත්වන ලදී.

එදින සියළු නිල තේ පැන් සංග්‍රහයක් හා දිවා භෝජන සංග්‍රහයක් පවත්වා රාත්‍රියේ සංගිත ප්‍රසංගය ශ්‍රී ලංකා යුද්ධෝපකරණ බළකායේ අධිරිද්ම සංගිත කණ්ඩායමේ සත්සර නදින් ආරම්භ විය. මෙම සංගිත ප්‍රසංගය පැවැත්වෙන අතරතුර සියළුම දෙනාගේ ඔල්වරසන් හඩ මධ්‍යයේ ඒකක අණදෙන නිලධාරිගේ ප්‍රධානත්වයෙන් හැකියාවන්ගෙන් පිරිපුන් දස්කම් දැක්වූ කණ්ඩායම් වෙත හා සිවිල් සේවක මහතුන්ගේ සේවය අගයමින් ඔවුන් වෙතද ත්‍යාග ප්‍රදානය කරන ලදී.

මෙසේ ඒකක සිව්වන සංවත්සර සැමරුම අවසන් වුවත් ඉදිරියේදි තවදුරටත් ඒකකයේ නාමය හා පාබල මාතාවගේ නාමය බබළවන්නට අණදෙන නිලධාරි තුමා හට අවශ්‍ය ශක්තිය ධෛර්යයලැබේවායි පතමින් අපි හැමෝටම එකමුතුව සහයෝගයෙන් යුතුව කටයුතු කිරීමට හැකි වේවායි ප්‍රාර්ථනා කරන්නෙමු.

**මූලස්ථානය 17(සෙව්) ශ්‍රීලපාහ**

## සෙනෙහස

පාළු සිතට ගෙනෙන කඳුළ
නුඹේ දෝතින් පිසදාන්න...
මගේ හදට ගෙනෙන සුසුම්
නුඹේ හදින් සනසවන්න...
දිනක් ඇවිත් මගේ සකිසද
සාමයේ මල් පුබුදුවන්න....
සතුට අරන් නුඹේ සිතට
මම එනවා නුඹ ළඟටම...

ලාකෝ ඒකනායක එච්බීඑච්එච්
7 ශ්‍රිලපාහ ඞී කණ්ඩායම

## ආදරයේ වේදනාව

රැයක් නිදිවරා නුඹ ගැන පන්හිදක් ලිවූ මම
අවසන් පැයයි නුඹ මගේ ළඟ ඉන්න
සඳක් සේ නැගුනා මහමෙරක් සේ දුකම
ඉතින් එත් මම නුඹට ආදරෙයි වෙන්නොවී සැමදාම.

පතන්න පවා නුඹ ගැන සිතන්න යමක්
බැඳීමක් ඇති කලේ හදවතට නුඹ
උරුම මේ දුකම නම් මේ නිල ඇඳුමකට
හිඳින්නෙමි මාගේ ලෝකයේ කඳුළ රජකමට

එදා මෙන් හෙටත් එකසේ පණ වගේ
සිහිනයකින් වුවද සුවඳ දැනුනේ පාළුවට නුඹ ගැන
මගේ මේ ජීවිතය පුරාවට හිමි කිරුළ නමුත් නුඹ
එත් මේ කවිය ලියනවිට ළග හිටියේ සහෝදර සෙබළුන්ය.

කෝප්‍රල් බුද්ධික ඩීජී 22 (සෙව්) ශ්‍රීලපාහ - පාලන කණ්ඩායම



ශ්‍රී ලංකා පාබල සාමාජිකයෙකු වශයෙන්, රග්බි ක්‍රීඩාව තුලින් ශ්‍රී ලංකා යුද හමුදාවට මෙන්ම ශ්‍රී ලංකාවටම මහත් කීර්තියක් ගෙන දුන් දැනට විශ්‍රාමිකව සිටින ලුතිතන් කර්නල් ඊඑම් උපාලි ඒකනායක ආර්එස්පී යූඑස්පී ශ්‍රීලපාහ අවිවාදයෙන්ම හඳුන්වා දිය හැකිය. ශ්‍රී ලංකා යුද හමුදා රගර් කණ්ඩායමේ නායකයෙකු වශයෙන් සහ ශ්‍රී ලංකාව නියෝජනය කරමින් පාබල හමුදාව වෙත කීර්තියක් ගෙන දුන් මෙම නිලධාරීගේ දක්ෂතාවයන් ඔහුට ගෞරවයක් වශයෙන් ගෙන එන්නෙමු.



# විශ්‍රාමික ශ්‍රීලපාහ ක්‍රීඩා තරුවක්

1980 - ශ්‍රී ලංකා ආරක්ෂක සේවා හොකී කණ්ඩායම නියෝජනය කිරීම
1980 - ශ්‍රී ලංකා ආරක්ෂක සේවා රෙස්ට්ලින් (පොරබැදීම) කණ්ඩායම නියෝජනය කිරීම
1980 - ජාතික මට්ටමින් ශ්‍රී ලංකා යුද හමුදා මළල ක්‍රීඩා කණ්ඩායම නියෝජනය කිරීම
1980 - ශ්‍රී ලංකා යුද හමුදා රගර් කණ්ඩායම නියෝජනය කරමින් සිංගප්පූරු සංචාරය කිරීම
1980 - ශ්‍රී ලංකා වර්ණ ලාභියෙකු වීම
1985 - රගර් ක්‍රීඩාව සඳහා ශ්‍රී ලංකා වර්ණ ලාභියෙකු වීම
1985 - ආරක්ෂක සේවා වර්ණ ලාභියෙකු වීම
1985 - යුද හමුදා රගර් කණ්ඩායම නියෝජනය කරමින් තායිවාන, තායිපෙ සංචාරය කිරීම
1985 - ශ්‍රී ලංකා යුද හමුදා රගර් කණ්ඩායමේ නායකත්වය දැරීම

# RETIRED ARMY MAJOR EXTENDS HIS SUPPORT TO COMPLETE LIGHT INFANTRY SERGEANTS' MESS



Major (retired) Nishantha Rajapaksha who is now with the UN in the UN Mission Sudan recently donated Rs. 1,60,000/-for renovations at Warrant Officers' and Sergeants' Mess, Sri Lanka Light Infantry Regiment, Panagoda.


His monetary contribution towards the welfare of Light Infantry Non-Commissioned Officers was received with gratitude by Major General RMD Ratnayke RWP RSP USP ndu psc, the Colonel of the regiment Sri Lanka Light Infantry and Chief of Staff of the Sri Lanka Army on 15 March 2012 at the Regimental Centre Panagoda.

*Courtesy : www.slli.lk*



# අටවන උපන් දිනය සැමරූ 8 ශ්‍රීලපාහ





ප්‍රෞඪ ඉතිහාසයකට උරුමකම් කියන ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවට නවක සාමාජිකයෙකු ලෙස වර්ෂ 2004 ක් වූ මාර්තු මස 25 වන දින මහවැලි සිංහපුර ප්‍රදේශයේදී ආරම්භ කළ 8 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව වර්තමානයේ මේජර් එස්ජ්යූජ් සෝලංගආරච්චි පීඑස්සී ශ්‍රීලපාහ ගේ අණදීම සහ මගපෙන්වීම යටතේ කොළඹ සහ තදාසන්න ප්‍රදේශයන්හි අභ්‍යන්තර ආරක්ෂක රාජකාරින්හි නියැලෙමින් රටෙහි නීතිය සහ තිරසාර සාමය ආරක්ෂා කරගැනීම සඳහා ඉමහත් මෙහෙයක් ඉටුකරමින් සිටියි.

පුරා දශක තුනකට ආසන්න කාලයක් ශ්‍රී ලංකාද්වීපය වෙලාගෙන සිටි රුදුරු ත්‍රස්තවාදය මුලිනුපුටා දමා විජයග්‍රහණය ලබා තෙවසරක් සපිරීමට ආසන්නව ඇති මේ මොහොතේ මව්බිම වෙනුවෙන් සිය ජීවිත පූජාව සිදු කළා වූ අප බළඇණියේ සහෝදර රණවිරුවන් සිහිපත් කිරීම වස් සහ බළඇණියේ ඉදිරි ගමනට ආශිර්වාද පතා ආගමික වැඩසටහන්, දානමය පිංකම් ආදී විවිධ අංගයන්ගෙන් යුක්තව අප බළඇණිය 8 වන ජන්ම දිනය සමරන්නට යෙදිණි.

2012.03.26 වන දින හිරු අවරට යන සන්ධ්‍යා යාමයේ අණදෙන නිලධාරී සමගින් බලඇණියේ සියලු කණ්ඩායම් නියෝජනය කරමින් නිලධාරීන් හා සෙබළුන්, සිවිල් සේවක මහතුන්ද කැටුව පනාගොඩ බෝධිරාජාරාම විහාරස්ථානයට එක්වූයේ පූජ්‍ය පිලැස්සේ විමලධජ නාහිමිගේ සුමුධුර ධර්ම දේශනාවකට සවන්දීම සඳහාය. මෙහිදී මග දෙපස ලෙලදුන් බෞද්ධ ධජ හා හේවිසි ගැටබෙර හඬ මධ්‍යයේ පෙරහැරකින් බෝමලුව වෙත වැඩම කළ වදාල විමලධජ හිමියන්ගේ අනුශාසකත්වයෙන් ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටියදී අතුරුදහන්වූ සහ දිවිපිදූ රණවිරුවන්හට පිං පැමිණවීම උදෙසා සහ තුවාල ලබා ආබාධිත තත්ත්වයට පත්ව සිටින රණවිරුවන් හට ඉක්මන් නිරෝගී සුවය ප්‍රාර්ථනා කිරීම සඳහා පහන් පූජාවක් සහ බෝධි පූජා පිංකමක් පවත්වන ලදී.

අහුගම්මන කඳවුරේදී 2012.03.27 වන දින බළඇණි දිනය නිමිති කොට ඒකකයේ අණදෙන නිලධාරි වෙත සම්මාන මුරයක් පිරිනැමීම සිදුවිය. පසුව 8 වන බළඇණි සංවත්සරය සිහිකිරීම වස් ඒකක අණදෙන නිලධාරී විසින් කඳවුරු භූමියේ පැලයක් රෝපනය කරන ලදී. ඉන් අනතුරුව අණදෙන නිලධාරී සියලු හටපිරිස් අමතා ඉතා හරවත් දේශනයක් සිදු කළ අතර, එහිදී ඒකක ආරම්භයේ සිට මේ දක්වා ඒකකය සමගින් රාජකාරී සිදු කළ සියලුම නිලධාරීන්/සෙසුනිලයන් විසින් ඉටුකරන්නට යෙදුනා වූ මෙහෙය අගය කළ අණදෙන නිලධාරී ඒකකය සතු ප්‍රෞඪත්වය ඉදිරියට පවත්වාගෙන යාම අප සියලු දෙනාගේ වගකීමක් බව අවධාරණය කරන්නට විය. රටෙහි ජන ජීවිතය ඉතා උසස් මට්ටමකින් පවත්වාගෙන යෑම සඳහා ත්‍රිවිධ හමුදාව හා සිවිල් වැසියන් අතර, පවත්නා අන්නෝන්‍ය සුහදත්වය, එකමුතුව හා සහයෝගය වර්ධනය කිරීම උදෙසා ඒකක හටපිරිස් විසින් ඉටුකරන මෙහෙය අගය කිරීමද සිදුකරන ලදී. අනතුරුව සියලු නිලයන් නියෝජනය වන පරිදි විශේෂ දිවා භෝජන සංග්‍රහයක්ද පැවැත්වීය.



තවද බළඇණි සංවත්සරය සංකේතවත් කරමින් ඒකක අණදෙන නිලධාරි ගේ සංකල්පනාවකට අනුව සමස්ත ලංකා සමාජ සේවා පදනම මගින් මෙහෙයවනු ලබන කඩුවෙල බියුෆඩ් සමරනායක - විල්බට් පෙරේරා අනුස්මරණ වැඩිහිටි නිවාසයෙහි නේවාසික මව්පියන් 43 දෙනෙකු වෙනුවෙන් ආහාර වේලක් සහ අතුරුපසක් පිළිගැන්වීම 2012 මාර්තු මස 28 වන දින සිදු විය. එම වැඩිහිටි නිවාසය තුළ වාසය කළ දෙමව්පියන්ගේ සනීපාරක්ෂක තත්ත්වය ඉතා පහත මට්ටමක පැවති අතර, ඒකක සෙබළුන් ඔවුන් නහවා පිරිසිදු කළහ. පසුව එම වැඩිහිටි නිවාසයේ කැඩී බිඳී ගොස් තිබූ ස්ථාන යලි පිළිසකර කිරීම ද සිදුකරන ලදී. අනතුරුව මෙම ඒකක කැලිප්සෝ වාදක කණ්ඩායමේ මිහිරි ගැයුම් මැද සතුටින් පිනාගිය වැඩිහිටි මව්වරුන් හා පියවරුන් අත්පොළසන් නගමින් ගී ගයමින් සංගීත රසය විඳින්නට වූහ. එහිදී තම දූවාදරුවන්ගේ නොලැබෙන ආදරය අභියස ඔවුන් කොතරම් අසරණද යන්න අපහට වටහා ගැනීමට හැකිවිය. එදින පස්වරුවේ අණදෙන නිලධාරී ඇතුලු පිරිස විසින් ප්‍රදානය කළ තෑගි පාර්සල් අසරණ දෙමව්පියන් දෝතින් පිළිගත්තේ සතුටු කඳුළු වගුරවමිණි.

අනේක වූ දුක් කම්කටොලු මධ්‍යයේ සිදු කළා වූ සාර්ථක යුද ක්‍රියාන්විතයන්ද යුද්ධයෙන් පීඩාවට පත්ව නිජබිම අතහැර ගිය අහිසංක ද්‍රවිඩ ජනජීවිත යලි ගොඩනැගීම සඳහා ගත් ප්‍රයත්නය මෙන්ම විවිධ ක්‍රීඩා ඉසව්වන් තුළින් හිමිකරගත් ජයග්‍රහණ ආදීයෙන්ද ලද පන්නරය ආශිර්වාදයක් කරගනිමින් බළඇණියේ ඉදිරි ගමන සාර්ථක කරගැනීම සඳහා ඇවැසි ශක්තිය, ධෛර්යය අණදෙන නිලධාරී ඇතුලු සියලු නිලයන් හට නොඅඩුව ලැබේවායි යන්න අටවන ජන්ම දිනය සමරන අප සැමගේ ඒකායන ප්‍රාර්ථනයයි.

බුද්ධි අංශය 8 ශ්‍රීලපාහ

# THE FRIST CEYLONESE BANDMASTER OF THE CEYLON LIGHT INFANTRY

## S.E.A WILLIAM RODRIGO (APPOINTED ON 06th JULY 1909)



Professor SEA William Rodrigo was born in Modera on 25th October 1866 he was a composer of Western and Oriental Music, Gold Medalist, Diploma Holder, Organist and Music Conductor.

On 6th July 1909 he was appointed the (first Ceylonese) Band Conductor to the Ceylon Light Infantry (CLI) and the Ceylon Volunteer Force (CVF) at a time when a Band Master's appointment was a highly paid job and reserved only for the English military men during the Colonial days.

Prof. Rodrigo was also the first son of Sri Lanka and from the whole of the East to conduct full European Bands in London, Paris and the Continent of Europe who's Compositions were played by the Crystal Palace Military Bands and at the world wide great exhibition held in the Vatican Palace, Rome.

**FATHER RODRIGO'S BROTHERS AND OTHER MEMBERS OF THE SENAPATHIGE RODRIGO FAMILY WHO BROUGHT HONOUR TO THEMSELVES IN THEIR CHOSEN PROFESSIONS**

He was also the first to compose a National song in Sinhala during British Rule in Sri Lanka. The music notation was reproduced and printed by the Survey Department dated 15th, November 1929 (The writer preserve's a copy from the original print). It will be of great value to take the opportunity to quote the 3rd and last verse of the song:

***"O Ceylonese be united, and victory be yours, know we all that discord will bring your downfall."***

"Hail Mary" the recitation of the Rosary in Sinhala was set to music by Prof. Rodrigo and sung for the first time by the choir of St. John's Church, Modera and later in many churches to date.

Two of the popular hymns composed during his life time were the hymn to St. John the Baptist and the hymn to St. James the Greater.

These hymns of praise to these saints are sung as an anthem of St. John's Church, Modera while the hymn to St. James is sung as the anthem of St. James Church, Mutwal.

Prof. Rodrigo was also privileged to be honoured by His Holiness Pope Leo the X111 with the most coveted Papal Medal awarded to the whole of the East in the year MCMXXV (1925).

On 10th, January 1937 during the Papacy of His Holiness Pope Leo, Prof. Rodrigo had the honour of composing a Papal Anthem and other Sacred Music.

Professor Rodrigo died on 4th, June 1937.

From : Oscar Dodwell : LIFE AND BEYOND - The very Rev. Fr. Joseph de Solomon Rodrigo : Dodwells Wattala: 2005

White Hackle Section - RHQ SLLI

## EXPERT MUSICIAN'S TRIBUTE TO THE CEYLON VOLUNTEER BAND.

# 10 ශ්‍රීලපාහ දසවන අණදෙන නිලධාරි

1994.01.23 වන දින අභිනවයෙන් ආරම්භ කරන ලද 10 වන ශ්‍රී ලංකා පාබල හමුදාව වන්නි මානුෂීය මෙහෙයුමට අති විශාල දායකත්වයක් ලබා දී මේ වන විට මල්ලාවි ප්‍රදේශයේ ස්ථානගතව සිවිල් ජන ජීවිතය නගා සිටුවීමට උරදෙමින් රාජකාරින්ව නිරතව සිටී. ඒකකයේ අණදෙන නිලධාරි වශයෙන් රාජකාරි කළ ලුතිතන් කර්නල් ඒඑස් වික්‍රමසේන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී ශ්‍රීලපාහ තම ඒකක අණදෙන නිලධාරි තනතුර හා රාජකාරීන් 2012.03.24 දින යෙදුන සුබ මොහොතින් නි/62545 මේජර් කේඩීඑල්සී විජේනායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ වෙත භාරදෙන ලදී.



වර්ෂ 1969.03.22 දින දකුණු කොළඹ රෝහලේදී උපත ලැබූ මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරි පන්නිපිටිය ධර්මපාල මහා විද්‍යාලයෙන් සිප් සතර හදරා අපොස (උපෙ) සමත්ව රටේ පැවති යුද වතාවරණය මනාව තේරුම්ගෙන තම උපන් දේශයට සිදුවිය යුතු යුතුකම ඉටුකිරීම සඳහා 1993.01.01 දින ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත ආධුනික කෙඩෙට් නිලධාරියෙකු වශයෙන් එකවිය. තම ආධුනික නිලධාරි පාඨමාලාව දියතලාව යුද හමුදා විද්‍යා පීඨය වෙතින් හදරා 2 ලුතිතන් වරයෙකු වශයෙන් තම රාජකාරි ආරම්භ කරන ලදී. එතන් පටන් තම සේවය ශ්‍රී ලංකා පාබල හමුදාවේ ඒකකයන් වෙත ලබාදෙමින් වැඩි සේවා කාලයක් යුද බිමේ ගෙවා 1994 සිට යුද හමුදාව වෙතින් සිදු කරන ලද සියලුම ක්‍රියාන්වියන්ට තම සක්‍රිය දායකත්වය ලබාදී යුද බිමේදී කිහිප වතාවක්ම තම දේශය වෙනුවෙන් රුධිරය හෙලන ලදී.



නව අණදෙන නිලධාරි ඒකකයට සුවිශේෂී නිලධාරියෙකු වන අතර, එසේ සුවිශේෂී වන්නේ මෙම ඒකකයේ බී කණ්ඩායමේ නිලධාරි අණදෙන වශයෙන් පත්ව රාජකාරින් කර තිබීම නිසාය. බළඇණියේ පූර්ව ක්‍රියාකරකම් පිළිබඳ මනා දැනුමකින් යුක්තව 2006 පමණ වන තෙක් ඒකකය සමගින් රාජකාරින් කර ඒකකයෙන් නික්ම ගොස් විවිධ රාජකාරින් හි නියුක්තව වන ලදී. එම රාජකාරීන් අතුරින් කිහිපයක් නම් 571 බසේමු බළසේනා මේජර්, 11 සේමු මානි (11) පාලන, 642 බසේමු බළසේනා මේජර්. 8 ශ්‍රීලපාහ දෙවන අණදෙන නිලධාරි පාපුම මින්නේරිය විශේෂ තරුණ නිලධාරි පාඨමාලාව භාර පුහුණු සම්බන්ධීකරණ නිලධාරි යන තනතුරු ද සඳහන් කළ හැක. 2012.03.24 දින සිට මෙම ඒකකයේ 10 වන අණදෙන නිලධාරි වශයෙන් ඒකකයේ ඉතිහාසයට එක්වී තම සේවා කාලය තුළ ලබා ගන්නා ලද පන්නරය මෙන්ම විවිධ රාජකාරින් හා දේශිය හා විදේශිය පාඨමාලාවන් හි නියලෙමින් ලබාගන්නා ලද දැනුම ද උපයෝගි කරගෙන තම අණදීම විශිෂ්ට ලෙස ඉටු කිරීමට සමත් නිලධාරියෙකු බැව් සඳහන් කළ හැක.

නව අණදෙන නිලධාරි 2012.03.24 දින 1110 පැයට පමණ ඒකකය වෙත පැමිණ බළඇණි මුලස්ථාන කඳවුරේදී සම්මාන මුරයක් පිරිනමන ලදී. නව අණදෙන නිලධාරි 1116 පැයට යෙදුණ සුබ මොහොතින් සම්ප්‍රදායන්ට මුල්තැන දෙමින් පොල්තෙල් පහන දල්වා තම රාජකාරින් භාරගන්නා ලදී. එදින 1500 පැයට පමණ හටපිරිස් ඇමතිම සිදු කර අනතුරුව කොනොනි සමාජ ශාලාවේ සුදානම් කර තිබූ තේ පැන් සංග්‍රහයක් නව අණදෙන නිලධාරි වෙත පිළිගැන්වීමයි.

20 වසරකට ආසන්න කාලයක් පුරා දිවයිනේ විවිධ ප්‍රදේශයන්හි ක්‍රියාන්විත රාජකාරින්හි නියැලි රාජකාරි ඉටුකර ඇති මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරි විවිධ තනතුරු හොබවමින් සිය නායකත්වය මැනවින් පිළිබිඹු කරන ලදී. ලබා ඇති පරිණතභාවය උපයෝගි කරගෙන 10 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව පාබල රෙජිමේන්තුව තුළ දිදුලන ඒකකයක් වශයෙන් තව දුරටත් රැගෙන යාමට ශක්තිය හා ධෛර්ය ලැබේවායි ප්‍රාර්ථනා කරමු.

බුද්ධි අංශය 10 ශ්‍රීලපාහ



# සමාජ සුබසාධනය

## ළමා පෝෂණ වැඩසටහන 11 ශ්‍රීලපාහ

හෙට දින ලොවට පිබිදෙන මල් ලෙස හඳුන්වන කුඩා ළමුන්ගේ පෝෂණය පිළිබඳ සොයා බැලීම අප කාගෙත් වගකීමයි. එම පරමාර්ථය පෙරටු කරගෙන 513 බසේමු බළසේනාධිපති තුමාගේ මග පෙන්වීම මත 11 ශ්‍රීලපාහ අණදෙන නිලධාරි නි/62252 මේජර් ජේකේආර්පී ජයසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ හා ඒකකයේ සියලුම අයවළුන්ගේ පූර්ණ මෙහෙයවීම මත ඇන්කර් නිව්ඩේල් සමාගමේ දායකත්වය ඇතිව 11 ශ්‍රීලපාහ ඒකක බළ ප්‍රදේශයේ පිහිටි අරාලි හින්දු විද්‍යාලය, සිව ප්‍රකාෂ් විද්‍යාලය, කලයිමගල් විද්‍යාලය හා වඩ්ඩු හින්දු විද්‍යාලය යන විද්‍යාල තෝරාගෙන එහි ළමා පෝෂණය පිළිබඳ මව්වරුන් දැණුවත් කිරීමේ වැඩසටහනක් 2012.04.27 වන දින හා 28 යන දෙදින පුරා සිදු කරන ලදී. මෙහි ප්‍රධාන පාරමාර්ථය වූයේ ප්‍රදේශයේ පාසැල් ළමුන්ගේ සෞඛ්‍ය වර්ධනය කිරීමයි. මෙහිදී මල්ටි මීඩියා යොදා ගනිමින් හා නාට්‍ය අංශ මගින් ද මවුවරුන් දැනුවත් කළ අතර මෙම වැඩසටහනේ දේශණය සඳහා පැමිණි වෛද්‍ය කේ කාදීපන් මහතා ළමුන්ගේ පෝෂණය පිළිබඳ මව්වරුන් පූර්ණ දැණුවත් කිරීමක් සිදු කරන ලදී. මෙහිදී එක් පාසැලක් සඳහා රු 20000.00 චෙක්පතක් බැගින් පාසැල් හතර සඳහා ඇන්කර් නිවුඩේල් සමාගම වෙතින් පරිත්‍යාග කරන ලදී.

**බුද්ධි අංශය 11 ශ්‍රීලපාහ**





## අකුරට යන්නන් හට පාසල් උපකරණ සහිත බෑග් ලබාදීම 26 ශ්‍රීලපාහ

61 වන සේනාංකාධිපති බ්‍රිගේඩියර් ඒ කාර්යකරවන යූඑස්පී ගේ ඉදිරි සම්බන්ධීකරණ වැඩපිළිවෙල යටතේ 613 බළසේනාධිපති කර්නල් එම්එම් කිත්සිරි ආර්එස්පී ගේ උපදෙස් මත 26 ශ්‍රීලපාහ අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් ජේඑල්ටීකේ හේවා ආර්ඩබ්පී ආර්එස්පී ශ්‍රීලපාහගේ අධීක්ෂණය යටතේ 2012.02.10 දින සහ 2012.02.13 වන දිනවල තච්චනාමරදමඩු රජයේ දෙමළ මිශ්‍ර පාසල, පෙරියමඩු බටහිර රජයේ දෙමළ මිශ්‍ර පාසල සහ පෙරියමඩු නැගෙනහිර ප්‍රාථමික පාසල් හී ඉගෙනුම ලබන සිසු දරු දැරියන් හට අඩුපාඩුවක්ව පැවති පාසල් උපකරණ සහිත පාසල් බෑග් බෙදාදීමක් තච්චනාමරදමඩු දෙමළ මිශ්‍ර පාසලේ ප්‍රධාන ශාලාවේදී පවත්වනු ලදී.

මෙම පාසල් බෑග් සහ පාසල් උපකරණ 61 වන සේනාංකාධිපති ගේ ඉල්ලීම මත කොළඹ රාජකීය විද්‍යාලයේ 72 වන කණ්ඩායම විසින් පරිත්‍යාග කරන ලදී.

**බුද්ධි අංශය 26 ශ්‍රීලපාහ**






# මගේ හමුදා ජීවිතය

## සංස්කාරක සටහන

ශ්‍රී ලංකා යුද හමුදාවේ පළමු වරට මුද්‍රණය කර පලකළ සඟරාව ලෙස සැලකෙන 1952 වසරේ ප්‍රකාශිත "The Ceylon Army Journal" නමැති ප්‍රකාශනයෙන් ලබා ගන්නා ලද ලිපි මෙවර කලාපයේ සිට පල කරනු ඇත.

සුන්දර පරිසරයක සැදැසිරි විඳිමින් කෙළිබිමක් අබියස වූ විවේකාසනයක් මත නිදහස් යටගියාවක් මෙනෙහි කරන තරුණයෙකි. ඔහු ජාතික ඇඳුම ඇඟලා ගත් එඩිතර ගති ඇති හෙළයෙකි. ඔහුගේ මදහසින් ඔප්නැගුනු වත, සිත තුළ ඇති නොවක් සිතුවිලි විදහාපාන කැඩපතක් වැන්න. හේ වසර කිහිපයකට පෙර හෙළ දෙටු පෙළ සමත් වුවකි. අද ඔහු ලක්මව ලත් නිදහස එලෙසම රකිනු වස් රැස් කෙරෙන සෙබළ මූලයේ අනෙකෙනෙකුට නොදෙවෙනිව දස්කම් පා ඇති අභීරු සෙබළකි. ඔහු නමින් රණසූරය. බාල කාලය හා පාසල් සමය සිහි කර ඉන් මොබට ආ ඔහු සිත තුළ දන් නැගි එනුයේ අද ඔහු ගෙවන දිවිය ගැන සිතුවිලි දමෙකි.




නිදි දෙව් දුවකි ඇකයෙන් මා ඉවත් කෙරෙන අටියෙන් දෝ ඉමිහිරි හෝරණෑ නද මා දෙවසන් තුළට වැදී දිනරද වෙත පෙර ගමන් යන සුමුදු මද පවන් පහස ලබමින් අලුයම මම පිබිදෙමි. සැනකින් විදුලි පහන් දල්වා මගේ සයනාගාරය තුළ සුවසේ නිදි වැද සිසු මිතුරන් ද පුබුදු කරවා ඔවුන් නිදිගැට හරිද්දී මම ලහි ලහියේ එහෙත් නිසිසේ දැලි රැවුල් බාගතිමි. දත් මැද මුව දෙවිමි. සිරුරු පිස නිම කිරීමයි. මා කළ ඊළඟ කාර්යය පසුව දිය නා දෙසු සෙත් මග සමර කර මෙන් වඩා තුටු සිතින් දවසේ වැඩ අරඹයි.

අපට ඇඳ පැළඳ ගැනීමට දන්වන හෝරණෑ නද මා කන වැකනුවට පෙර මා ශාරීරික ව්‍යායාම සඳහා නියමිත ඇඳුම ඇඳ හමාරව තිබිණ. බොජුන් හල වෙත ළඟා වූ මට මිහිරි තේ කෝප්පය බී හැරී එන විට ඔබට ඇත්තේ තව පැය කාලකැ යි හඟවන නාලා හඬ ඇසින. තවත් කීප දෙනෙකු සමග සන්සුන් ව පෙළපාළි බිම වෙත ලගා වුනු මට අප අනුව දිවෙන සෙස්සන්ද පෙනින. අපට ශාරීරික ව්‍යායාම පුහුණු කරවන උපදේශකයානම්ද ළඟා විය. එහි පැමිණි සිටිය යුතු සැම සියටිත්දැයි පරීක්‍ෂා කර බැලූ එතුමා අප සැමගේ සිත් පිනවන හා ගත බල වඩන සුලු වූ ශාරීරික ව්‍යායාම රැසකට අප හවුල් කර ගනී. රිත්මානුකූලව කෙරෙන මේ ව්‍යායාමයන් හිදී සැම දෙනාගේ අත් පා හෝ කද එක්කෙනෙක් විසින් කරනු ලබන්නක් හෙයින් එකවර එසවෙනු පාත්වෙනු හෝ පැද්දෙනු දැක්ම අප ලැබ සිටින මනා පුහුණුව ගැන මටම ප්‍රීති වීමට ඉවහල් විය. නියමිත වේලාව ගෙවෙනු සමගම විසිර යවනු ලැබූ අපි අපගේ නිවාස ශාලා වටා වවා ඇති මල් පඳුරුවලට දිය දුන්නමෝ තුති ලී ගයමින් අප අවට පියබා මලින් පැනි උරන මීසැසි කැලයේ ගුමු නදින් හා සුවද මලින් නැගෙන සුවඳ කැවුණු මද පවනේ ආස්වාදයෙන් සොම්නස ලබමිනි.

සෙබළුන්ට අවන්හල වෙත රැස්වන ලෙස ඇගවෙන නළාහඬ ඇසින. එහි ළඟා වූ මට බටර් ගාන ලද පාන්පෙති කීපය කෑමට සමහර දිනෙක එළවලු හෝ මාලු ලැබුනත් අද ලැබුණේ දෝසි ටිකකි. කෑමෙන් පසු තේ කොප්පයක්ද බී හැරී ආ මම සෙබළෙකුට ව්‍යායාමයක් සඳහා නියමිත ඇඳුම් ආයිත්තම් වලින් සැරසුනි. මගේ පාවහන් දිලුසුනු අයුරු මා මුව දෙපා දෙස හරවා සිනාසුනු විට මාගේ දත් දෙපළ සපත්තු කෙලවරින් පෙණුනේ දසත් පතින් බැලූ විට දිසිවන ලෙසය. මගේ හිස්වැසුමේ සවිකළ සේනාංක සලකුණ හා බඳ පටිය ආදියෙහිවූ පිත්තල තහඩුන් දුටුවත් නෙත් වශී කරණ තරම් දිලිසින. හැඳ පැළඳ ගැනීමටත් පැය කාලකින් පෙලගැසිය යුතු බව හැගවීමටත් තවත් ඇත්තේ මිනිත්තු පහක් බව දැනුම් දීමටත් .වරින් වර හොරණෑව නාද කෙරින. මෙවිට මා සිටියේ පෙළපාළි භූමියේ පෙළ ගැසුන මට වඩා නොවුසු නොමිටි සෙබළුන් දෙදෙනෙකු අතරය. පෙළ ගැසීමේ හොරණෑ හඬද ඇසින. අප පරීක්සා බැලුමට පැමිනෙණ අප පුහුණු කරවීම හා මෙහෙයවීම භාර නිලධාරී හු අප ඉදිරියේ වූහ. මද වේලාවකින් ඔහු අප එකිනෙක සෙබළා අබිමුවට පැමිණ ඇදුම් පැළඳුම්, දැලි රැවුල් හා හිසකේ විපරමින් බැලූහ. මම ඔවුන්ගේ දොස් දැකුමකට ලක් නොවීම. පසුව අප ලවා කරවනු ලැබූ පා සරඹයන් හිදී අප සැම එකකුසේ පිය නැගුනු බව අප ගමන්ගත් තද බිමහි එකවර පියගැටි නැගුණු සදින්ම තහවුරු වෙයි. මටත් ඈතින් සිට එදෙස නෙත් යොමා සිටීමට ලැබුනිනම් දණකඩ බැද එහා මෙහා පද්දනු ලැබූ හෙයින් අප සැමගේ අත් එකවර ඉහළ පහළ වැනෙනු දිස්වෙනු නොඅනුමානයි.

සරඹ පුහුණුවෙන් පසු මද විවේකයක් ලත් මම යුද අවි ගැන අප ලබා තිබුනු දැනීම තහවුරු කරගනු සඳහා පැවැත්වූ පංති කිහිපයකදී පරණ දැනුමට නව පණ දෙමින් සිටි සෙබළෙකු වීමි. දන් හිරු උදාවී හෝරා පහක් පමණ ගත වීන. මා ගතට වෙහෙසක්ද දැණින. එහෙත් කිරි මසු තේ කෝප්පයකින් මම ප්‍රබෝදමත් කෙරුනු ලැබිමි. ඊළඟට අපට හවුල් වීමට සිදුවූයේ සතුරන් අබිමුව නොබා සටන් කිරීමට මනා පුහුණුවක් ලබා දෙන රණ සූරත්ව පාඩමකටය. මගේ අණ දෙන්නන් විසින් මෙහෙයවනු ලැබුවහොත් ලක් මවගේ නිදහස රැකදෙනු වස් බලවත් සතුරු සෙබළ මුලක් අබියසට අබිරුව පා නැගුමට තරම් පුහුණුවක් ලබාගැනීමට වාසනාවන්ත වීම ගැන මම ප්‍රීති වෙමි. රයිෆලයෙන් මා සතු හෝ අණකරනු ලැබූ ඕනැම ඉලක්කයකට වෙඩි තැබීමට මම සමත් වෙමි. මැෂින් තුවක්කුව, ස්ටෙන් මැෂින් කාබයිනය හා අත් බෝම්බය ගැනද මම මනා පරිචයක් ඇත්තෙමි. ඉතින් මා වැනියන් කැළක් රැස්කර ගැනීමේ වාසනාව ලත් ලක්මවට කවරනම් පරසතුරු බියක්ද?

මගේ රණ සූරත්ව පාඩම නිමවනු ලැබුයේ හිරු අවරට

## ......මගේ හමුදා ජීවිතය

යාමය. ඉන්පසු මම විසිර හරිනු ලැබීමි. නිවෙස් කරා ලංව මද විවේකයකින් පසු මුව සෝදා පිරිසිදුව මට දවල් බත සඳහා කැඳවනු ලබන නළා හඬ ඇසිණ. මිතුරන් සමග භෝජනාගාරයට ළඟාවුනු මට එළවලු මස් ආදියෙන් යුතු වූ බතක් හා පලතුරු වර්ගයක්ද ලැබුණි. මේ ආහාර පනාදියෙන් අතෘප්තිමත් වන එකද සෙබළෙකු නැත. කා බී නිවාවන්නට මත්තෙන් දවසේ වැඩ භාර සුලු නිලධාරි තැන මාගේ දෙමාපියන් මිතුරන් විසින් එවන ලිවුම් මා අතපත් කෙරින. අනතුරුව කියවීම් ශාලාවට මා පා තැබුවේ පුවත්පත කියවීමටය. කියවීම් හලින් හැරී ආ මම මා ලද ලිපි වලට පිළිතුරු ලියා තැපැල් කළෙමි. පසුව විවේකයක් ලබනු රිසි වූ මා පොතක්ද අතේ ඇතිව පසෙකට වූයේ විවේකයක් සමග මාගේ දැනුමද මදින් මද හෝ පළල් කරගන්නා ඇගයනි. පුරා හෝරාවක් පමණ විවේක සුවයෙන් ගත කළ මට සිහිවූයේ පසු දිනට සුදුසු ඇඳුම් පැළඳුම් දැ සකසා තැබිය යුතු බවයි. මා අතින් එයද නිමවින. සවද තේද පානය කළෙමි. විනොද ක්‍රීඩා සඳහා නියමිත කාලය ළඟා විය. සමහර දිනෙක අත් පන්දු හෝ හොකි ක්‍රීඩාවක යෙදෙනත් මා අද හවුල් වූයේ පා පන්දු තරගයකටය.

පන්දු කෙලියෙන් පසු දිය නා පිරිසිදු වූ මා රිස්ස වූයේ සැඳෑ සිරියෙන් හා සිසිල් මඳ පවනින් ගත සපත්වා ගනු වස් විනෝද ගමනක යෙදිමයි. මා කඳවුරෙන් එද්දී මා හා එලිබට මිතුරෝ ඔවුන් සිටි දෙසට පා නැගුහ. මා මෙහි පසුවනනේ තනිවමුත් තුටු සයුරේ ගිලී ඉපිලෙමිනි. ඔ,හෝ ඒ ඇසෙන්නේ රිටි රිටි හඬද? ඔව් වේලාව හයයි ධජ බස්වන වේලාව හෙයින් එයට ගරු කරනු වස් මා සීරුවෙන් සිටිය යුතුයි. රාත්‍රී භෝජනයට ඇත්තේ හෝරා එකහමාරයි. ඊ කෑමෙන් පසු ගායනයකට හා වාදනයකට මාගේ මිතුරන්ද පොලඹවා ගන්නෙමි. මා ආපසු යන විට ශාන්ති නායකයන් ඉදිරියේ සුවද දුම් බීමට හඳුන්කූරු මිටියක් මිලයට ගැනිමද අමතක නොකරන්නේමි. නොමිලයේ වෛද්‍යාධාර ආදියද ලබන මට ආගමික කටයුතු වලටත් මා පියන්ගේ වියදමටත් අසරණයන්ගේ සහනයටත් සුදුසු මුදලක් වෙන් කොට සෑහෙන මුදලක් මගේ මතු දියුණු සඳහා ඉතිරි කිරීමටද මා ලබන වැටුප ප්‍රමාණවත්ය. මම සෙබළ ඇඳුමින් හෝ ජාතික ඇඳුමින් සැරසී මග සැරිසරන විට අවට සිටින මහජනයාගේ ගෞරවයට පාත්‍ර වෙමි. එලෙසම ඒ ගෞරත්වය රැක ගැනීමට උත්සාහ වඩමි. මගේන් ඉටු විය යුතු යුතුකම් සියල්ලක්ම තුටු සිතින් ඉටු කරමි. චාම් ගතිපැවතුම් වලට ආසා කරමි. උසස් අයට බුහුමන් කරමි. නීතිගරුක වෙමි. සෑම අවස්ථාවකදීම මැදහත් සිතින් කටයුතු කරමි. මෙලෙස කටයුතු කිරීමෙන් මාගේ මිතුරන්ගේ හා උසස් නිලධාරීන්ගේ පමණක් නොව මහජනයාගේ ද සිත් ගැනීමට හා නිදහසේ ජීවත් වීමට මා සමත් නම් උදාසීනත්වයෙන් ඇත්ව කටයුතු කෙරෙන සෑම සෙබළෙකුටම මට වැනි ප්‍රීතියක් ලං නොවන්නේ නොවෙයි.

**ලාන්ස් කෝප්‍රල් පරණවිතාන ඊ**
**භෞමික හමුදා ආධුනික අභ්‍යාස ආයතනය**
**දියතලාව 22.8.52**

# "ගැහැණිය සුරකිනු බබලනු වස්"

වෙනස් නොවනා සෙනෙසහස මවු සෙනෙහස ලෙස පිළිගන්නා සංවේදී ආසියාතිකයන් වන අප ජීවත්වන පරිසරය තුළද මේ වන විට මවකගේ ළය මඩලේ පිරෙනා කිරටද මිළක් නියම වී තිබේ. ලෝකය පිළිගත්තද, නොපිළිගත්තද, සැබෑව එයයි.

අද වන විට සාර්ථක මට්ටමින් කාන්තා සවිබල ගැන්වීම වෙනුවෙන් කැප වී සිටින හා ක්‍රියාත්මක කරන කාන්තා ව්‍යාපාර හා සංවිධාන විශාල ලෙස ක්‍රියාත්මක වන නමුත් පුදුමයට කරුණ වන්නේ අද සමාජය ගැහැණිය තව දුරටත් පසු පසට තල්ලු කර ඇති බැව් ප්‍රසිධියේ පිළිගැනිමට සිදුවීමය.

සෑම වසරකම (මාර්තු 08) ලොව පුරා ජාත්‍යන්තර කාන්තා දිනය සැමරේ. වසරින් පිරිමින්ට හිමි දින 365 න් එක් දිනක් පමණක් ගැහැණියට උරුම වේ. තවද ලොව මුලින්ම ප්‍රජාතන්ත්‍රවාදය මානව හිමිකම් වැනි සංකල්ප තුළදී "ගැහැණුකමට" ලැබූ පිළිගැනිම එසේ විය.

"ගැහැණියගේ සේවය පිරිමියාගේ සේවය" තරම්ම අගය නොකරන සමාජයේ සමබර දියුණුවක් නැතිබව ශ්‍රේෂ්ඨ ඉන්දියානුවෙකු වන මහත්මා ගාන්ධිතුමා වරක් ප්‍රකාශ කර ඇත. කාන්තාවන්ට වඩාත්ම සුදුසු වන්නේ "ගුරුකම" යන පැරණි මතය කල් පැන ගොස් තිබිම සතුටට කරුණකි. ත්‍රිවිධ හමුදාව, විද්‍යුත්, හා යාන්ත්‍රික අංශයන්ගේ ද සියුමැලි ගැහැණු රුව පෙනිම අගේ කළ යුතුය. නමුත්...? රැකියාවක් ඇති රුවති, උගත් දියණියකට කුලගෙට යාමට අවස්ථා සති අන්ත පුවත්පත් වල මංගල යෝජනා තිරුවල කොතරම් තිබුනද වෙළඳ කලාපයේ රැකියාවේ නියුතු "තරුණියක්" විවාහය සඳහා සොයන "මනාල මහතෙකු" ඒ දුන්වීම් අතර සුලබ නොවේ. මේ ආකල්පය දූන් වෙනස් වෙමින් පැවතියද එය ඉතා සීග්‍රයෙන් සිදුවිය යුතුය.

ගෘහ සේවිකාවන් ලෙසින් "ගැහැණුන්" අපනයනය කිරිම ද මෙරට ජයටම සිදුවේ. පුරුෂ මූලික පවුලේ සවියක් නොමැති කල ගැහැණුන් නොදන්නා දුර රටකට යයි. ගැහැණුන් තම සම්පතමයන්ගේ උණුසුමින් වෙන් වි පියාසර කරනුයේ රට තොට සිරි නැරඹිම සඳහා නොවේ. ඔවුන්ගේ ශ්‍රමය පිට රැටියන්ට විකිණිමෙන් ලැබෙන මුදල් පොදියට අමතරව සදාකලික අබ්ගාතයන් වී, අහස, පොළොව නොඉවසනා අකටයුතුකම් වී උප්පැන්න සහතිකයට පියවරුන් නොමැති දරුවන් ද ලැබි පිට රටින් එන කාන්තා චරිත නොවේ යැයි අපට නිශ්චිතවම පැවසිය හැකිද? පිරිමින්ගේ සිල්ලර අවශ්‍යතා වෙනුවෙන් ගැහැණුන්ව සූක්ෂමව මෙහෙයවිම වෙනුවෙන් සමාජය ගැහැණිය දෙසටම පමණක් ඇගිල්ල දිගු කිරිම කෙතරම් සදාචාරත්මක දැයි සිතා බැලිම වටී. "අඩ නිරුවත හා නිරුවත" නැතිවම බැරිව තිබෙනුයේ ගැහැණුන්ට නොව පිරිමින්ට බැව් බුද්ධිමත් පිරිමින්ට නොසිතෙන්නේ මන්දැයි ප්‍රශ්ණයකි. සමාජය දෙස සවිඥානක හදවතින් බැලිම තුළ බුද්ධියෙන් සටන් වැදිමට තරම් යහගුණයෙන් පිරිපුන් මානව, මානවිකාවන් ඔබ අප අතරින්ම නිර්මාණය වු දිනක සමස්ත ලෝකයටම යහපතක් වනු ඇත. එමගින් ගැහැණිය මුවහත් වි මව් පදවිය දිප්තිමත් වී සමස්ත සමාජ ක්‍රමයම සුරකෙනු ඇත.

**කෝප්‍රල් ජයරත්න ඩීඑන්**
**18(සෙව්) ශ්‍රිලපාහ, සී කණ්ඩායම**

# The Last Post Song

If any of you have ever been to a military funeral in which The Last Post was played; This brings out a new meaning of it.

But, do you know the story behind the song? If not, I think you will be interested to find out about its humble beginnings.

During the night, Captain Ellicombe heard the moans of a soldier who lay severely wounded on the field. Not knowing if it was a Union or Confederate soldier, the Captain decided to risk his life and bring the stricken man back for medical attention. Crawling on his stomach through the gunfire, the Captain reached the stricken soldier and began pulling him toward his encampment.

When the Captain finally reached his own lines, he discovered it was actually a Confederate soldier, but the soldier was dead.

The Captain lit a lantern and suddenly caught his breath and went numb with shock. In the dim light, he saw the face of the soldier. It was his own son. The boy had been studying music in the South when the war broke out. Without telling his father, the boy enlisted in the Confederate Army.

The following morning, heartbroken, the father asked permission of his superiors to give his son a full military burial, despite his enemy status. His request was only partially granted.

The Captain had asked if he could have a group of Army band members play a funeral dirge for his son at the funeral.


The request was turned down since the soldier was a Confederate.

But, out of respect for the father, they did say they could give him only one musician.

The Captain chose a bugler. He asked the bugler to play a series of musical notes he had found on a piece of paper in the pocket of the dead youth's uniform.

This wish was granted.

The haunting melody, we now know as 'The Last Post' used at military funerals was born.



**The words are:**

*Day is done.*
*Gone the sun.*
*From the lakes*
*From the hills.*
*From the sky.*
*All is well.*
*Safely rest.*
*God is nigh.*

*Fading light.*
*Dims the sight.*
*And a star.*
*Gems the sky.*
*Gleaming bright.*
*From afar.*
*Drawing nigh.*
*Falls the night.*

*Thanks and praise.*
*For our days.*
*Neath the sun*
*Neath the stars.*
*Neath the sky*
*As we go.*
*This we know.*

ලාස්ට් පෝස්ට් නමැති බියුගල් වාදනය සිදු කරන යුද හමුදා අවමංගල්‍යය උත්සවයකට ඔබ සහභාගි නොවී ඇතිනම් එය බොහොමත් කලාතුරකින් විය යුතුය. ඉතා දුක්මුසු, මතකයේ රැව් පිලිරැව් දෙන වාදනයක් වන මෙහි අතීත කතාව සොයා බැලීම සහ එහි තේරුම සොයා බැලීම ඔබ අප කා හටත් වැදගත් වනු ඇත.

18 වන ශත වර්ශයේ අග භාගයේදී කොන්ෆිඩරේට් හමුදා සහ යූනියන් හමුදා අතර ඇතිවූ සටන් අතරතුර දිනයක රාත්‍රියේ සටන් බිමේ සිටි කපිතාන් එලිකොම්බේ වෙත බරපතල ලෙස තුවාල ලැබූ සොල්දාදුවෙකුගේ කෙඳිරිලි හඬ අසන්නට ලැබුනි. දැඩි ලෙස තුවාල ලබා ඇති සෙබලා සතුරු පක්ෂයේද මිතුරු පක්ෂයේද යන්න නොබලා ඔහුට වෛද්‍ය ආධාර දීම සඳහා කපිතාන් විසින් තීරණය කරන ලදී.

වෙඩි වරුසා මධ්‍යයේ බඩගාමින් තුවාල වූ සෙබලා ලඟට කිට්ටුවූ කපිතාන් වරයා සෙබලා ඇදගෙන තම කඳවුරු සීමාවට රැගෙන ඒමට පිටත්විය. ඉතා අපහසුවෙන් තුවාල වූ සෙබලා තම කඳවුරු සීමාවට රැගෙන ආ පසු ඔහු දුටුවේ සෙබලා තම විරුද්ධ පාක්ෂිකයෙකු බවත් ඔහු ඒ වන විට මියගොස් ඇති බවත්ය. තව දුරටත් සැක හැර ගැනීම සඳහා කපිතාන් වරයා ලන්තෑරුමක් පත්තු කර සෙබළාගේ මූණ වෙත යොමු කරන ලද අතර කපිතාන් වරයාගේ හදවත මොහොතකට නතර වූ බව හා ඇතිවූ හදිසි කම්පනයෙන් ගල් ගැසී ගිය බවත් වැටහුනි. ලන්තෑරුම් එලියෙන් සොල්දාදුවාගේ මුහුණ තවත් නිරීක්ෂණය කල කපිතාන් වරයා දුටුවේ මියගොස් සිටින්නේ තමාගෙ 'ම ආදරනීය පුතනුවන් බවයි. යුද්ධය ආරම්භ වන සමයේ දකුණු ප්‍රදේශයේ සංගීතය හදාරමින් සිටියදී පියාටත් නොදන්වා මොහු කොන්ෆිඩරේට් හමුදාවට බැඳී ඇත.

ඉතා කම්පාවට පත් පියා පසුදා උදෑසන තම හමුදා නිලධාරින්ගෙන් පුතනුවන් වෙනුවෙන් පූර්ණ හමුදා ගෞරව සහිතව මිහිදන් කිරීමට ඉල්ලා සිටියත් පුතනුවන් සතුරු පක්ෂයේ බැවින් ඒ සඳහා අර්ධ හමුදා ගෞරව සහිතව සිදු කිරීමට අනුමැතිය ලැබුනි. කපිතාන් වරයා තම පුතනුවන් වෙනුවෙන් අවමංගල්‍ය ගීතයක් වාදනය කිරීම සඳහා හමුදා සංගීත කණ්ඩායමේ සේවාව ලබාදෙන ලෙස කරන ලද ඉල්ලීමද ප්‍රතික්ෂේප වූ අතර කපිතාන්වරයා අවසානයේ බියුගල් නලා කරුවෙකුගේ සේවාව ලබා ගන්නා ලදී.

පියා බියුගල් නලා කරුගෙන් ඉල්ලා සිටියේ මියගිය තම පුතනුවන්ගේ නිල ඇඳුමේ සාක්කුවක තිබී සොයාගත් කඩදාසි කැබැල්ලක තිබූ සංගීත මාලාවක පද සරනිය වාදනය කරන ලෙසයි. එම ඉල්ලීමට අනුමැතිය ලැබුනු අතර අදටත් ''ලාස්ට් පෝස්ට්'' ලෙසින් හද කම්පාකරවන සුලු මතකයේ රැව් පිලිරැව් දෙන ස්වරයෙන් වාදනය කරන සංගීතයේ ආරම්භය එයයි.

**වයිට් හැකල් ප්‍රකාශන අංශය ශ්‍රීලපාහ**

# පාබල හමුදා පුහුණු ක
# පාඨමාලා අංක 2














# රුවන් පුහුණු කිරීමේ සාර්ථකව නිමාවට







යුද හමුදා මාණ්ඩලික ප්‍රධානි සහ පාබල හමුදා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්පී ගේ අදහසක් අනුව ආරම්භ කරන ලද ''පුහුණුකරුවන් පුහුණු කිරිමේ පාඨමාලා අංක 02" 2012 මාර්තු මස 08 දින සිට 21 වන දින දක්වා පාබල හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී සාර්ථකව පවත්වන ලදී.

ශ්‍රී ලංකා පාබල හමුදා නිලධාරීන් ගේ වෘත්තීමය දැනුම සහ අත්දැකීම් තවදුරටත් ඔපවත් කිරීමේ අරමුණින් සංවිධානය කරන ලද මෙම වැඩසටහන කොළඹ විශ්වවිද්‍යාලයේ මානව සම්පත් අභිවර්ධනායතනය සමග සම්බන්ධතාවයෙන් පවත්වන ලදී.



පුද්ගල සංවර්ධනය, මානව සම්පත් කළමනාකරණය, සමාජ විද්‍යාව, මනෝ විද්‍යාව, කලාව,ආගම සහ සංස්කෘතිය පිළිබදව පුළුල් දැනුමැති මහාචාර්යවරුන් සහ ආචාර්යවරුන්ද, අත්දැකීම් බහුල ජ්‍යෙෂ්ඨ විශ්‍රාමික නිලධාරීන් කිහිප දෙනෙකුද මෙම වැඩසටහනට සම්පත් දායකයින් වශයෙන් සහභාගී විය.

මාස් හෝල්ඩින් සහ කටුනායක ශ්‍රී ලංකන් කේටරින් (පෞද්ගලික) සමාගම ඔවුන්ගේ සාර්ථක තරගකාරී පෞද්ගලික ව්‍යාපාර අංශයන්හි මානව සම්පත් පරිපාලනය, ආයතන කළමනාකරණය, නිෂ්පාදන ක්‍රියාදාමයන් පිළිබඳව පාඨමාලාවට සහභාගි වු නිලධාරීන්ට ප්‍රායෝගික අධ්‍යයනයක් ඔවුන්ගේ ආයතන වලදී ලබා දුන්හ.

එසේම මෙම සහභාගීත්ව පුහුණු අධ්‍යයන වැඩසටහනට පාබල හමුදා නිලධාරී නිවස්නයේ පවත්වන ලද ක්‍රමවත් යුද හමුදා භෝජන සංග්‍රහයක් ද ඇතුළු ප්‍රායෝගීක ක්‍රියාකරකම් රැසක් අන්තර්ගත විය.

පාඨමාලවට සහභාගී වු නිලධාරීන්ට විවිධ විෂයන්හි නව කුසලතාවයන් සහ දැනුම වර්ධනය කරගැනීමට මෙම "පුහුණු කරුවන් පුහුණු කිරීමේ පාඨමාලාව" මහගු පිටිවහලක් වු අතර ඒ වෙනුවෙන් පාඨමාලාව අවසානයේදී කොළඹ විශ්වවිද්‍යාලයේ වටිනා සහතික පතක් ද පිළිගන්වන ලදී.

**වයිට් හැකල් ප්‍රකාශන අංශය ශ්‍රීලපාහ**







# ශ්‍රීලපාහ අන්තර් ඒකක සරඹ තරගාවලිය 2012

ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු අධිපතිතුමාගේ සංකල්පයක් මත ඒකක අතර, සාමූහිකත්වය සහ තරගකාරිත්වය වර්ධනය කිරීම සඳහා පවත්වන ලද අන්තර් ඒකක සරඹ තරගාවලිය 2012.02.14 සහ 2012.02.15 යන දෙදින තුළ රෙම ශ්‍රීලපාහ සරඹ භූමියේදී ඉතා උසස් අන්දමින් පවත්වන ලදී. මෙම තරගාවලියේ දී සියලු ඒකක අතර තියුනු තරගකාරිත්වයක් පැවතිණි.

මෙම තරගාවලියේදී 26 ශ්‍රීලපාහ ඒකකය වෙතින් සහභාගි වූ සරඹ කණ්ඩායම සිව්වන ස්ථානය හිමිකර ගන්නා ලදී. නවතම බළඇණියක් වූ මෙම ඒකකය වෙතින් දක් වූ දස්කම් මත මෙම ජයග්‍රහනය ලබාගැනීමට හැකි වූ අතර, ලද අත් දැකීම් උපයෝගි කරගනිමින් ඉදිරියේදී පැවැත්වෙන තරගාවලියේදී තව තවත් ඉදිරියට පැමිණීමට හැකිවේවා යි ප්‍රාර්ථනය කරන්නෙමු.

බුද්ධි අංශය 26 ශ්‍රීලපාහ



# රුවන් වැකි

★ දේවත්වය මිනිසත් බවේ උතුම්ම පදවියයි. - **ෂේක්ස්පියර්**

★ අහිංසකයාටද, දුබලයාටද සෑම විට පිහියන්නා වූ ඉටු දෙවියා සාධාරණ නීතියයි. - **ජැපර්සන්**

★ නරකින් හොඳට පත් වූ මිනිසෙකුගේ ජීවිතය සැබැවින්ම ඇසූ පිරූ තැන් වලින් පිරී ගිය එකකකි. - **රිචඩ් හූකර්**

★ ආදරය පතා ඉල්ලීම් කිරීම එහි නිර්මල බව පවා කෙලෙසයි. මන්ද ආදරය සැමවිටම ඉල්ලීමක් නොව පිදීමක් වන බැවිනි. - **මහත්මා ගාන්ධි**

★ සෑම මිනිසෙක්ම වාසනාවන්තයෙකි. එමෙන්ම අවාසනාවන්තයෙකි. - **හාර්වඩ්**

★ මලට පෙති සේම, මිනිසාට පෞරුෂත්වයද වැදගත්ම දෙයකි. - **ඉ ම ර් ස න**

★ පොඩි දෙයක් ගැන ලොකුවට මෙනෙහි කිරීමේ හැකියාව ලැබී ඇත්තේ ගැහැණියකට පමණයි. - **ජේම්ස් ස්ටීවන්**

★ අතීතය ගැන දොඩන බුද්ධිමතා ද අමනයෙකි. වර්තමානය ගැන දොඩන අමනයා පවා බුද්ධිමතෙකි. අනාගතය ගැන දොඩන කොයි කවුරුත් මෝඩයෙකි. - **නැපෝලියන් බොනපාට්**

★ ඔබ යම් කිසි විශ්වාසයක කරුණු සොයා නොබලා එල්බ ගත්තා ද ? එදා සිට ඔබ මෝඩයෙකි. - **හැව්ලොක් එලිස්**

★ ශ්‍රේෂ්ඨ මතයක් තියෙන සමහර මිනිස්සු ශ්‍රේෂ්ඨ බොරු කාරයෝය. - **ඇල්ගිනන් සිඩ්නි**

★ සාමයට වර්ගයක්, පාටක් , ජාතියක් නැත. එය මුලු විශ්වයටම අයිතිය. - **මැක්සිම් ලිට්විනෝව්**

★ ඔබ එක මිනිසෙකුව පීඩනයට පත් කළ විට ඒ මිනිසා සිය දහස් මිනිසුන්ව පීඩනයට පත් කරන බව සිතේ තබා ගත යුතුය. - **බෘකන්ස්**

★ මද හැකියාවක් තිබෙන මිනිස්සු වැඩිපුර ප්‍රසිද්ධ වීමට දඟලන පුද්ගලයින්ය. - **ෆැන්සිස් බේකන්**

★ විවේචනය දිය ලුණු වගේ දෙයකි. එය කටුකය. නමුත් ව්‍යාංජනයේ උසස් රසවත් බාවයට දිය ලුණු අත්‍යාවශ්‍ය වන්නා සේම විවේචනයද සියලු මිනිස් ක්‍රියාදාමයන් තුළදී සිදු කරන්නේ වැදගත් මෙහෙවරකි. - **වින්ස්ටන් චර්චිල්**

★ මට පුත්‍රයෝද ඇත. මිතුරෝද ඇත. ප්‍රශංසා නොඅඩුය. යමෙක් පවසයිනම්, ඔහුට ඔහුත් නොමැති ලොවක මොන පුත්‍රයෝද ?මොන මිතුරෝද ? - **බුදුන්වහන්සේ**

★ තනි වූ මිනිසුන් සොයා එන්නෝ අපූරු මිතුරන්ය. - **ෂේක්ස්පියර්**

★ ස්වභාව ධර්මය ද සෑම විටම තමාටම ප්‍රිය කරන මිනිසාට ප්‍රිය කරන්නේය. - **විලියම් වර්ඩ්ස්වර්ත්**

★ කොයි දෙයක් වුවද පමණට වැඩියෙන් තිබෙන විට එහි අගයක් නැත. වාසනාවද මෙලෙසමය. - **ජර්මන් පිරුළක්**

★ බුද්ධිමතුන්ගේ තර්ක විතර්ක ලෝක සාමයේ ක්ෂේම භූමිය එළිය කළ මිණි පහන් වැනිය - **විලියම් කොලින්ස්**

★ වඩා දක්ෂ ඉංජනේරුවෝ නම් මිනිස් ආත්මය තනන ලේඛකයෝය. - **ජෝසප් ස්ටාලින්**

★ සුන්දර දේ මියගියද මතකය තුළ නොමැරී ජීවත් වේ. - **තෝමස් බෙලී**

★ පුංචි දේවල් සොයා ගන්න මිනිසා කළ ලොකු උත්සහය නිසා ඒවා ජයගැනීමට බැරිව යන අවස්ථා ඇත. - **ඩබ්ලිව් ලෝංපෙලෝ**

★ ශ්‍රේෂ්ඨ බුද්ධිමතෙකු වීමට කිසි විටක ඔබ තවත් බුද්ධිමතෙකු ආදර්ශයට නොගන්න. ඔහු කිය වූ පොතපත සොයා බලා කියවන්න. - **රැල්ෆ් ඩබ්ලිව් ඉමර්සන්**

**පොතපත ඇසුරෙන් රුවන්පුරේ ඉන්දික එස් හැන්නදි**

# තාරුණ්‍යයේ අනාගතය

තාරුණ්‍යය යනු ජීවිතයේ සොඳුරුතම අවධිය කීවොත් කිසිවෙක් විරුද්ධත්වයක් ප්‍රකාශ නොකරනු ඇත. ජීවිතය යනු මිනිසෙකුගේ උප්පතියේ සිට මරණය දක්වා දිවෙන කාලය වන අතර ඔහු හා ලෝකයා අතර ඇති සබැඳියාවයි. ඔහුගේ ඇයගේ ජීවිතය සාර්ථකත්වය නැමැති සාගරය තරණය කිරීමට නම් ඔවුන්ගේ තරුණ අවධියේදී කරනා ක්‍රියාකරකම් හා ලබාගන්නා අත්දැකීම් බෙහෙවින් බලපානු ඇත.

තාරුණ්‍යයේදී ජවය, ශක්තිය මෙන්ම බුද්ධියද එකසේ වර්ධනය වු අවධියයි. මෙම අවධියේදී තරුණයෙක් හෝ තරුණියක් ගන්නා වු තීරණ ඔහුගේ හෝ ඇයගේ අනාගතයේ අභිවෘද්ධියට හා සාර්ථකත්වයට සෘජුවම බලපානු ලබයි. එම නිසා තරුණ අවධිය සෑම පුද්ගලයෙකුටම ඉතා වැදගත් වනුයේ තමගේ අධ්‍යාපනය, වෘත්තීය ජීවිතය වගේම විවාහය වැනි අනාගතයට අතිශය වැදගත් තීරණ සියල්ලක්ම ගනු ලබන්නේ මෙම අවධියේදී බැවිනි.

ඒ වගේම තාරුණ්‍යයේදී තරුණයෙක් තරුණියක් රැක ගත යුතු කරුණු කිහිපයකි. එනම්,

- ★ ආත්ම ගෞරවය
- ★ ආත්ම විශ්වාසය
- ★ අවංකභාවය
- ★ නිහතමානීත්වය

මෙම කරුණු හතර රැකගත් පුද්ගලයෙකු ඔහුගේ ජීවිතය සාර්ථකත්වයේ කඩයිම කරා ලගා වනු නොඅනුමානය. එවැන්නෙන්ම මෙම අවධියේදී එඩිතරභාවය, සෑම දේයකටම ඉදිරිපත් වීමේ හැකියාව වගේම තමාට වඩා උසස් වැඩිහිටි පාර්ශවයන්ට ගරු කිරීමට ද හැකියාව තිබීම සාර්ථක තරුණයෙකුගේ ගති ලක්ෂණ වේ.

වත්මන් තාරුණ්‍යය ඉහත සඳහන් කරුණු වලින් බැහැරව කටයුතු කිරීමෙන් වැනි වැරදි වැඩ රාශියක් සිදු කිරීමට යොදා ගැනීම දක ගත හැකිය. ඉතා භයානක අපරාධ සමාජයට විවර කිරීමට තාරුණ්‍ය මගින් ඉතා පහසුවෙන් හසුකර ගැනීමට විවිධ තාරාතිරමේ පුද්ගලයින් සැදී පැහැදී ඇත. අද සමාජයේ තාරුණ්‍යයට තැනක් තිබේද ?. එය ටිකෙන් ටිකෙන් අහිමි වෙමින් පවතී. ඒසේ වෙන්නේ ඇයි ?. තරුණ්‍යය පහත සඳහන් කරුණු කෙරෙහි ලොල් අද පිළි ගැනීම අහිමි වෙමින් පවතී.

- ★ මත් ද්‍රව්‍ය
- ★ මත් වතුර
- ★ දුම්වැටි
- ★ ස්ත්‍රී දූෂන
- ★ හොරකම්
- ★ මිනී මැරීම්

කරුණාකර මොහොතක් ඔබත් මේ ගැන සිතන්න. අද සිට ඔබ ඔබගේ නරක පුරුදු වලින් දුරස් වීමට පුරුදු වන්න. එය කිරීමට පහසුයි අවශ්‍ය වන්නේ ඔබගේම සිත පමනයි. ඔබගේ මනස එසේ නැතිනම් සිත පුලුවන් තරම් පිරිසිදු කර ගැනීමට උත්සහ කරන්න. ඒ සඳහා පහත සඳහන් කරුණු කෙරෙහි සිත යොමු කරන්න. ඔබට පුළුවන් මේ ව්‍යවසනයෙන් බේරීමට.

- ★ මුලින්ම තමන්ගේ සිතට අවංක වන්න
- ★ ආගමට අනුව ජීවිතය හැඩ ගැසීමට පුරුදු වන්න.
- ★ දිනකට පැයක් වත් ව්‍යායාම කරන්න.
- ★ වැඩිහිටියන්ට ගරු කරන්න. ඔවදන් ගන්න.
- ★ විවේකී අවස්ථාවන් වලදී පොතපත කියවන්න.
- ★ ධනාත්මකව සිත පෝෂනය කර ගන්න.

ඔබගේ දෙමාපියන් ඔබව මෙලොවට බිහි කර ඉන් පසු උස්මහත් කලේ හොඳ පුරවැසියෙක් රටට, ලෝකයාට දායාද කරන්නයි. එම බලාපොරොත්තු දිනෙන් දින වැඩි කරනවාද ? එසේ නැතිනම් අහිමි කරනවාද ? යන්න තීරණය ඔබ සතුයි.

සිටියොත් හොඳට හැදී
දෙවියොත් නමට වදී

ආසෙ පෙරේරා එම්ජ්ඩී

## ආදරණීය අම්මා

සෙනෙහසේ නාමයෙන් දස මසක්
කුස තුළ පෝෂණය කළ මව්නි මගේ
පතන පැතුම් මතු බුදු වන්නට
උත්තම ගුණ සෙනෙහසින් මතු භවයේදීත්
පතන්නෙම් ඔබ කුස තුළ නැවත
ඉපදෙන්න ඔබ රැකගන්න සැමදා
ගත සිත වෙහෙසන්නෙම් අම්මේ

සාසෙ ධනුෂ්ක එච්ජි
බී කණ්ඩායම 19 ශ්‍රීලපාහ

## මගේ අම්මේ

හිත සනසන්නේ
ඔබේ සෙනෙහසයි මගේ අම්මේ
අසරණ වුදා දිවි කතරේ පිහිට
පතන්නේ ඔබ ගෙනි මා මගේ අම්මේ
දහසක් අය මැද තනිවුන මොහොතේ
සිහියට එන්නේ ඔබ අම්මේ
ආදර සිතුවිලි හද පතුලේ ගිනි ඇවිලෙන
විට සිත ඇතුලේ වැලපෙන මා සිත
සුවපත් කෙරුමට ඔබ පමණයි මා ළඟ රැඳුනේ

ලාකෝ කුමාර බීඅයිඩී
7 ශ්‍රීලපාහ සී කණ්ඩායම

# 8 ශ්‍රීලපාහ බළඇණි සාමූහික පුහුණුවීම්සාර්ථකව නිමකල වගයි

පසුගිය යුදමය වාතාවරණය යටතේ ඒ සඳහා සාර්ථකව මුහුණ දුන්නද අප ඒකකයට බළඇණියක් ලෙස සාමූහිකව පුහුණුව සඳහා අවස්ථාවක් නොලැබුණ අතර, ආසේමු (කිලි) යටතේ අතිරේක බළඇණියක් ලෙස ස්ථාන ගතවීමෙන් පසු ඒ සඳහා අවකාශ සැලසුණි.



වර්ෂ 2012 ජනවාරි මස 09 වන දින 65 සේනාංකය යටතේ පාලනය වන මුලංකාවිල් බළඇණි පුහුණු පාසලහීදී ඒකකයේ නිලධාරින් සහ සෙසුනිලයින්ගේ සහභාගීත්වයෙන් පාඨමාලාව ආරම්භ විය. 651 බළසේනාධිපති කර්නල් සීඑම්ඩීපී චන්ද්‍රසේකර සමාරම්භක දේශණයෙන් පාඨමාලාවේ අරුත මනා ලෙස වටහාදෙන ලදී. පාඨමාලාව තුළදී ශාරීරික අභ්‍යාස, බාධක තරණය, වෙහෙසකර පාගමන, සිතියම් කියවීම, කොම්පාසු සංචාර, ඉලක්ක පත් හදුන්වාදීම, දිවා රාත්‍රි වෙඩි තැබීම, ආධාරක අවි පරිහරණය, ක්ෂණික ක්‍රියා සරඹ, වනයේ ලැගුම් ගැනීම, රැකසිට පහරදීම, සතුරු කඳවුරු විනාශ කිරීම මෙන්ම නීති විරෝදි රැස්වීම් විසුරවා හැරීම, ක්ෂණික මාර්ග බාධක, විමර්ශණ මුර සංචාර, වැනි අභ්‍යන්තර ආරක්ෂක රාජකාරීන් සහ සිවිල් නීතිය ආදි විවිධ විෂයන් ඔස්සේ ද හටපිරිස් ඉතා





උනන්දුවෙන් හා උද්යෝගයෙන් පුහුණුවීම් සඳහා සහභාගි වන ලදී. බළඇණියට යුදමය වාතාවරණය නිමවීමත් සමඟම එක්වන ලද කණිෂ්ඨයින්හට තම ජ්‍යෙෂ්ඨයින්ගේ අත්දැකීම් හා පරිනතභාවය උපයෝගී කරගනිමින් තම යුදශිල්ප වර්ධනය කර ගැනීමට මෙන්ම ජ්‍යෙෂ්ඨ නිලයින් තම ශක්තිය හා ජවය තරුණ සෙබළුන් සමඟ කරට කර සසඳා බැලීමට මේ තුළින් අවස්ථාව උදා විය. එය යුද හමුදාවේ අරුත් බර වදනක් වන '' සෑම නිලයක්ම තරුණය '' යන්න පසක් කරන්නක් විය. අප ඒකකයේ සෙබළුන් බළඇණි පුහුණුවීම් පාඨමාලාවේ දක්වන ලද දස්කම් මීට ඉහතදී පාඨමාලා හදාරනු ලැබූ ඒකකයන්ට වඩා බොහෝ ඉහළ මට්ටමක තිබූ බැවින් බළඇණි පුහුණු පාසලේ ප්‍රධාන උපදේශක සහ අනෙකුත් උපදේශක මඩුල්ලේ පැසසුමට ලක්වූ අතර, ඔවුන්ගෙන් ලද උපදේශකත්වය හා මාර්ගෝපදේශකත්වය අප සෙබළුන්ට පාඨමාලාව ඉතා සාර්ථකව නිසි අයරින් අවසන් කිරීමට අයෝමය ශක්තියක් වුවාට සැකයක් නැත.

එමෙන්ම ආගමික කටයුතු සඳහා මුල්තැන දෙමින් පුහුණු පාසල් භූමියේ ඇති බුදුමැදුර වටා පහන් කණු සහිත විදුලි වැටක් ඉදිකර විදුලි බුබුලු මගින් ආලෝකමත් කර පුහුණු පාසල වෙත පුජා කරන්නට යෙදිණි. තවද පුහුණුවීම් අතරතුරදී ලද විවේකයෙන් උපරිම ප්‍රයෝජන ගෙන වෙහෙසකාරි භාවය මෙන්ම කාර්යයබහුල බව නොතකා විනෝදාශ්වාදය උදෙසා අභියෝගාත්මක අත්පන්දු තරගයක් කණ්ඩායම් අතර පවත්වා ක්‍රිඩා කුසලතාවයන්ද ඉස්මතු කරවන්නට විය. කණ්ඩායම් අතර, පුහුණුවීම් තුළදී දැක්වූ දක්ෂතා මත දක්ෂතම වෙඩික්කරු ලෙස 'ඒ' කණ්ඩායමේ නිළධාරි අණදෙන වශයෙන් කටයුතු කළ නි/66732 ලුතිතන් සීඩී සෙල්ෆා ශ්‍රීලපාහ ද, දක්ෂතම කණ්ඩහාර නිලධාරි වශයෙන 'බී'කණ්ඩායම නියෝජනය කළ නි/67195 2 ලුතිතන් එම් ඒඒ දසනායක ශ්‍රීලපාහ ද, දක්ෂතම කණ්ඩය හා දක්ෂතම පෙළ යන ස්ථානයන් 'බී' කණ්ඩායම විසින්ද හිමිකර ගැනුණි.

මෙසේ කලකට පසු අප ඒකකය සහභාගිවූ බළඇණි සාමූහික පුහුණුවීම් තුළින් සාර්ථක ඵල නෙලාගත් අප සෙබළුන් 2012 ක් වූ පෙබරවාරි මස 17 වන දින 651 බළසේනාධිපති තුමාගේ අවසන් හරබර දේශණයෙන් අනතුරුව එදින සන්ධ්‍යාවේ ඒකක අණදෙන නිලධාරි උපදේශක මඩුල්ල සහ සියලු නිලයින්ගේ සහභාගීත්වය ඇතුව පැවැත්වූ සුහද හමුව සහ තේ පැන් සංග්‍රයකින් පුහුණුවීම් අවසන් කරන ලදී.

බළඇණි සාමූහික පුහුණුවීම් සිදුකරන අතරතුර සියලුම නිලයින් වෙත ඔවුන්ගේ දැණුම වර්ධනය කර ගැනීම සඳහා වු නිසි උපදෙස් හා මාර්ගෝපදේශ ලබාදීමෙන්ද, පුද්ගලික ජීවිතය සාර්ථක කර ගැනීම සඳහා වු උපදෙස් ලබාදීමෙන්ද, ඒ සඳහා විශේෂ වු දේශණ පැවැත්වීමෙන්ද, සංවිධානය කිරීමෙන්ද, අප වෘත්තීමය තත්ත්වය ඉහළ නැංවීමෙහිලා ඒකක අණදෙන නිලධාරි විසින් ලබාදුන් උපදේශකත්වය සහ අධීක්ෂණය අප පුහුණුවීම් සාර්ථක කරගැනීමෙහිලා විශාල ලෙස ඉවහල් විය.

බුද්ධි අංශය 8 ශ්‍රීලපාහ



# මල්ඵල ගැන්වූ 'හදබිම' වගා ව්‍යාපෘතිය



12 වන බළඇණිය ශ්‍රී ලංකා පාබළ හමුදා ඒකකය දැනට වට්ටප්පලෙයි - මුලතිව් ප්‍රදේශයේ රාජකාරි කරමින් සිටින අතර, ඒකකය ආසේමු (මු) ට ආසන්නව ස්ථානගතව ඇත. ඒකකයේ රාජකාරි කරනු ලබන සෙබළුන්ගේ ශ්‍රම දායකත්වයෙන් 'හදබිම ව්‍යාපෘතිය' නමින් ආහාර බෝග ව්‍යාපෘතියක් 2011.03.28 දින ආසේමු ආඥාපති මුලතිව් හා ඒකක අණදෙන නිලධාරි තුමන්ගේ මගපෙන්වීම යටතේ ආරම්භ කරන ලදි. ශ්‍රී ලංකා හදබිම අධිකාරිය විසින් දියත් කර ඇති 'රණබිමෙන් ගොවි බිමට' වැඩසටහන අනුව 12 ශ්‍රීලපාහ ඒකකය විසින් එහි පූර්ණ සහයෝගය මත රණවිරු සහභාගිත්ව තිරසාර පාංශු සංරක්ෂණ හා ආහාර බෝග සංවර්ධන ව්‍යාපෘතියට සක්‍රියව සහභාගි වී ඇත, 12 ශ්‍රීලපාහ ඒකකය ස්ථානගත මුලතිව් නන්දිකඩාල් ප්‍රදේශයේ අක්කර 30 ක භූමි ප්‍රමාණයක පොල්, අඹ, කොස්, පේර, දොඩම්, ඩ්‍රැගන් ෆෘට් ආදී දීර්ඝ කාලීන බෝගද කව්පි, මුං, මෑ, මඤ්ඤොක්කා, වැටකොළු, මිරිස්, කරවිල, වම්බටු, පැණි කොමඩු, රටකජු, බඩ ඉරිඟු යන අතුරු බෝගද සාර්ථකව වගාකරන ලදි. ඒකක අණදෙන නිලධාරි තුමන්ගේ සංකල්පයක් අනුව ඉන් ලද ආදායමින් ඒකකයේ රාජකාරි කරනු ලබන සියලුම නිලධාරින් හා සෙසුනිලයින් වෙත පළමු අධියර යටතේ නිලධාරින් 40 දෙනෙකු සහ සෙසුනිලයින් 420 දෙනෙකු වෙත නොමිලයේ ටී ෂර්ට් එක බැගින් ලබාදීමට කටයුතු සැලසුම් කරන ලදි. එම සැලසුම මල්ඵල ගන්වමින් ඒකකයේ රාජකාරි ඉටු කරනු ලබන නිලධාරි හා සෙසුනිලයින් වෙත 2012 ජුනි මස 01 වන දින ඒකකයේ අණදෙන නිලධාරිතුමන් වන ලුතිතන් කර්නල් ඒඑම්සීපී විජයරත්න ආර්එස්පී පීඑස්සී ශ්‍රීලපාහ ජ්‍යෂ්ඨ නිලධාරි අතින් ප්‍රදානය කරන ලදි.











# පුංචි පුතුනි

බිදුණු හිත සනසන
මියැදුණු සිතට
ජීවය දෙන අදුරු දිවියට
ආලෝකය වුනු පුංචි පුතුනි මගේ...
එපා අහන්න අප්පච්චී කොයිද කියා
මගෙ දෙනෙතට
කඳුලු පිරෙන නිසා
නිවාඩුවට ගෙදර ඇවිත්
පුංචි පුතු සුරතල් කර
පුතුගේ කිරි කැටි සිනාරැල්ලක් මැද
හිමිදිරි පාන්දර
පුතු දෝතට ගෙන සිඹ
තල් අරණට ගියේ...
පුතු නුඹට හිමි රට රකින්නටය..
සතුරු වෙඩි පහරින්
නුඹේ පියා මෙලොව හැර ගියත්
සැනසෙමු පුතුනි
ඔහු වීර සෙබළෙකු නිසා....

සාසෙ රොෂාන් කේඑම්
10 ශ්‍රිලපාහ

# සෙබළ සිතුවිලි

සේවය කරන්නේ යුධ හමුදා කඳවුරක
මා පියමනින්නේ සුදුවැලි තලාවක
මියගියත් මේ වැනි දුෂ්කර පලාතක
ඔබ රුව මැවේ ලස්සන සුදු වලාවක

සාසෙ වසන්ත කුමාර ආර්පි
ඩි කණ්ඩායම - 19 ශ්‍රීලපාහ

# පිවිතුරු ආදරය

ආත්ම ගණනක් පතා ආව ඔබ
මා හට ලං වී දුන්න පෙම් සිහින
බොඳවී යන බව දැනුණත්
මා හට
ඔබෙන් වෙන් විම සිහිනයකි
මට
පෙම් කලේ ඔබට හදවතින්ම මම
වෙන් වන්න නොව ලං වුණේ නුඹට
පියාඹුවත් ඔබ මගෙන් ඈතට
ලං නොවෙමි මා
වෙන කෙනෙකු හට
ඔයයි පිවිතුරු ආදරය..................

සාසෙ මුහන්දිරම් කේඑම්එස්එස්
7 ශ්‍රිලපාහ, බි කණ්ඩායම

# තල් අරඹේ

ජීවිතේ වසන්තය
යුධ බිමට කැපවෙලා
යොවුන්විය පැතුම් මල්
දැය නමින් පුදවෙලා
ඒකීය දැය නමින්
සටනකට සැරසිලා
සිටින විරු කුමරුනේ
නුඹ නැහැනේ තනි වෙලා
බුදු හිමිට වැදි දෑතේ
ගිනි අවිය සිරවෙලා
සිනිඳු වු ඇඳුම් නැත
යුධ ඇඳුම රජ වෙලා
මියුරු වු වදන් නැත
අණසකට යට වෙලා
නින්ද නෑ මැදියමේ
කැලෑවක තනිවෙලා
රට නමින් සේවාව
ලියන්නට අගයලා

සැරයන් ආරියරත්න කේඡ්එස් සහ
ලාකෝ නන්දසේන කේඡ්එස්ඡ් ගේ
නැගණිය කේඡ්ඩී රේණුකා




# තනිවූ සිතක්

පොල් අතු සෙවිලි කල
වහලයට ගෙවන ජීවිතේ
නාද මවනු ඇත
සිරිසිරි වැස්සෙන්
තනි වු නුඹේ සිතට
දැනෙන හුදකලාව
මාසිතට නොදැනුනා නොවේ
ඉදින් මා එනතුරු මග බලාන
දිනක් දෙකක් නොව
තල් ගස් යට තනියෙන්
රැයක් දහවල් නොමැතිව සිටියේ
මාද විටක රිසිනොවන හෙයින්
කුමරියණි මම ඔබ ලගට එන්නම්

සාසෙ දර්ශන එච්ඡ්එම්
7 ශ්‍රිලපාහ, බී කණ්ඩායම

# බලාපොරොත්තුව

පොලීසිය ඉදිරිපිට
තැපැල් හල ළඟ
නල ළිඳ ලඟට වී
කොට්ටම්බා ගස් සෙවන යට හිඳ
බලා සිටින්නේ පැමිණෙන තුරු ඔබ
රැගෙන යාමට අපව සුරක්ෂිතව
ආසේමු (මුලතිව්) කඳවුරට
අප කාගෙත් නෙක පැතුම
"ලිබර්ටි" රථය ඔබ

සාසෙ කිත්සිරි කේඑම්යු
ඒ කණ්ඩායම - 12 ශ්‍රිලපාහ

# දඬුවම

ගෙදර අග හිග කම් දැනුණේ ඇබ්සන් වූවාමයි...
නීතිය මෙපමණ සැරයයි දැනුණේ නැවතත් ආවාමයි...
රාජකාරි හොඳ යැයි දැනුණේ මුරයේ සිටියාමයි
නිල ඇඳුම මට හැඩයැයි සිතුණේ අංක 06 ඇන්දාමයි

වැරදි කරුද නිවැරදි කරුද ඇසුවෙ චෝදනා ගාරයට ගියාමයි
නිවැරදිකරු වුවත් කිවයුතු චෝදනාවට වැරදිකරු වීමයි
''තුමණි'' නුඹ සැර වැඩියැයි සිතුණේ 28 ක් දුන්නාමයි...........

සාසෙ කිත්සිරි කේඑම්යූ
'ඒ ' කන්ඩායම් 12 ශ්‍රීලපාහ

# දවසේ සිතුවිල්ල

බලාපොරොත්තු වු දේ ඔබට
නොලැබුනානම් එය ඔබට
අතවශ්‍ය වුවා වන්නට ඇත.

මනස සමනය කරගෙන සෑම
තත්වයක් යටතේම සහනයෙන්
සිටින්න

යමක් කිරිමට පහසු මගක් සෙවීම
අපහසු කාර්යයයි...........................

සෙ/22ඞී00094 කෝප්‍රල් බුද්ධික කුමාර ඞීපී, 22(සෙව්) ශ්‍රිලපාහ

# මාගේ පැතුම

මම හිනා වෙනවා
ඒ මට අඩන්න බැරි හින්දා නෙමෙයි
ඇඩුවොත් නවත්ත ගන්න බැරි හින්දා
මම මඟ බලන් ඉන්නවා
ඔයා එයි කියලා නෙමෙයි
දකින්න හරි ලැබෙයි කියලා
මම ඔයා දිහා බලනවා
ඔයා හිනාවෙයි කියලා නෙමෙයි
අහක නොබලයි කියලා
මම බලාපොරොත්තු ඇති කරගන්නවා
මම ගැන නෙමෙයි
ඔබ මගේම වෙයි කියලා
මම ජීවත් වෙනවා
මට මැරෙන්න බැරි හිනිදා නෙමෙයි
මැරුනොත් ඔයා මට නැති වෙන හින්දා

සාසෙ කිත්සිරි කේඑම්යු

# අපේ කණ්ඩුල

උදෙන්ම අවදිවී දවස පටන් ගන්නේ
බුදුන් වැදලයි දිය නැමට යන්නේ
දකින දකින සියලුම සිත් සනසන්නේ
පළතුරු වට්ටියෙන් කැමත් අරඹන්නේ

අඩ සිය වසකට වැඩි ඉතිහාසය පැතිරෙනවා
සත්ව ලොවේ උගතෙකු සේ හැසිරෙනවා
හත් වෙනියා කියා ආඩම්බර වෙනවා
පාබල නිවස කණ්ඩුලගෙන් බැබළෙනවා

වර්ණ සැරයන් ටිකිරි බණ්ඩා කේජ්
4 ශ්‍රීලපාහ

# සාමයේ සතුට

පළදින යුද ඇඳුම සිසිලසක් ගෙන දේවා
අත රැඳි අවිය නිසි එල්ලට යොමු වේවා
විරුවන් සැවොම සුර විරුවන් වේවා
රණවිරුවානන් සැවොම දෙවිදුන් රැක දේවා

ගිණි අවි නගන හඩ සවනට නො ඇසේවා
සාමය සිසිල දිය දසතම පැතිරේවා
තෙරුවන් බලෙන් ඔබ හඳවත් බැබලේවා
රණවිරු කුමරුණේ ඔබ සැම ජයවේවා

තල්වැට මායිමේ සිතුවිලි නැගුණාට
සිව්දෙස බියන්කර වෙඩි හඩ ඇසුනාට
ලක් බිම දිගේ සාමයේ මල් පිපිණාට
දෝත නගා සිප ගම් මගේ ගිණි අවියට....

සාසෙ කුසුම්සිරි එච්පිජ්
ඒ කණ්ඩායම - 19 ශ්‍රීලපාහ

# ආදරණීය අම්මා

ජීවිතයේ උණුසුම
ළග දුක ඉහිලු අම්මා
දස මසක් කුසේ දරා
අපි බිහිකල අපේ අම්මා
බඩ ගින්නට ලේ කිරි කර
අපට පෙව්ව අම්මා
හිතේ තිබුන දුක් කරදර
ඉවසපු මගේ අම්මා

කුලි වැඩක් හෝ කරගෙන
මගේ ලෝකය හැදු අම්මා
දස මසක්ම කුසේ දරන්
රැක්කා මගේ අම්මා
ලොකු වුනාම හරිදේ
කරන්න කියා දීපු අම්මා
සතුට දැකපු හැම දවසේම
එළිය වුනා අම්මා

ජීවිතයේ ජය ගන්නට
පාර හැදුවේ අම්මා
ලොකු මිනිසෙකු වුන දවසට
වැජඹෙවා අපේ අම්මා
බුදුන් වදින මේ දෑතින් සැමදා
වදිනවා මගේ ආදර අම්මා

කෝප්‍රල් බුද්ධික ඩීජී
22 (සෙව්) ශ්‍රිලපාහ
අණ සහ පාලන කණ්ඩායම



# මගේ බුදුන් ඔබයි අම්මේ

දසමක් කුස තුල දරා දුක් විද
මෙලොවට මා බිහි කලා
ඔබයි මට මගේ බුදුන් අම්මේ
ලේ කැටිකර පොවා මා ඇඩි කර
යහපත් මිනිසෙකු කෙරුමට
වෙර දරණ
ඔබ මගේ ලෝකයයි අම්මේ

ගිහින් එන්නැයි කියා මා සිප
අකුරට යන තුරු බලා නැවත එනතුරු
දෑස් මගේ දල්වන ඔබ නොමැති ලොව
කවුරු මේ මග බලා හිදිවිද හෙට
අම්මේ

සාසෙ ජයසූරිය ඒඑල්එස්
ඒ කණ්ඩායම - 19 ශ්‍රීලපාහ




# 'හදබිම'

දශක තුනක් යුද්ධය තිබූ මේ බිම
සිහිකළ යුතුය දිවිදුන් සෙබළු හදවතින් සැම
ලේ බිඳු හෙලා රැකගත් අපේ ලක් බිම
සරුසාරයි සිරියාවයි නිල්ල පිරුණු හද බිම

අවියෙන් කරපු විකුමන් මතකයේ නොම රැඳිලා
මොනවා කළත් එක අණකට වැඩ කරලා
ආර්පීකෙන් රට ගොඩනගන්න සවියක් වීලා
හදබිම කොමළිගෙන් අපෙ සිත් සැනසීලා

අමු මිරිස් වම්බටු වැටකොළු සරුවට හැදෙති
රසදිව නහර පිනවයි පැණි කොමඩු රසැති
කුරහන් බඩ ඉරිඟු හා වට්ටක්කා ද ඇති
රටකජු කෙසෙල් තව දේවල් බොහෝ වෙති

සාමය රටේ ඇති යුද්ධය නිම වීලා
ත්‍රස්ථවාදි මෙරටින් අතුගා දමලා
ජවනාලියක් වන්නට ගොවි බිම සදලා
අපි වවමු රට නගමු 'හදබිම' රැකලා

සාසෙ කිත්සිරි කේඑම්යු
'ඒ' කන්ඩායම - 12 ශ්‍රීලපාහ

# 2012 ප්‍රථම වෙරළබඩ කඹ තරගාවලියේ ශූරතාවය දිනූ ශ්‍රීලපාහ ක්‍රීඩකයෝ

ශ්‍රී ලංකා යුද හමුදා සන්නද්ධ බලකාය හා සන්ෂයින් ජල ක්‍රීඩා සමාජය එක්ව ප්‍රථම වතාවට සංවිධානය කරන ලද වෙරළ බඩ ක්‍රීඩා තරගාවලිය 2012 මාර්තු මස 30 සහ 31 යන දිනයන්හීදී බෙන්තොට සංචාරක වෙරළ තිරයේදී අති උත්කර්ෂවත් අන්දමින් පවත්වන ලදී.

මෙම තරගාවලිය සඳහා වොලිබෝල්, පාපන්දු, කබඩි, පිහිණුම්, කඹ ඇදීම යන ක්‍රීඩා ඉසව් රාශියක් පවත්වන ලදී. ඒ ඒ ඉසව්වන් නියෝජනය කරමින් දක්ෂ ක්‍රීඩා කණ්ඩායම් හා ක්‍රීඩා සමාජ සහභාගි වූ අතර කඹ ක්‍රීඩා ඉසව්ව නියෝජනය කරමින් අප රෙජිමේන්තු කඹ කණ්ඩායම සහභාගි වන ලදී.

උක්ත තරගාවලිය සඳහා කණ්ඩායම් විශාල ප්‍රමාණයක් සහභාගි වූ අතර ඒ සහ බී වශයෙන් කාණ්ඩ දෙකක් යටතේ පිලිවලින් පිටුදැකීමේ ක්‍රමයට තරග වදින ලදී. අප ශ්‍රීලපාහ කණ්ඩායම බී කාණ්ඩය යටතේ තරගවැද ප්‍රබල දෙහිවල කණ්ඩායම, බෙන්තොට කණ්ඩායම සහ නාවික හමුදා කණ්ඩායම් පරාජයට පත් කරමින් බී කාණ්ඩයේ ඉදිරියට පැමිනි අතර ඒ කාණ්ඩයේ තරගවැද ඉදිරියට පැමිණීමට ජනාධිපති ආරක්ෂක බලකා කණ්ඩායම සමත්වන ලදී.

තරගයේ සමාප්ති උළෙල සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තන් වශයෙන් පැමිණියේ නාවික හමුදාපති වයිස් අද්මිරාල් සෝමතිලක දිසානායක, යුද හමුදා මාණ්ඩලික ප්‍රධානි මෙන්ම අප රෙජිමේන්තු අධිපති තුමන් වන මේජර් ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී, 53 වන සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේජ්ඩීජ් කරුණාසේකර ආර්එස්පී යූඑස්පී පීඑස්සී එම්එස්සී සහ බෙන්තොට ඇල්පිටිය ආසන සංවිධායක ගීතා කුමාරසිංහ මැතිනිය යන අයවළුන් වේ.

ඒ අනුව සමස්ත තරගාවලියේ අවසන් දිනයේ අවසාන ඉසව්ව වශයෙන් කඹ තරගාවලිය පැවති අතර සියළුම ප්‍රධාන ආරාධිත අමුත්තන් සහ තරගය නැරඹීම සඳහා පැමිණි අතිවිශාල ප්‍රේක්ෂක ජනතාවක් අමන්දානන්දයට පත් කරමින් ඉතා තියුණු තරගයකින් අණතුරුව 2/1 ලෙස අප ශ්‍රීලපාහ කඹ කණ්ඩායම 2012 ප්‍රථම වෙරළබඩ ක්‍රීඩා තරගාවලියේ කඹ ඇදීමේ ඉසව්වේ ශූරතාවය දිනාගැනීමට සමත්විය.

ඇත්තෙන්ම මෙම ජයග්‍රහණය අප රෙජිමේන්තුවට පමණක් නොව සමස්ත යුද හමුදාවටම ආඩම්බරයක් මෙන්ම ගෞරවයකි. මෙම තරගාවලියේ ජයග්‍රහණයෙන් අණතුරුව අප සියළු ක්‍රීඩකයින් රෙජිමේන්තු අධිපති තුමන්ගේ පැසසුමට සහ ඇගයීමට ලක්වීම විශේෂ කරුණක් විය.

රෙම ශ්‍රීලපාහ ක්‍රීඩා අංශය

# 64 වන නිදහස් දින 26 ශ්‍රීලපාහ ප්‍රජා සත්කාරයන්




2012.02.04 වන දිනට යෙදී තිබූ අභිමානවත් 64 වන නිදහස් දින 26 ශ්‍රීලපාහ අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් ජේඑල්ටීකේ හේවා ආර්ඩබ්පී, ආර්එස්පී, ශ්‍රීලපාහගේ අධීක්ෂණය යටතේ ඒකක ධජය එසවීමෙන් අනතුරුව ජාතික ගීය ගායනාකොට අණදෙන නිලධාරි විසින් සියලුම නිලධාරින් හා සෙසු නිලයින් අමතමින් අභිමානවත් ලෙස තම රටට සේවය කිරීම පිලිබඳව අදහස් ප්‍රකාශ කරන ලදී.

61 වන සේනාංකාධිපතිගේ මග පෙන්වීම යටතේ 26 ශ්‍රීලපාහ ඒකක අණදෙන නිලධාරිගේ උපදෙස් හා අධීක්ෂණය යටතේ පෙරියමඩු පිහිටි අරපත් ලදරු පාසලේ ඉගෙනුම ලබන දරුවන් සඳහා මූලිකව අවශ්‍යව තිබූ පුටු ඒකක අණදෙන නිලධාරි විසින් පිරිත්‍යාග කරන ලදී. එම අවස්තාවට සහභාගි වූ සියලුම දරුවන් සඳහා රසකැවිලි වලින්ද සංග්‍රහයක් කල අතර, පෙරියමඩු බටහිර පිහිටි රජයේ ග්‍රාමීය රෝහල් භූමිය තුල හා ඒ අවට වැව් තිබූ කැළෑව එළිපෙහෙලි කිරීමේ කටයුත්ත 2012.02.04 දින පෙරවරුව තුල යුද හමුදා සාමාජිකයින් හා ගම්වැසියන්ගේ සහභාගිත්වයෙන් සිදු කරන ලදී.

බුද්ධි අංශය 26 ශ්‍රීලපාහ







# 2012 ආසියාතික අන්තර් කලාපීය කබඩි ශූරතාවය දිනූ ශ්‍රීලපාහ ක්‍රීඩකයෝ

මැලේසියානු කබඩි සංගමය මගින් සංවිධානය කරනු ලැබූ ආසියානු අන්තර් කලාපීය කබඩි තරගාවලිය 2012 පෙබරවාරි මස 17, 18 සහ 19 යන තෙදින තුළ මැලේසියාවේ ක්වාලාලම්පූර් නගරයේ දී පවත්වන ලදී.

මේ සඳහා ආසියානු රටවල් නියෝජනය කරමින් කණ්ඩායම් 16කට එම සංගමය ආරාධනා කරන ලද අතර, ශ්‍රී ලංකාව නියෝජනය කරමින් යුද හමුදා කබඩි කණ්ඩායම සහ නැගෙනහිර පළාත් කබඩි කණ්ඩායම සහභාගි වන ලදී.




උක්ත තරඟාවලිය සඳහා යුද හමුදා කණ්ඩායම නියෝජනය කරමින් අප ශ්‍රීලපාහ රෙජිමේන්තුවේ ක්‍රීඩකයින් තිදෙනෙක් සහභාගි විය. තරඟාවලිය ඒ සහ බී කාණ්ඩ දෙකක් යටතේ පිළිමලුන් පිටු දැකීමේ ක්‍රමයට තරඟවැදීමට සලස්වා තිබූ අතර යුධ හමුදා කණ්ඩායම ඒ කාණ්ඩය යටතේ ද, නැගෙනහිර පළාත් කණ්ඩායම බී කාණ්ඩය යටතේ ද තරඟ වැදුනි.

| | | | | | |
|---|---|---|---|---|---|
| සෙ/314794 | කෝප්‍රල් | පුෂ්ප කුමාර | අයිඑම්ආර් | 4 ශ්‍රීලපාහ | (ශූරතාවය) |
| සෙ/00940 | කෝප්‍රල | සිරිවර්ධන | ආර්ඩීජේ | 14 (සෙව්) ශ්‍රීලපාහ | (ශූරතාවය) |
| සෙ/314178 | ලාකෝ | සමන් කුමාර | පීඑල් | 11 ශ්‍රීලපාහ | (ශූරතාවය) |

ඒ අනුව, ඒ කාණ්ඩය යටතේ තරඟ වැදුනු යුද හමුදා කණ්ඩායම ප්‍රබල ඉන්දියානු, මැලේසියානු සියලුම කණ්ඩායම් පරාජයට පත් කරමින් ඉදිරියට පැමිණි අතර බී කාණ්ඩයෙන් තරඟ වැදි ඉදිරියට පැමිණියේ අපගේ රට නියෝජනය කළ නැගෙනහිර පළාත් කණ්ඩායමයි. ඒ අනුව අවසන් මහා තරඟය සඳහා අප රට නියෝජනය කළ කණ්ඩායම් දෙකක් පැමිණීම සුවිශේෂ සිද්ධියක් විය.

2012 පෙබරවාරි මස 19 වෙනි දින අවසන් මහා තරඟය ක්වාලාලම්පූර් ගෘහස්ත ක්‍රීඩාංගනයේ දී පැවති අතර එහි ප්‍රධාන ආරාධිත අමුත්තන් වශයෙන් ක්වාලාලම්පූර් නගරයේ මැතිඇමතිවරුන් විශාල සංඛ්‍යාවක් සහභාගි වූහ. තරඟය ඉතා තියුණු මුහුණුවරක් ගත් අතර නරඹන්නන්ගේ ජය ප්‍රීතිඝෝෂා කණ්ඩායම් දෙකටම සමසේ ලැබීන. තරඟය පුරා දක්නට ලැබුණු සුවිශේෂ සිද්ධියක් වූයේ කණ්ඩායම් දෙකම අපරට නියෝජනය කර තිබීමවේ. යුද හමුදා කණ්ඩායම ප්‍රබල ක්‍රීඩා විලාශයක් පෙන්වමින් නියමිත කාලය නිම වන විට ලකුණු 14/7ක් ලෙස ශූරතාවය තමන් නතුකර ගැනීමට සමත් වූහ.

මෙම තරඟාවලිය සඳහා යුද හමුදා කබඩි කණ්ඩායම නියෝජනය කරමින් අප රෙජිමේන්තුවට ක්‍රීඩකයින් තිදෙනෙක් මෙම සංචාරය සඳහා සහභාගි වන ලදී.

සමස්ථ තරඟාවලිය පුරාවටම දක්වන ලද දක්ෂතා නිසා තරඟාවලියේ දක්ෂතම ක්‍රීඩකයාට හිමි කුසලානය දිනා ගැනීමට අප රෙජිමේන්තුවේ 14 (සෙව්) ශ්‍රීලපාහ ඒකකයේ සෙ/00940 කෝප්‍රල් සිරිවර්ධන ආර්ඩීජේ සමත් වූ අතර එය අප රෙජිමේන්තුවට මෙන්ම සමස්ත යුද හමුදාවටම ආඩම්බරයක් මෙන්ම ගෞරවයකි.

**රෙම ශ්‍රීලපාහ ක්‍රීඩා අංශය**

# BINCOM TECHNOLOGIES DONATE LCD TV TO THE REGIMENTAL CENTRE SLLI

Bincom Technologies (pvt) Limited, one of the growing mobile partners in Sri Lanka with their head office at Gall road, Dehiwala recently donated an LCD TV worth Rs. 50,000/= to the Regimental Centre Sri Lanka Light Infantry, Panagoda.

Mr. Kanishka Madusanka, the Director "BinCom Technologies" handed over the valuable gift to the Sri Lanka Light Infantry in a brief meeting he had with the Regimental Adjutant SLLI Major KA Pushpakumara RSP SLLI at the Regimental Headquarters SLLI premises.

The Regimental Adjutant represented of the Centre Commandant SLLI Colonel KJ Jayaweera RSP SLLI and Colonel of the Regiment SLLI Major General RMD Ratnayake RWP RSP USP ndu psc and acknowledged the valuable gift.

*Courtesy : www.slli.lk*



# 12 වන බලඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව බලඇණි සාමුහික පුහුණුවීම් පාඨමාලාව සාර්ථකව නිම කරයි.





වසර තිහකට ආසන්න කාලයක් පැවති කුරිරු ත්‍රස්තවාදය පරාජය කිරීමට දායකත්වය දුන් 12 වන බලඇණිය



ශ්‍රී ලංකා පාබල හමුදාව දැනට මුලතිව් ප්‍රදේශයේ නන්දිකඩාල් කලපුව ඉස්මත්තේ ස්ථානගතව ඇත. දැනට මෙම ඒකකය ආරක්ෂක සේනා මූලස්ථානය මුලතිව් යටතේ රාජකාරියේ යෙදී සිටින අතර, ඒකකය 2012,04,24 දින සිට 2012.05.30 වන දින දක්වා කාලය තුළදී බලඇණි පුහුණු පාසල අලම්පිල්හි සාමුහික පුහුණුවීම් සිදුකරන ලදී.

591 බලසේනාධිපති බ්‍රිගේඩියර් එස්කේජීඑන්බී අහැලමල්පේ ආර්එස්පී ජ්‍යෝෂ්ඨ නිලධාරි ආරම්භක දේශනය පැවැත්වූ අතර, පාඨමාලාව සඳහා නිලධාරීන් 13 සහ සෙසුනිලයින් 374 දෙනෙකු සහභාගි වන ලදී.

ඉතාමත් උද්යෝගිමත් ලෙස පාඨමාලාව හැදෑරූ 12 ශ්‍රීලපාහ අයවළුන් යුද උපක්‍රම, අභ්‍යන්තර ආරක්ෂක රාජකාරි, ජීව වෙඩිතැබීම්, අවි පුහුණුව, සිතියම් කියවීම, ප්‍රතිවිප්ලවකාරි ක්‍රියාන්විත ආදිය ඉතාමත් කැපවීමෙන් යුතුව සිදුකරන ලද්දේ ඒකාකාරි රාජකාරි කටයුතු වලින් මිදී ලද අවස්ථාවෙන් උපරිම ප්‍රයෝජන ගනිමිනි.

බලඇණි පුහුණු පාසල මගින් පවත්වන ලද ආරාධිත දේශන, පාලන භකාස කරුණු පිළිබඳ දේශන, මනෝවිද්‍යා දේශන, බුද්ධි කටයුතු පිළිබඳ දේශන, මානසික ආතතිය පිළිබඳ දේශන, අන්තර් ජාතික මානුෂවාදි නීතිය පිළිබඳ දේශන, එක්සත් ජාතින්ගේ සාමසාධක රාජකාරි පිළිබඳ දේශන ඔවුනට මහත් පිටුවහලක් විය. අප ඒකකයේ අණදෙන නිලධාරි තුමන් විසින් පැවැත්වූ නායකත්වය පිළිබඳ දේශනයද ඔවුන්හට මහත් පිටුවහලක් විය.

12 වන බලඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් ඒඑම්සීපී විජයරත්න ආර්එස්පී පීඑස්සී ශ්‍රීලපාහ ජ්‍යෝෂ්ඨ නිලධාරින්ගෙන් ලැබුණු නිවැරදි මගපෙන්වීමත් දිරිගැන්වීමත් අනුව බලඇණි පුහුණුවීම් සාර්ථකව ඉටු කරගැනීමට හැකි විය.

සමස්ථ බලඇණි පුහුණුවීම් අවසානයේ හොඳම කණ්ඩායම ලෙස 'සී' කණ්ඩායමත්, සෑම අතින්ම අතිශූර සෙබළා ලෙස සෙ/320109 ලාකෝ ප්‍රසන්න යූඑල්ඩී ('බී' කණ්ඩායම), දක්ෂතම වෙඩික්කරු ලෙස සෙ/320470 ලාකෝ සිසිර කුමාර එස්ආර්කේ ('ඒ' කණ්ඩායම), හොඳම ශාරීරික යෝග්‍යතාවයෙන් යුත් සෙබළා ලෙස සෙ/322482 කෝප්‍රල් ප්‍රසන්න එන්බී ('බී' කණ්ඩායම), දක්ෂතම පෙළ අණදෙන්නා ලෙස සෙ/318538 කෝප්‍රල් චන්ද්‍රසිංහ ජීඩීපී ('ඩී' කණ්ඩායම), දක්ෂතම බණ්ඩභාර සැරයන් ලෙස සෙ/309999 සැරයන් තිලක් ඊඩබ් ('ඒ' කණ්ඩායම) සහ දක්ෂතම බණ්ඩභාර නිලධාරි ලෙස නි/67654 2/ලුතිතන් අයිබී ජයරත්න ශ්‍රීලපාහ දක්ෂතා දක්වමින් කුසලාන හිමි කරගන්නා ලදි,

තවද, පුහුණු කාලසීමාවේ සෑම සෙනසුරාදා විවේකී දිනයකදීම සියලු නිලයන් සඳහා සංගීත සැදෑවක් සූදානම් කර ඒකාකාරි සහ වෙහෙසකර මානසිකත්වයෙන් මිදී අලම්පිල් මුහුදු වෙරළ තීරයේ සියලු දෙනාහට විනෝදවීමේ අවස්ථාව සලසාදෙනු ලැබීය.

අප බලඇණියේ දක්ෂතා අගයකිරීම සඳහා අවසන් දේශනයට පැමිණි 59 වන පාබල සේනාංකාධිපති වන ජීආර්එච් ඩයස් යූඑස්පී පීඑස්සී අයිජී විසින් මහත් පැසසුමට ලක්කරමින් ජයග්‍රහණ කුසලතා ලබාදීමත් සමගින් ඉතාමත් සාර්ථක ලෙස බලඇණි සාමූහික පුහුණුව 2012.05.30 දින නිමා වූ අතර, ඒකකය වෙත සාමූහික නිවාඩුවක් ද ලබාදෙන ලදී.



බුද්ධි අංශය
12 ශ්‍රීලපාහ



# 23 ශ්‍රීලපාහ කාර්යාල සංකීර්ණය විවෘත කළ වගයි






මෙම ඒකකය ස්ථාපනය කර වසර 02 කට වැඩි කාලයක් ගත වුවද එම කාලය තුළ ඒකකය විවිධ ස්ථානයන්හි ස්ථානගතවීම හේතුවෙන් ඒකකය සතුව කාර්යාල සංකීර්ණයක් නොමැතිව විවිධ බාදක මධ්‍යයේ රාජකාරී ඉටුකරන ලදී. ඒකක අණදෙන නිලධාරී ලුතිතන් කර්නල් ටීසීකේ පීරිස් ආර්එස්පී ශ්‍රීලපාහ ගේ මගපෙන්වීම යටතේ මෙම ඒකකයේ දෙවන අණදෙන නිලධාරී මේජර් ආර්එන්එස් ෆොන්සේකා ආර්එස්පී ශ්‍රීලපාහ ගේ සැලැස්මකට අනුව මෙම කාර්යාල නන්දිකඩාල් කලපුව අසල ඉදි කරන ලදී.

මෙම කාර්යාල 2012 අප්‍රේල් මස 06 වන දින 0956 පැයට යෙදුන සුබ මොහොතින් ඒකක අණදෙන නිලධාරී විසින් විවෘත කළ වගයි.

වයිට් හැකල් අංශය 23 ශ්‍රීලපාහ

## මුලතිව් සිරි සමුද්‍රගිරි රාජ මහා විහාරයේ චෛත්‍ය රාජයාණන් වහන්සේගේ නිදන් වස්තු තැන්පත් කළ වගයි





මුලතිව් දිස්ත්‍රික්කයේ වඩ්ඩුවාකල් ප්‍රදේශයේ ඉදි කරනු ලැබූ සිරි සමුද්‍රගිරි රාජ මහා විහාරයේ චෛත්‍ය රාජයාණන් වහන්සේගේ නිදන් වස්තු තැන්පත් කිරීමේ ඓතිහාසික උත්සවය 2012.04.28 දින 0617 පැයට යෙදුණු සුබ මොහොතින් උතුරු පළාතේ උප ප්‍රධාන සංඝ නායක, සද්ධර්ම කීර්ති ශ්‍රී සුමන සිද්ධාර්ථ ඇටඹගස්කඩ කළ්‍යාණ තිස්සාභිධාන නායක හිමිගේ මුලිකත්වයෙන් සිදු වු අතර, එම ඓතිහාසික උත්සවයට 59 වන සේනාංකාධිපති බ්‍රිගේඩියර් ජීආර්එච් ඩයස් යුඑස්පී පිඑස්සී අයිජී, 591 බළසේනාධිපති බ්‍රිගේඩියර් එස්කේජීඑන්බී ඇහැළමල්පේ ආර්එස්පී සහ ඒකක අණදෙන නිලධාරී ලුතිතන් කර්නල් ටීසීකේ පීරිස් ආර්එස්පී ශ්‍රීලපාහ යන අය සහභාගි වන ලදී.

23 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදා කඳවුරට යා වෙමින් පිහිටා ඇති මෙම විහාර භූමියෙහි පිහිටි චෛත්‍ය රාජයාණන් වහන්සේලාගේ නිදන් වස්තු තැන්පත් කිරීමේ පිං බලයෙන් යුද්ධයෙන් ජීවිත පුජා කළ සියළුම රණ විරුවන් හට නිවන් සුව සහ ආබාධිත තත්ත්වයට පත් රණවිරුවන් හට ඉක්මන් සුවයත් ප්‍රාර්ථනා කරමු.

වයිට් හැකල් අංශය 23 ශ්‍රීලපාහ

# හව නිරෝධය හෙවත් සසර ගමන නතර කිරීම

ලෝකයේ ක්‍රියාකාරිත්වය පවතිනුයේ සිත තුළය. ලෝකය යනු සිතයි-කයයි දෙකේ එකතුවේ, පැවැත්මයි. "ඉමස්මිං එවව්‍යාම මත්තෙ කල්වෙරෙ සසඤ්ඤිමහි සමන්කෙ ලොකඤ්ච පඤ්ඤපේමි" මේ බඹයක් පමණ කයත් සමඟ පවතින (මන හා සමග වූ සවිඤ්ඤාණකත්‍වය) සිත ලෝකය වේ. ඒ ආකාරයෙන්, සර්වඥ ශාන්ති නායකයාණන් වහන්සේ 'ලෝකය' ලෝකයා හමුවේ ගෙනහැර දක්වූයේ, කය යනු රූපයක් පමණි. කයට තනිව කිසිම දෙයක් කළ නොහැක. කිසිම ප්‍රාණයක්, ජීවයක්, හැඟීමක්, දැනීමක්, විඥානයක්, ක්‍රියාකාරිත්‍වයක් නොමැති කය අප්‍රාණික, ආචේතනික අවිඤ්ඤානික වස්තුවක් - රූපයක් පමණි. කයෙහි අභ්‍යන්තර රූප උපකරණයක් කරගෙන - ඇසුරු කරගෙන - ආධාර කරගෙන - උපකාර කරගෙන 'සිත' සකස් වෙනවා. 'සිතක්' යනු ක්‍රියාවක්. 'සිත' යනු ලෝකයේ ක්‍රියාකාරිත්‍වයයි. උදහරණයක් මගින් මේ බව තහවුරු කරගනිමු.

| | |
|---|---|
| උදළුගාන සිත | - උදළුගාන ක්‍රියාව |
| දුවන සිත | - දුවන ක්‍රියාව |
| කපන සිත | - කපන ක්‍රියාව |
| අඬන සිත | - අඬන ක්‍රියාව |

එසේ නම් ක්‍රියාවක් කීවත් එකයි, සිතක් කිව්වත් එකයි. මුලදී සඳහන් කළා මේ කයට කිසිම ප්‍රාණයක් ජීවයක් නොමැති බවත් කිසිම දෙයක් කරන්න බැරි බවත්. මේ බවත් උදහරණයක් මගින් සනාථ කරගනිමු. ඔබ මළමිනී දැක ඇති. ඔය මළමිනියෙහි අත පේන්න තියෙනවා. ඒ අතට පිහියක් දී හෝ තබා දර කපන්න කියන්න පුළුවන්ද? බැහැ. හිත ඉවත්ව ගිය නිසා බැහැ.

ක්‍රියාකාරී පුද්ගලයකුට ඒ පිහියදී ගහක් කපන්න කීවොත් ඔහු ගහ කපනවා. ඔහු ගහ කපන්නේ පිහියෙන් නොවේ. අතිනුත් නොවේ. පිහිය හා අත උපකරණ පමණයි. ගහ කපන්නේ සිතෙන්. ඒ හිතට කියනවා කපන හිත කියලා. පිහියට අතට ගහ කපන්න. දර කපන්න පුළුවන් නම් මලමිනීයටත් ගස්-දර කැපිය හැකි විය යුතුයි. මෙහිදී අප වටහා ගත යුත්තේ, කය යනු රූපයක් පමණි. කිසිම ක්‍රියාකාරිත්‍වයක් නොමැති වස්තුවක්. ඒසේනම් ක්‍රියාකාරිත්‍වය ඇත්තේ සිතක් සකස් වුණොත් පමණි. මේ අය සම්බන්ධ කරගෙන අභ්‍යන්තර රූප හයක් ඇත. මේවාට ආයතන - ද්වාර - ඉන්ද්‍රිය - චින්තායතන නම් ව්‍යවහාර කරනවා.

| | |
|---|---|
| ඇස | - චක්ඛු ආයතනය |
| | - චක්ඛු ද්වාරය |
| | - චක්ඛු ඉන්ද්‍රිය |
| කණ | - ශෝක ආයතනය |
| | - ශෝක ද්වාරය |
| | - ශෝක ඉන්ද්‍රිය |
| නාසය | - ඝාණ ආයතනය |
| | - ඝාණ ද්වාරය |
| | - ඝාණ ඉන්ද්‍රිය |
| දිව | - ජිව්හා ආයතනය |
| | - ජිව්හා ද්වාරය |
| | - ජිව්හා ඉන්ද්‍රිය |
| කය | - කාය ආයතනය |
| | - කාය ද්වාරය |
| | - කාය ඉන්ද්‍රිය |
| මන | - මන ආයතනය |
| | - මන ද්වාරය |
| | - මන ඉන්ද්‍රිය |

ඉහත දක්වූ ආයතන - ද්වාර - ඉන්ද්‍රිය ඇත්තේ සත්වයා සම්බන්ධව පමණි. බාහිර ලෝකයේ ක්‍රියාකාරිත්‍වයට හාත්පසින්ම ක්‍රියාත්මක භාවයක් පෙන්නුම් කරන නිසා අභ්‍යන්තර රූප දන ගැනීම ඉතා වැදගත් ආයතන යනු යමක් නිපදවන තැනක්. සීනි කර්මාන්තායතනය, පිඟන් කර්මාන්තය - උළු කර්මාන්තය උදහරණයි. මේවායින් නිපදවන්නේ සීනි, පිඟන් භාණ්ඩ - උළු ගඩොල් - සත්වයා සම්බන්ධ ආයතන වලින් නිපදවන්නේ සිත් හෙවත් සිත නැමැති භාණ්ඩයි.

| | |
|---|---|
| ඇසින් | - බලන සිත |
| කනින් | - අහන සිත |
| නාසයෙන් | - ආඝ්‍රාණය කරන සිත |
| දිවෙන් | - රස විඳින සිත |
| කයෙන් | - පහස ලබන සිත |
| මනෙන් | - සිතන සිත |

එසේ නම් පැහැදිලියි අභ්‍යන්තර ආයතන උපකාර කරගෙන සිත නමැති භාණ්ඩය නිපදවන බව. මළ මිනියට ඉහත කිසිම සිතක් නිපදවීමේ හැකියාව නැහැ. හේතුව ආයතන ක්‍රියා විරහිතයි.

තව කරුණක් ගැන මෙහිදී අවධානය යොමු කළ යුතුයි. ලෝකයේ ක්‍රියාකාරී වූ සිතයි හවයට යන්නේ. කෙසේවත් සිතට තනිව ගමන් කල නොහැකියි. සිත යම් තැනකද එතන මනායතනය තිබිය යුතුයි. එසේ නම් සිත හා මන දෙකම හවයට යනවා. හව නිරෝධයට සිතක් හටගන්නේ කේසේද? මේ සිත තුළ පවත්නා ධර්මතා මොනවාද? ප්‍රභාස්වර සිත අපිරිසිදු වන්නේ කේසේද? අපිරිසිදු සිත පිරිසිදු කරගන්නේ කේසේද? හවයට යා නොදී සිත නිරුද්ධ කරගන්නේ කේසේද? සංකරගත සිත විසංකරගතකරගන්නේ කේසේද? යනාදි වශයෙන් ඉතාමත් පැහැදිලි අර්ථ විග්‍රහයක් ආයතන පර්යේෂණයක් - කිරීම තුළින්මයි හව නිරෝධය කරගත හැක්කේ. හවයට යන සිත මන පූර්වාංගම කරගෙන මන ශ්‍රේෂ්ඨකර ගෙන, මනගෙන්ම හටගන්නවා.

"මනෝ පුබ්බං ගමා ධම්මා
මනෝ සෙට්ඨා මනෝ මයා..."

මෙහිදී "ධම්මා" යනු සිතයි. ඇයි සිතට ධම්මා කීවේ? මේ සිත තුළ මුළු ලෝකයේ යම් ධර්මතාවයක් තිබේ නම් ඒ සියල්ල සිත තුළ (ලෝකය තුළ) තියෙනවා. ඒ මොනවාද?

රූප ස්කන්ධය
වේදනා ස්කන්ධය
සංඥා ස්කන්ධය
සංකාර ස්කන්ධය
විඤ්ඤාණ ස්කන්ධය

මේ පංච උපාදනස්කන්ධයයි. සිතක් කිව්වත් එකයි. පංච උපාදනස්කන්ධයක් කිව්වත් එකයි. 'මන' නොමැතිව කිසිම විටක සිතක් සකස් වෙන්නේ නැහැ. 'මන' යනු රූපයක්. 'සිත' යනු ලෝකයේ ක්‍රියාකාරිත්වයයි. මන - සිත - විඤ්ඤාණය ගැන හොඳින් ධර්මානුකූලව ක්‍රියාකාරිත්වය අවබෝධ කරගත හොත් ඉතාමත් පැහැදිලිව භව නිරෝධය කරගත හැකියි. මෙයමයි චිත්තානුපස්සනාව කියන්නේ. මේ ධර්ම කරුණු පිළිවෙලින් පෙළ ගස්වා ගනිමු. සත්වයා සම්බන්ධව ඇස, කණ, නාසය, දිව, කය, මන යන රූප හයක් විද්‍යාමාන වේ. (කය යන රූපය නිර්මාණය වන්නේ දෙතිස් රූපයක් එක්වීමෙනි). රූපය යනු ශක්ති හතරක් ඒකරාශි වී ප්‍රවර්තනය වීමෙන්, ඇතිවීම නැතිවීම තුළින්, චලනය තුළින්, වෙනස් වීම තුළින් හෙවත් අනිත්‍යතාව නිසා විද්‍යාමාන වන්නා වූ ධර්මතාවයකි. රූපය යනු එසේ නම් ශක්ති හතරකි. සමවායිමකි. ශක්තිය යම් තැනක විද්‍යාමාන වෙන්නේ නම් චලනයක් හෙවත් අනිත්‍යතාවය විද්‍යාමාන විය යුතුමයි. එසේ නම් රූපය අනිත්‍යයි. යමක් අනිත්‍ය නම්, දුකයි. යමක් දුක නම් අනාත්මයි.



"යදනිච්චං තං දුක්ඛං""යමක් අනිත්‍ය නම් දුකයි"
"යං දුක්ඛං තවනත්තා""යමක් දුක නම් අනාත්මයි"

එසේ නම් සියලුම රූපස්කන්ධයන්හි ස්වභාවය අනිත්‍යයි, දුකයි, අනාත්මයි. අභ්‍යන්තර හා බාහිර සකල ලෝක ධාතුවේ විද්‍යාමානවන්නාහු සියලු රූපස්කන්ධයටම මේ අනිත්‍ය - දුක්ඛ - අනාත්මතාව සාධාරණයි. කිසිම ලෙසකින් මෙය වෙනසක් නැත්තේමයි. "මන" රූපයක්. එසේ නම් "මනත්" අනිත්‍යයි, දුකයි, අනාත්මයි. දැන් "විඤ්ඤාණ" ශක්තිය දක්නට ලැබෙන්නේ කොතනද? කියා බලමු. විඤ්ඤාණ ධාතුවකි. එය සිතක් සකස් කිරීමේ ශක්තියකි. රූප දෙකක් එකතුවෙන්මයි විඤ්ඤාණ ධාතුව හටගන්නේ. ධාතු 6කි.

1. පඨවි - තද ස්වභාවය - ශක්තියකි.
2. ආපෝ - වැගිරෙන ස්වභාවය - ශක්තියකි.
3. තේජෝ - උණුසුම් ස්වභාවය - ශක්තියකි.
4. වායෝ - හමා යන ස්වභාවය - ශක්තියකි.

මේ හතර කිසි ලෙසකින් වෙන් කළ නොහැකි ශක්ති හතරකි. හැම විටම එක් ශක්තියක් වැඩිපුරමයි දක්නට ලැබෙන්නේ. හතරේ එකතුව රූපයකි. ශක්තියකි. චලනයකි. වේගයකි. එසේ නම් රූප අනිත්‍යයි. දුකයි. අනාත්මයි.

5. ආකාශය හිස් ස්වභාවය හටගත් ශක්තියකි. සියලුම ශක්ති පැතිර පවතින්නේ හිස් ස්වභාවය හෙවත් අකාශ ධාතුවේ. මෙයත් හටගත් ශක්තියත් - අනිත්‍යයි - දුකයි - අනාත්මයි.

6. විඤ්ඤාණය සිතක් සකස් වීමේ ස්වභාවයි. විඤ්ඤාණය ධාතුවකි. රූපයක් නොවේ. හිත නොවේ. නාමයක් නොවේ."සිත නොවේ." අප මාතෘකාව වූ විඤ්ඤාණය කොතැනද හටගන්නේ? මේ ශක්තිය හටගන්නේ සත්වයා සම්බන්ධව පමණි. එතැන සවිඤ්ඤාණකත්වය විද්‍යාමාන වන සත්වයායි. දෙකක් එකතු වන තැන "විඤ්ඤාණය" හටගනී. "ද්වං පටිච්ච විඤ්ඤාණං සම්භූත, තථං ච භික්ඛවේ ද්වං පටිච්ච විඤ්ඤාණං සම්භූති, චක්ඛුං ච පටිච්ච රූපේච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං"

"මහණෙනි, දෙකක් එකතුවීමෙන් (රූප දෙකක්) විඤ්ඤාණය හටගනී. කෙසේද මහණෙනි දෙකක් නිසා විඤ්ඤාණය හටගන්නේ? ඇස නිසා බාහිර රූපයේ හටගන්නා (ශක්තිය) වූ විඤ්ඤාණය "චක්ඛු විඤ්ඤාණය" නම් වේ. මේ අනුසාරයෙන් "චක්ඛු පටිච්ච". විඤ්ඤාණ ශක්තිය හටගන්නේ බාහිර රූපයේ මිසක් ඇසේ නොවේ. යනුවෙන් බුදුරජානන් වහන්සේ දේශනා කළ සේක.

(පොත පත ඇසුරෙන්)

# 4 ශ්‍රීලපාහ වෙතින් ප්‍රජා සත්කාරයක්





මුලතිව් දිස්ත්‍රික්කයේ සිවිල් වැසියන් පදිංචි කිරීමේ කටයුතු සිදු කිරීමේදී 4 ශ්‍රීලපාහ ඒකක බල ප්‍රදේශයේ පදිංචි කිරීම වෙනුවෙන් ඒකකයට විශාල වගකීමක් පැවරී ඇත. එම කටයුතු සිදු කරණ අතරකුරතවත් සත් කාර්යයක් ඉටු කිරීමට අප ඒකකයට හැකි විය. එනම් 59 සේනාංකාධිපති තුමාගේ සංකල්පයට යමින් 592 බලසේනාධිපතිතුමාගේ අධීක්‍ෂණයෙන් ඉතා දිළිදු සිවිල් වැසියෙකු සඳහා නිවසක් ඉදිකර දීමට පැවරිණි. එම කාර්යය සත්භාවයෙන්ම පිළිගත් ඒකක අණදෙන නිලධාරි ලුතිතත් කර්නල් එම්සීඑස්කේ සේනාරත්න ආර්එස්පී ශ්‍රීලපාහ ඒකකයේ සියලුම දෙනාගෙ දායකත්වයෙන්සියලු කාර්යයන් සිදු කරන ලදී.

ඒකකයේ මෙම ප්‍රජා සත්කාරය ලැබීමට සුදුසු වූයේ කුමාරපුරම් ග්‍රාමසේවා වසමේ පාසැල් අධ්‍යාපනය ලබන දරුවන් සිව් දෙනෙකු ඇතුලු හයදෙනෙකුගෙන් යුත් කුලී රැකියාව ඔවුන්ගේ ජීවිකාව කරගත් කරුපයියා උදයකුමාර් වාසනාව හිමි විය.

මාස තුනකට අඩු කාල සීමාවක් තුළදී ලහි ලහියේ ඉදිවුණ මෙම නිවස 2012 අප්‍රේල් මස 09 වන දින 1220 පැයට ඔළමූ සුබ මොහොතෙන් ආසේමු (මුලතිව්) ආඥාපති තුමා විසින් විවෘත කර උදයකුමාර් මහතා වෙත නිවස භාර දෙන ලදී. මෙම සුවිශේෂි අවස්ථාව දැක බලා ගැනීම සඳහා ප්‍රදේශයේ ප්‍රභූවරුන් මෙන්ම යුද හමුදවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් රැසක් ද සහභාගි විය.

බුද්ධි අංශය 4 ශ්‍රීලපාහ

# ඔබ එඩිතර ද නිර්භීත ද

කෙනෙක් නිවැරදිනම්, සාධාරනනම්, සාමකාමීනම් ඒ උදාර හද තුළ ජනිත වන විශේෂ ශක්තියක් ඇත. ඒ තමා එඩිතරකම කියන මහා බලශක්තිය නිර්භීතකම, කියලත් සමහරු හඳුන්වයි. ඒ උනාට නිර්භිතකමයි එඩිතරකමයි අතරේ විශාල වෙනසක් ඇත. නිර්භීත පුද්ගලයා අනාරක්‍ෂිතයි. ඒත් එඩිතර පුද්ගලයා ආරක්‍ෂිතය. නිර්භීතකම යන්න බය නැති කමයි. එහෙත් එම පුද්ගලයා අවේගකාරි මෙන්ම විනාශවීමට, හොරකම්කිරීමට, වැරදිකිරීමට හා ලැජ්ජනැති වැඩ කිරීමටද නිර්භිතය.

එහෙත් නිර්භීතකම හිතකර සාරවත් උසස් හැකිමක්නම් නොවේ. එඩිතරකම ඉතාමත් විශිෂ්ටය. එඩිතරකම හා නිර්භීතකම අතරේ වෙනස විශාලයි. එඩිතර කෙනාගේ කල්පනාව හොදයි. උපායශීලිය, දක්‍ෂය, බුද්ධිමත් මෙන්ම ස්ථිර ගතිපැවතුම් වලින් හෙබිය.

ඔබත් එඩිතර පුද්ගලයෙක්ද නැතිනම් නිර්භීත පුද්ලයෙක් ද යන්න සිතා බැලීම ඔබ සතුය.

ලාකෝ දිසානායක ඩීඑම්ජේපී
සී කණ්ඩායම - 5 (සෙව්) ශ්‍රීලපාහ

# අමතකද මව්පියන්

බිරිඳක් ගෙන එයි පුතු    නිවසට
කළගුණ අමතක වෙයි එක    දවසට
ආදර මව්පියන් ගියපසු    වයසට
යන්නට පවසනවා ද වැඩිහිටි    නිවසට

බොන්නට ඇඟ ලේ කිරිකර    දුන්නේ
අම්මා බව පුතු තව නොම    දන්නේ
තන්නාවෙහි ඔහු දැන් පසු    වන්නේ
බිරිඳගේ නමටයි ඔහු මුල් තැන    දෙන්නේ

මව්පියන් හට පුතු දොස් බස්    පවසනවා
මව හා පියතුමා අසරණ    වෙනවා
පුතකුට මව්පියෝ අමතක    වෙනවා
බිරිඳගේ බස් වලින් පුතු    වැනසෙනවා

ලාකෝ සුසසන්ත එස්ඒ
ඞී කණ්ඩායම - 1 ශ්‍රීලපාහ

# සේවාවනිතා විත්ති

යුද්ධයෙන් ආබාධිත තත්වයට පත්වූ සෙ/319296 කෝප්‍රල් ප්‍රේමලාල් කේකේසී යන අබාධිත රණවිරුවා වෙත ශ්‍රී ලංකා පාබල හමුදා සේවාවනිතා ශාඛාවේ සම්බන්ධීකරණයෙන් 2012.02.02 දින දානපතිනියක් විසින් රෝද පුටුවක් පරිත්‍යාග කරන ලදී.





ශ්‍රී ලංකා පාබල හමුදා සේවාවනිතා ශාඛාවේ නිවාස සංකල්පය අනුව 2012.02.27 වන දින සෙ/300587 සැරයන් ජයතිලක ඊජීඑස් යන ජෝයකොනොනි වෙත නිවසක් ඉදි කිරීම සඳහා මුල්ගල තබන ලදී.

2012.02.25 දින ශ්‍රීලපාහට අයත් රණවිරුවන් හා ඔවුන්ගේ බිරින්දෑවරුන් සඳහා ජෑම්, කෝඩියල්, සෝස් සදා ගන්නා ආකාරය පිළිබඳ ස්වයං රැකියා වැඩමුළුවක් සූපවේදීන් කැඳවා රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී ශ්‍රීලපාහ සේවාවනිතා ශාඛාවේ සම්බන්ධීකරණයෙන් පවත් වන ලදී.





ශ්‍රී ලංකා පාබල හමුදා සේවාවනිතා ශාඛාවේ නිවාස සංකල්පය අනුව සෙ/308159 කෝප්‍රල් බාලසූරිය බංඩා ඩීඑම් යන රණවිරුවා වෙත නිවසක් ඉදි කිරීම සඳහා 2012 මාර්තු මස 02 වන දින මුල්ගල තබන ලදී



ශ්‍රී ලංකා පාබල හමුදා සේවාවනිතා ශාඛාවේ ගරු සභාපතිනිය විසින් ආබාධිත රණවිරුවන්ගේ ගැටළු සාකච්ඡා කර විසඳා දීමේ වැඩමුළුවක් 2012 මාර්තු මස 03 වන දින පවත්වන ලදී.

# සේවා වනිතා විත්ති

ශ්‍රී ලංකා පාබල හමුදා සේවාවනිතා ශාඛාවේ නිවාස සංකල්පය අනුව සෙ/314377 කෝප්‍රල් රූපසිංහ අයිජීඑන් යන රණවිරුවා වෙත නිවසක් ඉදිකිරීම සඳහා මුල්ගල 2012 මාර්තු මස 10 වන දින තබන ලදි.





ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථානයට අයත් රණවිරුවන් හා ඔවුන්ගේ බිරින්දෑවරුන් සඳහා ආහාර පාන සදා ගන්නා ආකාරය පිළිබඳ ස්වයං රැකියා වැඩමුළුවක් ගල්කිස්ස මහ හෝටලයේ ප්‍රධාන සූපවේදී පබිලිස් සිල්වා මහතා කැඳවා රෙජිමේන්තු මධ්‍යස්ථාන දේශන ශාලාවේදී 2012 මාර්තු මස 24 වන දිනය පුරා ශ්‍රී ලංකා පාබල හමුදා සේවාවනිතා ශාඛාවේ සම්බන්ධීකරණයෙන් පවත් වන ලදී.

2012 අප්‍රේල් මස 09 වන දින ශ්‍රී ලංකා පාබල හමුදා සේවාවනිතා ශාඛාව මඟින් රණවිරු සුබ සාධනය සඳහා අරමුදල් සපයා ගැනීමේ අරමුණින් පවත්වනු ලබන ගැලන්ට් බේකරි ආයතනයේ රාජකාරී කරන ආබාධිත රණවිරුවන් සඳහා අළුත් අවුරුදු ත්‍යාග ලබාදුන් අවස්ථාව හා මෙම බේකරි ආයතනයේ රාජකාරී කර වෛද්‍ය හේතුන්මත විශ්‍රාම ගිය රණවිරුවන් වෙත සමරු තිළිණ ප්‍රධානය කිරීමද මෙහිදී සිදු විය.









ශ්‍රී ලංකා යුද හමුදා සේවාවනිතා ශාඛාවේ මූලිකත්වයෙන් වාර්ෂිකව පවත් වනු ලබන රණඅරුණ උදාන - 2012 අවුරුදු පොළ අප්‍රේල් මස 07, 08 දෙදින තුළ පැවැත් වුන අතර, පාබල හමුදා සේවාවනිතා ශාඛාව වෙතින් වෙළඳ කුටි 02ක් පවත්වා රණවිරු සුබසාධනය සඳහා අරමුදල් සපයා ගන්නා ලදී.

## හිතට කියන්න

මේ උදාවන අනෝරාවෙන් පස්සේ
ඒ තරම්ම පාළුවක් කියලා
දන්න හඳුනන ඔයාගේ හිත ගැන
හොඳටම දන්න දුකක් උනත්
ආදරයෙන් භාරගන්න සතුටකදි
ඔයාටත් වඩා සතුටු වන ගොඩාක්
මනුස්සකම් දන්න පුදුම තරම් ආදරේ
මිතුරෙක් ඔයාව බලන්න එනවයි
කියන්න එනිසා
හිතට කියන්න ඔය කඳුළු පිසදාගෙන
හිනාවෙලා ඉන්න කියලා

ලාකෝ ප්‍රියදර්ශණ එස්ජ්කේ
19 ශ්‍රිලපාහ ආධාරක කණ්ඩායම

## අහිමි ප්‍රථම ආදරය

සියලු දේ පටවාගෙන ජීවිත යාත්‍රාව පැදවිය නොහැක. උසුලා සිටිය හැකි තරම් පටවා ගත යුතුය එවිට පහසුවෙන්ම යාත්‍රා කළ හැකිය. ජීවිත යාත්‍රාව පදවනු මාවතේ එක් සංධිස්ථානයක හමුවන ආදරය බව බොහෝ දෙනා නොසිතනවා විය හැකිය. ආදර පුදබිමේදී පවත්වන සියලු පුද පූජා පැවැත්විය යුතුය. පිදිය යුතු සියල්ල පිදිය යුතුය. ඉන්පසු තවත් පුදබිමක් හමුවන්නේ නැත. හමුවුවද ආදර පුදබිම තරම් රමණිය නැත. ආදර පුදබිම තරම් නිස්කලංක නැත. ආදර පුදබිමට පය තැබූ මොහොතේම මම මගේ ජිවිතයේ සියලු පූජාවන් පැවැත්වුවෙක්මි. ඒ සඳහා මට දේව ප්‍රතිමාවන් අවශ්‍ය නොවේ. බුද්ධ ප්‍රතිමාවන් අවශ්‍ය නොවේ. කිරිගරුඬ ප්‍රතිමාවක් මා අභියස විය. ඒ ප්‍රථම ආදරයයි. ඒත්.. දුප්පත්කම අගහිගකම ඉදිරියේ ඒ කිරිගරුඬ ප්‍රතිමාව මා හැර ගියේය.

සාසෙ සඳරුවන් ඒඑම්සී
ආධාරක කණ්ඩායම
19 ශ්‍රිලපාහ

## මගේ ආදර අම්මා

දසමසක් මා කුස හොවාලා
මෙලොවට බිහි කර
රුධිරය කිරි කර මා හට පොවා
ඇඩි දැඩි කළ මගේ ආදර අම්මේ

තම මව්භූමිය
පර සතුරන්ට නොදී
බේරා ගැනීමට ඔබයි
මා දිරිමත් කලේ අම්මේ
ඇස පියවෙන
හැම මොහොතක් ගානේම
ඔබ රුව පෙනේ
ඉපදෙන ආත්මයකම
මගේ මව ඔබ වේවා
ජාති ජාතිත් ඔබමයි
මගේ ආදර අම්මා

ලාකෝ කොතලාවල බීජීඑස්එස්
19 ශ්‍රීලපාහ ආධාරක කණ්ඩායම

## ප්‍රේමය

තරුණවියේ අරඹන
නවතම මාවතක
කොතරම් සුන්දර වුවත්
එහි අරුතය නොදන්නා වූ
මිනිසුන් නුඹ මා වෙනුවෙන් පුදකළ
ප්‍රේමය මෙතෙක් කලක් සුන්දරව පැවතුනා
ඔබේ පුංචි මුරන්ඩු කමින්
ප්‍රේමය වෛරයක් බවට පත්වුවා
නුඹේ සුසුම් මේඝ පරදවා
හදේ සියුම් පටක දවා
දඟකාර ඔබේ නෙතු දෙස බලා
මාගේ නෙතු කඳුළින් පිරී ගියා
සමනලුන් නෑ ඉගිල ගියේ
විහඟුනේ කෝ අප ලද සතුට
ටජ් මහල් නම් තණන්නට
සිහින දරා
නමුදු අපේ ආදරය අහිමි වුයේ

ලාකෝ සංජීව ඒජ්එන්
ආධාරක කණ්ඩායම 19 ශ්‍රිලපාහ

## ජීවිතය

ගෙවී ගියදේ ගැන දුක්වෙලා එලක් නෑ
වෙච්චදේ සිදුවෙලා හමාරයි
කඳුළු පිරුණු අතීතය නැවත නැවත
සිහිකරන්න එපා
එය ජීවිතයට වේදනා ගොඩක්ය........
වරද හැමදාමත් කළ යුත්තක් නොවේ
වරද ඇත් කළ යුත්තක්ය..........
කවුරු වැරදි කළත් වරද හදා ගන්න
පුද්ගලයා රටට වටිනවා හෙට
වැරදුනත් ඊළඟ දවසෙ හැදෙන්න
දවසින් දවස හැදි හැදි යන
මේ ජීවිත ගමන
අප කාටත් සැනසිම උදාකරයි.........

සාසෙ ලිලාන් ප්‍රකාන් ටීඑල්
පාලන කණ්ඩායම 19 ශ්‍රීලපාහ

## අහිමි වූ මව් සෙනෙහස

ළමාවිය පසු කලත් මා
යොමා නෙතු යුග බලා සිටියා
ගව් ගණන් දුරින්වත් නොදකිමින්

කිරිකැටි සිගිති ළමාවියේ
අහිමි වූ මව් සෙනෙහස කටුක ලෙසින්

මිල මුදල් රන් කහවනු සොයා
ඔබ එඩිතර වී සයුරින් වැලි කතරේ
අවුරුදු මාස දින පසු කරමින්
මව් සෙනෙහස අහිමි වී ගියේ

නොවිඳිනා දුක් විඳිමින්
දසමසක් කුසේ දරා
අපි මෙලොවට බිහිකළ අම්මාවරුනේ
මතු සංසාර වලදි අම්මා බුදුවේවා

ලාකෝ සංජීව ඒජ්එන්
ආධාරක කණ්ඩායම, 19 ශ්‍රීලපාහ

## පාසල් විය

පාසල් ගියේ ඉගනීමට සිප් සතර
මා දැන් සිටින්නේ යුද සෙබළුන් අතර
පැන පන්සල වෙනුවට අතැගිලි අතර
රැඳිලා තියෙන්නේ ගිනි අවියයි මිතුර

සාසෙ සමන් කුමාර එම්ජ්එල්
ආධාරක කණ්ඩායම 19 ශ්‍රිලපාහ




## පුංචි රණවිරුවා

ගංගා දිය ඇලි ගලා බසිනා රැයාමේ
සුපුරුදු ගිනි අවිය තුරුලට අරගෙන අම්මේ
මගෙ මව්බිමට ආලය වැඩි නිසා අම්මේ
එළිවෙන තුරුම නිදිමැරුවා තල් අරඹේ

ලාකෝ අමරකෝන් ඒඑම්බී
ආධාරක කණ්ඩායම, 19 ශ්‍රිලපාහ

# අත් වැරදීම් පාඩමක් ලෙස ගෙන ජීවිතය ගොඩනඟා ගනිමු

ජීවිතය නෞකාවක් නම් සමාජය හා වටපිටාව මහ මුහුද නම් එය සුන්දර ලෙස පාවී නොයනු ඇත. චණ්ඩ කුණාටු සුළි සුළං සැඩ පහර කෙතරම් පැමිණියත් ජීවිත අපේක්ෂාව නම් වූ අරමුණ කරා කිසි පිරිදි පැදවීමට දක්ෂ වූ පුද්ගලයා තම ජීවිතය අර්තවත් කර ගන්නා අතරම අන් ජීවිත ද අර්තවත් කරයි.

ජීවිතය අර්තවත් මඟක ගෙන යෑමේදී මුහුණ දීමට සිදුවන ප්‍රධානතම බාධකයක් වන්නේ දැනුවත්ව හෝ නොදැනුවත්ව අප අතින් සිදු වන අත් වැරදීම්ය. එවැනි අත් වැරදීම් පිළිබඳව මූලිකව සලකා බැලීම අපගේ ප්‍රධානම කාර්යය වනු ඇත. කිසිදා අත් වැරදීම් සිදු නොකර ජීවිතයක් නොමැතිය යන්නයි. නමුත් ඔබ වඩාත් සැලකිළිමත් විය යුත්තේ ජීවිතයේ සිදු වන අත් වැරදීම් හැකි උපරිම ප්‍රමාණයෙන් අඩුකර ගැනීමයි. එනම් ඥානවන්තව තම අත් වැරදීම් වලින් පාඩම් ඉගෙන ජීවිතය ගොඩ නගා ගන්නා සේම ප්‍රඥාවන්තයා ගේ වැරදීම් විග්‍රහ කොට ඔහු හට ජීවිතයට අර්ථයක් එක්කර ගැනීම සිදු කරයි.

මෙහි ඔබ හැකිතාක් දුරට සිදු කළ යුතු වන්නේ ඥානවන්තයා ගත් ක්‍රියා දාමයටයි. ඊට හේතුව නම් ඔබ ඔබගේ නිවසේ හෝ ආයතනයේ සිදු කරන අත් වැරදීම් ඔබට නව අරුත් බර පාඩමක් කියා දුන්නද එවැනි අත් වැරදීම් තුලින් භාහිර සමාජයේ දී සිදු කළ විටදී අන් අය එමඟින් ඔබ ඇඟයීමට ලක් කිරීමට පෙළඹෙන බැවිණි. එසේ හෙයින් සැම විටම ඔබගෙන් සිදු විය හැකි යැයි සිතන අත් වැරදීම් හැකිතාක් අවමව සිදු කිරීමට උත්සහ ගත යුතුයි.

- සමහරක් අත් වැරදීම් කෙසේවත් මඟ හැරිය නොහැකි වේ. ඊට හේතුව වන්නේ එය ඔබ ජීවිතයට නව පාඩමක් හෝ අරුතක් එක් කරන නිසාය.
- සමහරක් අත් වැරදීම් ඒ මොහොතේදීම නිවැරදි කර ගත්තද එමඟින් ඇති වූ කැළල ඔබට කිසි දිනක මකා දමන්නට නොහැකි වන නිසාය.
- සමහරක් අත් වැරදීම් කිසිදාක නිවැරදි කළ නොහැකි සේම සිදු කළ වැරදි වලට වන්දි ගෙවීම මඟින් ද පියවිය නොහැකි නිසාය.
- නොසැළිකිලිමත්කමින් සිදු කරන අත් වැරදීම් වලට කිසිදු සමාවක් ලබාදිය නොහැකි වන නිසාය.
- අත්දැකීම් හොද පාසැලක් වුවත් පාඩම් ඉගෙන ගැනීම වෙනුවෙන් ගෙවිය යුතු ගාස්තුව බොහෝ විට සිතා ගන්නටත්වත් බැරි තරම් ඉහළ අඟයක් ගන්න නිසාය. ඒ සියලු දේට හේතුව අප මිනිසුන් වීමයි.

ඔබ විසින් බිහි කළ යුත්තේ ඔබ පසුපස එන අය හා ඔබ සමඟ යන අය නොව ඔබ පසුකර යන අයය.

සැරයන් දේශප්‍රිය ඩබ්ලිව්එම්කේ
බුද්ධි අංශය 4 ශ්‍රීලපාහ

# 4 ශ්‍රීලපාහ පන්සල විවෘත වූ වගයි

දශක තුනකට අධික කාලයක් තුළ පැවතී කුරිරු යුද්ධ නිමා කර ලබාගත් සාමයේ මල් දම් පුදන්නට දැන් කාලය පැමිණ ඇත. දැනට 4 ශ්‍රීලපාහ බළඇණිය ස්ථාපනය කර ඇති මුලතිව් මුල්ලියාවේලි කඳවුරෙහි රාජකාරී කරනු ලබන සියලු නිලධාරීන් හා සෙසුනිලයින්ට ආගමික වතාවත් සිදු කිරීම සඳහා අවශ්‍යව තිබූ පන්සල ස්ථාපනය කිරීම මෙම ඒකක අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් එම්සීඑස්කේ සේනාරත්න ආර්එස්පී ශ්‍රීලපාහ ගේ සංකල්පයට අනුව ඒකකයේ සියලු දෙනාගේ දායකත්වයෙන් පන්සල ඉදි විය.

2012 අප්‍රේල් මස 02 වන දින මහා සංඝරත්නය වැඩම කරවා පිරිත් සජ්ඣායනවාන් මධ්‍යයේ 592 බළසේනාධිපතිතුමන්ගේ සුරතින් පිළිම වහන්සේ නිරාවරණය කරන ලදී. මහා සංඝයා වහන්සේලා වෙත දහවල් දානය පූජා කරමින් ඒකකය සමඟින් සටන් වැද තුවාල ලබා මියගිය සහ අතුරුදහන් සියලු රණවිරුවන්ට පිංපෙත් පැමිණිවීමත්, දැනට අබාධිතව සිටින සියලු දෙනා හට නිරෝගි සුවය ප්‍රාර්ථනය කිරීම ද සිදු විය.

බුද්ධි අංශය 4 ශ්‍රීලපාහ





# දසුනේ හසුන



| | | |
|---|---|---|
| **හසුන** 8 | දහඩිය හෙලමින් දූ දරුවන් ඇති දැඩි | කළාට |
| | වියපත් වූ පසු ආවෙමි වැඩිහිටි | නිවාසෙට |
| | අපගේ කැත කුණු අතගා පිරිසිදු | කළාට |
| | තව තව ශක්තිය ලැබෙයි රණවිරු | පුතුන්ට |

**සෙ/306080 සැරයන් ගුණසිරි එස්එච්අයියූකේ 7 ශ්‍රීලපාහ**

**දසුන** 8

කඩුවෙල බියුෆඩ් සමරණායක - විල්බට් පෙරේරා වැඩිහිටි නිවාසයේදී 8 ශ්‍රීලපාහ විරුවන් ඔවුන්ව නාවා පිරිසිදු කිරීම.

**බුද්ධි අංශය 8 ශ්‍රීලපාහ**

## නිවැරදි කිරීමයි




පසුගිය 71 වන වයිට් හැකල් කලාපයේ 34 වන පිටුවේ විරුදරු ක්‍රීඩා උළෙල නමින් පලවූ ලිපියේ යුද හමුදා සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිනිය අනෝමා ජයසූරිය යනුවෙන් පලවී ඇත. එය යුද හමුදා සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිනිය මංජුලිකා ජයසූරිය ලෙස නිවැරදි විය යුතුය.

ශ්‍රී ලංකා යුද හමුදා සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිතුමිය යම් අපහසුතාවයකට පත්වූයේ නම් ඒ පිළිබඳව අපේ කණගාටුව ප්‍රකාශ කරන්නෙමු.

කතෘ මණ්ඩලය

## ප්‍රහේලිකා අංක 52

**නිවැරදි විසදුම්පත් 2012 ඔක්තෝබර් මස 15 වන දිනට පෙර එවිය යුතුය.**

**තරඟ කූපනය සහ කොන්දේසි පසු පිටෙහි ඇතුළත් කර ඇත.**

### වයිට් හැකල් ප්‍රහේලිකාව - අංක 52

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 9 | | | | 5 | | | | 4 |
| | 1 | 5 | 3 | 4 | 6 | 8 | 9 | |
| | 4 | | | | | | 7 | |
| | 5 | | 6 | 8 | 2 | | 3 | |
| | 7 | | 5 | | 9 | | 2 | 6 |
| | 3 | | 7 | 1 | 4 | | 8 | |
| | 2 | | | | | | 4 | |
| | 6 | 4 | 9 | 7 | 8 | 2 | 5 | |
| 1 | | | | | | | | 8 |

### ප්‍රහේලිකාව ගැන...

1. කුඩා කොටු නවයකින් සමන්විත වූ විශාල කොටුවක් නිර්මාණය වී ඇති අතර එවැනි කොටු නවයකින් මෙම ප්‍රහේලිකාව සම්පූර්ණ වී ඇත.

2. කුඩා කොටු නවය තුළ 1 සිට 9 දක්වා වූ ඉලක්කම් නවය ඇතුළත් විය යුතු අතර, එය පිළිවෙලකට අවශ්‍ය නොවේ.

3. කුඩා කොටු නවය ඇතුළත් විශාල කොටු නවය සම්පූර්ණ කළ පසු 1 සිට 9 දක්වා වූ ඉලක්කම් නවය ඇතුළත් විය යුතුය.

4. ඉහත සඳහන් පරිදි ප්‍රහේලිකාව සම්පූර්ණ කළ පසු සිරස් සහ තිරස්, හරස් අතට 1 සිට 9 දක්වා වූ ඉලක්කම් නවය ඇතුළත් විය යුතු අතර පිළිවෙලකට අවශ්‍ය නොවේ.

5. කුඩා කොටු නවය ඇතුළත් විශාල කොටුවක හා තිරස් සිරස් හා හරස් අතට එකතු වේ අගය 45 ක් විය යුතුය.

6. කුඩා කොටුවක් තුළ හෝ සිරස්, තිරස් හා හරස් අතට අංක යෙදීමේදී එකම අංකය දෙතැනක සඳහන් නොකළ යුතුයි. සඳහන් කළ හැක්කේ එක් වරකි.

# වයිට් හැකල් ප්‍රහේලිකාව අංක 49

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 2 | 3 | 8 | 6 | 4 | 5 | 1 | 7 | 9 |
| 5 | 7 | 4 | 8 | 9 | 1 | 3 | 2 | 6 |
| 1 | 9 | 6 | 3 | 2 | 7 | 4 | 5 | 8 |
| 9 | 4 | 2 | 1 | 3 | 6 | 7 | 8 | 5 |
| 3 | 5 | 7 | 4 | 8 | 2 | 9 | 6 | 1 |
| 6 | 8 | 1 | 5 | 7 | 9 | 2 | 3 | 4 |
| 4 | 6 | 3 | 7 | 1 | 8 | 5 | 9 | 2 |
| 8 | 1 | 9 | 2 | 5 | 3 | 6 | 4 | 7 |
| 7 | 2 | 5 | 9 | 6 | 4 | 8 | 1 | 3 |

## තරඟ කොන්දේසි

1. ප්‍රහේලිකාව පසුපස ඇති අයදුම්පත සම්පූර්ණ කර පහත ලිපිනයට තැපැල් කළ යුතුයි.
2. මෙම තරඟයට වයිට් හැකල් සඟරාවේ කාර්ය මණ්ඩලයට සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් හට සහභාගී විය නොහැක.
3. පළමුවන, දෙවන හා තුන්වන ජයග්‍රහන හිමිකර ගන්නා ජයග්‍රාහකයින් පිළිවෙළින් රු. 1000/-, රු.750/-, රු.500/- වශයෙන් මුදලින් තෑගි ලබා දීමට තීරණය කර ඇත.
4. විනිශ්චය මණ්ඩලයේ තීරණ අවසාන තීරණය ලෙස සැලකේ.
5. නිවැරදි පිළිතුරුපත් කුසපත් ඇදීමෙන් තෝරා ගනු ලබන ජයග්‍රාහකයින් තිදෙනෙකු සඳහා පමණක් තෑගී දීම සිදු කෙරේ.
6. පිළිතුරුපත් එවන ලියුම් කවරේ වම් පස උඩ කෙලවරේ වයිට් හැකල් ප්‍රහේලිකා අංක 52 යනුවෙන් සඳහන් කළ යුතුයි.

ලිපිනය : වයිට් හැකල් කර්තෘ,
වයිට් හැකල් ප්‍රකාශන අංශය,
රේම ශ්‍රීලපාහ,
යුද්ධ හමුදා ජනපදය,
පනාගොඩ,
හෝමාගම.

# මෙවර ජයග්‍රාහකයෝ

**ප්‍රථම ස්ථානය**

සෙ/316476 සැරයන් වික්‍රමසිංහ එම්අයිබීඑන්
23 ශ්‍රීලපාහ,
යුහ කඳවුර, වඩ්ඩුවාකල්,
මුලතිව්.

**දෙවන ස්ථානය**

එල්පීඑන් උදයාංගනී,
අංක 67/04,
මීරියගල්ල,
පාදුක්ක.

**තුන්වන ස්ථානය**

සෙ/326481 සාසෙ රොෂාන් කේඑම්
10 ශ්‍රීලපාහ,
යුද හමුදා කඳවුර,
මල්ලාවි.

## වයිට් හැකල් ප්‍රහේලිකාව

**52**

**කූපනය**

අංකය : ........................................................

නිලය : ........................................................

නම : ........................................................

රාජකාරී ලිපිනය : ........................................................

........................................................

........................................................

ඒකකය : ........................................................

ජාතික හැඳුනුම්පත් අංකය : ........................................................

අප සමග උරෙන් උර ගැටී සටන්බිමේ පෙරමුණ ගෙන ක්‍රියා කර ප්‍රාණදානයෙන් ඇප කැප වූ නිලධාරින් හා සෙබළුන් 3807 දෙනෙකු සදා අනුස්මරණය කිරීම සඳහා රෙජිමේන්තු අධිපතිතුමන් ගේ සංකල්පයකට අනුව ජ්‍යෙෂ්ඨ නිලධාරින් ජ්‍යෙෂ්ඨ සේවා අත්දැකීම් ඇති විශ්‍රාමිකයින් හා සියළුම සෙබළුන්ගේ දිරිමත් කිරීම් හා ශ්‍රම ධන පරිත්‍යාගයෙන් යුතුව ඉදි වන රණවිරු ස්මාරකයේ ඉදි කිරීම් කටයුතු සිදු වන ආකාරය ඡායාරූපවලින් දක්වේ.



# WAR HEROES MEMORIAL SRI LANKA LIGHT INFANTRY









පෙබරවාරි මස 27 දින පළමු උපන් දිනය සැමරූ 14 ශ්‍රීලපාහ සෙ/14ඩී000999 ලකෝ ගුණවර්ධන ඩීඩීසී ගේ ආදර දියණිය වන සෙනුරි දිනෙත්මා






අප්‍රේල් මස 02 වන දින පස්වන උපන් දිනය සැමරූ 15 ශ්‍රීලපාහ සෙ/316002 කෝප්‍රල් පුෂ්ප කුමාර අයිකේඑල් ගේ ආදරණීය දියණිය අයිකේ තරුෂි සංජනා



මාර්තු මස 10 වන දින පළමු උපන් දිනය සැමරූ 14 ශ්‍රීලපාහ සෙ/14ඩී01042 ලකෝ කුමාරසිංහ කේඑල් ගේ ආදරණීය දියණිය කේ ශිවන්කා නෙත්මි කුමාරසිංහ







# ශ්‍රී ලංකා පාබල හමුදා සංගමයේ මහ සභා රැස්වීම



ශ්‍රී ලංකා පාබල හමුදාවට අනුපමේය සේවයක් ඉටුකර තම තාරුණ්‍යය කැප කරමින් ශ්‍රී ලංකාද්වීපයේ රුදුරු ත්‍රස්තවාදීන්ගෙන් බේරා ගැනීමට කටයුතු කොට අනතුරුව යුද හමුදා සේවයෙන් විශ්‍රාමිකව කාලය ගත කරන පාබල හමුදා රණවිරු විශ්‍රාමිකයින් සෑම වර්ෂයකම මහ සභා රැස්වීමක් හා සුහද හමුවක් පැවැත්වීම සිදු කරනු ලබයි.

2012 වර්ෂයේද මෙම සභා රැස්වීම හා සුහද හමුව පැවැත්වීමට සියලු කටයුතු රෙජිමේන්තු අධිපති ගේ උපදෙස් මත රෙජිමේන්තු සේනාවිධායකගේ අධීක්ෂනය යටතේ 2012 පෙබරවාරි මස 26 වන දින පාබල හමුදා රෙජිමේන්තු මධස්ථානයේදී පවත්වන ලදී. විශ්‍රාමික අයගේ සුබසාධනය වෙනුවෙන් රෙජිමේන්තුවෙන් සිදු කර ඇති මෙහෙය පිළිබඳව ශ්‍රී ලංකා පාබල හමුදා සංගමයේ ගරු සභාපති සහ සියලුම විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ඇගයීමට ලක් කරන ලදි.

මහ සභා රැස්වීම අවසන් වූ පසු පාබල හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථානය විසින් සංවිධානය කර තිබූ කණ්ඩුල 50 වන සංවත්සර ඡායාරූප ප්‍රදර්ශනය සහ රෙජිමේන්තු කෞතුකාගාරය නැරඹූ විශ්‍රාමික පාබල හමුදා සාමාජිකයන් ඉන් අනතුරුව දැනට ඉදි කරමින් පවතින පාබල හමුදා රණවිරු ස්මාරකයේ වැඩ කටයුතුද පරීක්ෂාවට ලක් කළහ.

ශ්‍රීලපාහ නර්තනයන්ගෙන් හා අධි රිද්ම කණ්ඩායමේ සත්සර නාදයෙන් වර්ණවත් වූ උත්සවය අවසානයේ විශ්‍රාමික පාබල හමුදා සාමාජිකයන් වෙනුවෙන් විශේෂ දිවා භෝජන සංග්‍රහයක් ද සංවිධානය කර තිබූ අතර ඉන් අනතුරුව සියලු දෙනා නැවතත් ලබන වසරේදී හමුවීමේ බලාපොරොත්තුවෙන් විසිර ගියහ.

**වයිට් හැකල් ප්‍රකාශන අංශය, ශ්‍රීලපාහ**











